පුරාතන සන්න සහිත

# සැළලිහිණි සංදේශය

ගැටපද විවරණයකින් යුක්තයි.

---

තොටගමුවේ විජයබාහු පරිවෙනාධිපති
ෂඩ්භාෂාපරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය

ශ්‍රී රාහුල සංඝරාජ

රාජගුරු මහාස්වාමිපාදයන්වහන්සේ විසින්
විරචිතයි.

---

මධ්‍යමදිශාවේ උඩපළාත කඳුකර ඉහලකෝරළේ
“ඩිපියුටි කෝර්නර්” ධුරය දරන
එච්. ජයතිලක විසින් ලියනලද
භාවාර්ථවර්ණනා සහිතයි.

---

කොළඹ මාදම්පිටියේ නොම්මර 7 දරන
සුදර්ශන යන්ත්‍රශාලාවෙහි
ආර්. ඒ. කුරේ විසින් 4 වෙනි වරට අච්චුගසා
ප්‍රසිද්ධ කරනලදී.

1904.

සන්නස සහිත

# සැළලිහිණි සන්දේශය.

1. සැරද සුලකලකුරු—මියුරු තෙපලෙන් රදනා,
රජකුල රහසැ මැතිනිය—සියනිහි සැළලිහිණිසඳ.

1. "සියනිහි සැළලිහිණිසඳ සැරද" යනු මෙහි වාක්‍යයොජනායි. සැළලිහිණිසඳ, ශාරිකාපක්ෂිරාජය; සියන්, ඥාති, ස්වකීය බන්ධූන් හා එක්ව; සැරද, චිරකාලයක් ජීවත්වව්. (කෙබඳු ශාරිකා පක්ෂිරාජයෙක්ද යත සුලකලකුරු මියුරු තෙපලෙන් මනාව හොබනාලද අක්ෂරයෙන් යුක්තවූ ශ්‍රවණ) මධුර වචනයෙන් හෙවත් කාව්‍ය සුභාෂිතාදී ප්‍රභෙදයෙන්; රදනා, රඤ්ජමානවූ නොහොත් ජනරඤ්ජනය කරන්නාවූ; රජකුල රහසැ, රාජකුලයාගේ රහස්‍යවිෂයෙහි හෙවත් ගුප්තභාෂා විෂයෙහි; මැතිනිය, මන්ත්‍රීන්ගේ ඥානයට බඳුවූ ඥාණ ඇති; සැළලිහිණිසඳ, ශාරිකා පක්ෂිරාජොත්තමය; සියන් ඥාති, ස්වකීය බන්ධූන් හා එක්ව; සැරද, චිරකාලයක් ජීවත්වව් හෙයිත් බොහෝ කලක් පවතු.

සුරහෙදදි අක්ෂරයෙන් අලඞ්කාරවූ මධුරවචන ඇති; රජකුලය සම්බන්ධ රහස් දන්වීමෙහි ඇමතිවරුන්ගේ දැනුම වැනි නුවණින් යුත් ශාරිකාපක්ෂිරාජය, නෑයන් හා එක්ව බොහෝ කලක් ජීවත්වව්. මෙසේ දූතයාහට මඞ්ගල්‍යපිණිස ආශීර්වාදකොට; ඉක්බිති ශාරිකා පක්ෂිහුගේ රූපලාවණ්‍ය වර්ණනාව පෙරටුව (තමා දක්මට පලමු) සුවදුක් විචාරීම්වශයෙන් හා මිත්‍රසංගමය සම්බන්ධවූ ප්‍රීතිය හැඟවීම පිණිසත් "පුල්මල්කෙසරු" යනාදි උපපත්ති දසපද සැහැල්ල ආරම්භකළෝ.

2. පුල්මල්කෙසරු මෙන්—රන්විනි තෙල සරණයුග
සදුමල් කැනෙව් තුඩ මදරතිනි මනහ ර
නිලුපුල් දෙලෙව් සම්වනි පිය පියපත ර
මලින් කළ රූ එව් එබැවින් තුබින් එන ව ර
නිලුද ලදසිඳුබුවො දිගුවරලැ නි ලූ
නිලුද වට බිඟුපෙළ අද තඹරනි ලූ
ව න දෙව්ලියෝ නොකළොද සවන අඹර ණ
එ න මග දුකෙක් නොවිද සබඳිනි කල ණ
සෙ නෙ හස බැඳුනු තැනැ නොහරිනා කරු දිවු ණ
වෙ න සැප කුමට කොප දකිනා එම පම ණ

2. සබඳිනි, මිත්‍රයානෙනි; තොප, යුෂ්මතුන්ගේ; තෙල, මේ; සරණයුග, (දෘශ්‍යමානවූ) චරණයුග්මය; පුල්මල්කෙසරු මෙන්, විකසිත කුසුමකෙසරයන් මෙන්; රන්වනි, සුවර්ණවර්ණ ඇත්තේ වීය; තුඩ, (මේ) වක්ත්‍රය; සපුමල්කැනෙව්, චම්පක කලිකාවක් මෙන්; මදරතිනි, ඊෂත් රක්තභාවයෙන්; මනහර, මනොඥය; පිය, ප්‍රියවූ; පියපතර, (මේ) පක්ෂසංහතිය; නිලුපුල්දෙලෙව්, නීලොත්පල පත්‍රයන් මෙන්; සම්වනි, ශ්‍යාමවර්ණ ඇත්තේය; එබැවින්, ඒ භාවයෙන්; මලින්කළ රූඑව්, පුෂ්පමයවූ රූපයක් මෙන්; නුබින්, නභස්ථලයෙන්; එනවර, එන්නාවූ කාලයෙහි; ලද සිදඹුවො, තරුණ සිද්ධාඞ්ගනාවෝ; නිලු, නීලවර්ණවූ; දිගුවරලැ, දීර්ඝවූ කෙශකලාපයෙහි; නිලුද, ප්‍රක්ෂෙපනොකළෝද; තඹඹරනිලූ, තාම්‍රස නිලයකොට ඇත්තාවූ හෙවත් පද්මයෙහි වාසයකරන්නාවූ; බිඟුපෙළ, භෘඞ්ගපඞ්ක්තීහු; අද, අවුත්; වටනිලූද, "පරික්ෂෙප නොකළෝද හෙවත් සිසාරනොගත්තුද; වනදෙව්ලියෝ, වන දිව්‍යස්ත්‍රීහු; සවනඅබරණනොකළොද, කර්ණාවතංසනොකළෝද; එනමග, ආගමනය කරන්නාවූ මාර්ගයෙහිදී; දුකෙක්, (සිද්ධාඞ්ගනා භෘඞ්ග වනදෙවතාවන් විසින්) පීඩාවක්; නොවීද, නුවූයේද; බැඳුනු තැනැ, (මනො) බන්ධනයවූ ස්ථානයෙහි; දිවුණකරු, අධිකකොට; සෙනෙහස, සෙනහය; නොහරින, පරිත්‍යාගනොකරන්නාවූ; කලණසබඳිනි, කල්‍යාණමිත්‍රයානෙනි; තොප, යුෂ්මත්හු; දකිනා, දර්ශනයකරන්නාවූ; එම, ඒ (දර්ශනය)ම; පමණ, ප්‍රමාණවන්නේය; වෙන සැප, අන්‍යවූ සම්පත්තියක්; කුමට, කිමපිද හෙවත් කවර ප්‍රයොජනයක් පිණිසද.

තොපගේ මේ දෙපය පිපුනාවූ මල්රෙණු සෙයින් සුවර්ණවර්ණ ඇත්තේය; තුණ්ඩය සපුමල්කැකුළක් සේ මන්දරක්තභාවයෙන් මනොඥය; දෙපියාහස්ස නිල්මහනෙල්පත් සෙයින් ශ්‍යාමවර්ණය; එහෙයින් පුෂ්පමය රූපයක් මෙන් අහසින් එනකල—තරුණ සිද්ධාඞ්ගනාවන් විසින් නීලවර්ණවූ දීර්ඝකෙශකලාපයෙහි බහානො ගත්තුද; නෙලුම්මල්හි වසන මීමැසි රාශීහු සමීපයට අවුත් වටලා නොගත්තුද; වනදිව්‍යස්ත්‍රීන් විසින් කර්ණාවතංස නොකළාහුද; එන්නාවූ මාර්ගයෙහි මෙහි ඊවාසින් යම්කිසි පීඩාවක් නොපැමිණියේද; කල්‍යාණ මිත්‍රයානෙනි බද්ධසෙනහය ඇති තන්හි දියුණුකිරී මෙන් නොහරින්නාවූ තොපගේ දර්ශනප්‍රමාණයම මුත් අනික් සැපතකින් කවර ඵලයක්ද.

3. ල ප නොමවන් සඳ මෙන් සොම්ගුණ ගිහි ණි
ඔ ප වැඩි ගත හෙල්මැලි සිවුමැලි පැමි ණි
සැ ප සිරිදෙන වැනි රසබසැති සිතුමි ණි
තොප දැකුමෙන් අප පින් කළ බව දැනු ණි

3. ලපනොමවන්, ලාඤ්ඡනප්‍රවේශ නුවූ; සඳ මෙන්, චන්ද්‍රයා මෙන්; සොම්ගුණ ගිහිණි, සෞම්‍යගුණ ග්‍රහණය ඇත්තාවූ නොහොත් සෞම්‍යගුණයෙන් ගහණවූ; හෙල්මැලි, කල්හාරයට බඳුවූ; සිවුමැලි පැමිණි, සෞකුමාර්‍ය්‍යප්‍රාප්තවූ; ඔපවැඩි, කාන්තියෙන් අතිරික්තවූ; ගත, ගාත්‍රයක් ඇත්තාවූ; සැපසිරි දෙන, (අභිමත) සෞඛ්‍යසම්පත්ති ප්‍රදානයකරන්නාවූ; රසබසැති, මධුරවචනොපෙතවූ; සිතුමිණි වැනි, චින්තාමාණික්‍යයක් බඳුවූ; තොප, යුෂ්මත්හුගේ; දැකුමෙන්, දර්ශනයෙන්; අප, අස්මද්ශබ්දවාච්‍යයා සම්බන්ධිවූ; පින්කළබව, කෘතපුණ්‍යභාවය;. දැනුණි, පරිඥානයවී.

කැලලින් තොරවූ චන්ද්‍රයා මෙන් සෞම්‍යගුණ ග්‍රහණයෙන් යුක්තවූ; හෙල්මැලිමල් සෙයින් සිවුමැලිභාවයට පැමිණියාවූ කාන්තිමත් ශරීරයක් ඇති; සැපසම්පත් දීමෙහි සිතුමිණිරුවනක් වැනිවූ; මධුරකථාකාරී තොපගේ දැකීම කරණකොට අපගේ පින් කළභාවය දැනුණේයි.

4. මි තු රුතුමෝ දුක්සැප දෙකෙහිම පැව ති
බි තු සිතුයම් රූ මෙන් පිටු නොපාවි ති
සු තු මතු වැඩ මතෙපල එවැනි ගුණ ඇ ති
සි තු නතුකරු අස යහළුව වඩන රැ ති

4. මිතුරුතුමෝ, මිත්‍රොත්තමයෝ; පැවති, ප්‍රවෘත්තවූ; දුක් සැප දෙකෙහිම, දුඃඛසෞඛ්‍ය (අවස්ථා) දෙක්හිම; බිතු සිතුයම්රූ මෙන්, භිත්තියෙහි (අඳිනලද) චිත්‍රකර්මරූපයන් මෙන්; පිටු නොපාවිති, පරාඞ්මුඛනොවෙති; එවැනි ගුණ ඇති, තාදෘශගුණයෙන් යුක්තවූ; රැතිවඩන, ආලය වර්ධනය කරන්නාවූ; යහළුව, මිත්‍රය; මතුවැඩ සුතු, අනාගතකාල අභිවෘද්ධියෙන් යුක්තවූ; මතෙපල, මාගේ වචනය; සිතුනතුකරු, සිත්නමා; අස, ශ්‍රවණයකර.

උතුම් යහළුවෝ වනාහි භිත්තියෙහි කරනලද සිතුයම් රූප සෙයින් විද්‍යමානවූ දුක්සැපදෙක්හි පිටුපස නොදක්වා සහභාගී වෙත්; එබඳු ගුණඇති රැච්වඩන මිත්‍රයාණෙනි අනාගතකාලයෙහි පැමිණෙන ශුභසිද්ධියෙන් යුක්තවූ මාගේ වචනය සිත් නමා අසව. මෙසේ ශාරිකාපක්ෂිරාජයා හා ප්‍රියසම්භාෂණාදිය කිරීමෙන් ඉක්බිතිව; ඔහු විසින් කළමනා ක්‍රියාවට නියොගකරන්නාහු—“පළඹ රදකඳ” යනාදි කව ආරම්භකළෝ.

5. ප ව් රද කඳ නාලෝ මුල් දිගතු බ ර
ලෙ ව් තුරු සුසැදු යස මි මුතු මල්පත ර
ස ව් සිරි පිරි සුරපුර වන් කැලණි පු ර
දෙ ව් මෙහසුන් විබිසණ සුරිඳුට පව ර

5. පව්රද කඳ, පර්වතරාජ නමැති හෙවත් මහාමෙරු පර්වත නමැති සකන්ධයක් ඇත්තාවූ; නාලෝමුල්, නාගලෝක නමැති මූලයෙන් යුක්තාවූ; දිගතුබර, දිශානමැති ශාඛාභාර ඇත්තාවූ; ලෙව්තුරු, ලොකනමැති වෘක්ෂයෙහි; යස, කීර්ති නමැති; මිණිමුතු, ප්‍රබුද්ධවූ; මල්පතර, පුෂ්පසමූහය; සුසැදු, සුසජ්ජිතකලාවූ; සුරපුර වන්, දිව්‍යපුරය මෙන්; සව්සිරි, සකලසම්පත්තියෙන්; පිරි, සම්පූර්ණවූ; කැලණිපුර, කල්‍යාණිපුරයෙහි; පවර, ප්‍රවරවූ; විබිසණ සුරිඳුට, විභීෂණසුරෙන්ද්‍රයාහට; මෙහසුන්, මේ සංදේශය; දෙව්, දානයකරව්.

මහමෙර නමැති කඳක් ඇති, නාගලොක නමැති මූලක් ඇති, (පූර්වපශ්චිමාදි) දිශා නමැති අතුපතර ඇති, ලොක නමැති වෘක්ෂයෙහි—කීර්ති නමැති සුපුෂ්පිත කුසුම සමූහය මනාකොට සජ්ජිතකලාවූ; සියලු ඓශ්වර්යයෙන් සම්පූර්ණවූ දිව්‍යපුරය වැනි කැලණිනුවර වාසී උතුම්වූ විභීෂණ දිව්‍යරාජයාට මේ හස්න දෙව්.

මෙසේ විධානකොට ඉක්බිති හසුන් ගෙන යායුතු මාර්ගවර්ණන දිය කියනුපිණිස "ගනවන් මියුරු" යනාදි කව කීහු.

6. ග න ව න් මියුරු නද දෙන ගුවන වන් වි ට
වි ල සි න් මෙමා කරවන මිතුරෙ මන්තු ට
එ හ සු න් පැසුලු පවසමි රස තුසුන් කො ට
අ ස දූ න් තු යන මග සලකුණු මෙතැන් සි ට

6. ගුවන වන් විට, (සමුද්‍රයෙන් ජලග්‍රහණයකොට) ආකාශයට ප්‍රවිෂ්ටවූ කාලයෙහි; මියුරු නදදෙන, මයූරයන්ට සන්තොෂ දානයකරන්නාවූ; ගනවන්, මෙඝසකට බඳුවූ; විලසින්, (ශරීර) විලාසයෙන්; මෙමා මන්තුටකරවන, මේ මාගේ චිත්තසන්තොෂය කරවන්නාවූ; මිතුරෙ, යහළුව; පැසුලු, පශ්චාත්කාලයෙහි (හෙවත් මාර්ගවර්ණනාවිට) පසුව; එහසුන්, ඒ සංදේශවාක්‍යය; රස තුසුන් කොට, මධුරාර්ථ අවිච්ඡේදය කොට; පවසමි, ප්‍රකාශකරමි; දූන්, අද්‍යනාකාලයෙහි; මෙතැන් සිට, මේ(අප උන්නාවූ) ස්ථානයෙහි පටන්; තු යන, තා ගමනකරන්නාවූ; මග සලකුණු, මාර්ගසඞ්කෙතයන්; අස, ශ්‍රවණයකර.

අහසට පැමිණි කල්හි මේඝයක් මෙන් මයූරයන්ට ප්‍රියඵල වන්නාවූ; ස්වකීය ස්වභාවයෙන් මාගේ සිත සතුටුකරන යහළුව; ඒ හස්න රසවත්කොට නැවත කියමි; මෙතැන් පටන් තොප යන්නාවූ මාර්ගයෙහි ලකුණු මෙකල්හි අසව.

ඉක්බිති ඒ ශාරිකාපක්ෂිරාජයා නික්මෙණ පුරය වර්ණනාකරන්නාහු "පොහොසද්දන" යනාදි කව කීහු.

7. පොහොසද්දන ඇති තුනුරුවනැ බැතිපෙ මා
මු ලු ව ද් ද න සුරපුර පිරි සිරින් හැ මා
ජ ය ව ද් ද න කෙරුමෙන් සුසැදි තම්න මා
ජ ය ව ද් ද න පුරවර දනු මිතුරුතු මා

7. තුනුරුවනැ, (බුද්ධාදි) රත්නත්‍රයෙහි; බැතිපෙමා, භක්ති ප්‍රෙම ඇත්තාවූ; පොහොසද්දන ඇති, ප්‍රභූජනයා ඇත්තාවූ; පිරි, සම්පූර්ණවූ; හැමාසිරින්, සකලසම්පත්තියෙන්; සුරපුර, දිව්‍යපුරය; මුලුවද්දන, කොණ්ප්‍රවෙශ කරන්නාවූ; ජයවද්දන කෙරුමෙන්, ජයවර්ධනයකිරීම හෙතුකොටගෙන; තමනමා, ස්වකීය නාමය; සුසැදි, (අර්ථාන්විතවූ හෙයින්) සුසජ්ජිතවූ; ජයවද්දන පුරවර, ජයවර්ධනපුරප්‍රවරය; මිතුරුතුමා, මිත්‍රොත්තමය; දනු, අවබොධ කරව.

ත්‍රිවිධරත්නයෙහි භක්තිප්‍රෙමයෙන් යුක්තවූ ප්‍රභූජනයා ඇති; තමා සියලු සම්පත්තියෙන් පිරිසිටිහෙයින් දිව්‍යපුරය මුලුගන්වන්නාවූ; ජයවර්ධනයකළ බැවින් ස්වකීය නාමය අර්ථානුරූපව සැදූනාවූ; ජයවර්ධන නම් උතුම් පුරය මිත්‍රොත්තමයා විසින් දතයුතුය.

8. සැදි රතතඹර පෙළ රනතිසරුන් රුවැ ති
වි දි දියදහර ලෙලදෙන දිගු නරුපටැ ති
රැ දි රළරැළැති හොය දියවන්නා නමැ ති
ඇ දි පුරඅහන පටසළු සිරි රුපැසි නි ති

8. රතතඹරපෙළ, රක්තවර්ණ තාමරසපඞ්ක්තියෙන්; සැදි, සජ්ජිතවූ; රනතිසරුන් රුවැති, ස්වර්ණහංසයන්ගේ රූපයන් ඇත්තාවූ; විදි දියදහර, (එක්දිශාභාගයකින් ආවරණවශයෙන් බඳනාලද පාෂාණයෙහි) විකීර්ණවූ ජලධාරා නමැති; ලෙලදෙන, ලීලොපෙතවූ; දිගු, දීඝවූ; නරුපටැති, නිවිපට්ටයෙන් යුක්තවූ; රැඳි, රඤ්ජිතවූ; රළරැළැති, තරඞ්ගනමැති වලි ඇත්තාවූ; දියවන් නානමැති, දියවන්නාව යන නාමයක් ඇත්තාවූ; හොය, නදී

තොමෝ; පුරඅඟන, පුරනමැති අඞ්ගනාව විසින්; ඇඳි, අවච්ඡාද නයකළාවූ; පටසළු සිරි, පට්ටවස්ත්‍රශ්‍රිය; නිති, නිරන්තරයෙන්; ඇරපැයි, ගෙනහැරදක්වී.

රත්නෙළුම් පඞ්ක්තියෙන් සැරසුනාවූ; ස්වර්ණහංසයන්ගේ රූප යන් ඇති; පැතිරසිටි ජලධාරා නමැති චඤ්චලවූ දික් තෙරිපටක් ඇති; රජමාන රලනමැති රැලිඇති දියවන්නාව නම්වූ භොගු; නගර නමැති ස්ත්‍රිය විසින් අඳිනලද පටසළුවක ස්වභාව ගෙන හැරදක්විය.

9. ස ම න ළ මුහුළ මහසමුදුර මෙවුල්බ ර
සු ල ක ළ පුවළ ලකඟන සිරි යොවුන් ව ර
ත ර ක ළ විසල් වාසල් යතුරු මෙනුව ර
බැ දැ හ ළ රුවන් තනපට කියලිය පවු ර

9. සමනළ මුහුළ, සමන්තකූටපර්වත නමැති ධම්මිල්ලයක් ඇත්තාවූ; මහසමුදුර මෙවුල්බර, (හාත්පසින් වටකරනලද) මහා සමුද්‍ර නමැති මෙඛලාභාරයක් ඇත්තාවූ; සුලකළ, මොනවට අලඞ්කෘතවූ; පුවළ, (මේ වර්තමානකාලයට) ප්‍රෞඪවූ; ලකඟන, ලඞ්කාඞ්ගනාව; සිරි, ඓශ්වර්ය්‍යයෙන්; යොවුන්වර, යෞවනාවස්ථාවෙහි; බැඳැහළ, බන්ධනයකොට හරනලද්දාවූ; විසල් වාසල්, විශාලවූ ගොපුරවාර නමැති; තරකළ, ස්ථිරීකෘතවූ; යතුරු, යන්ත්‍ර බන්ධනය ඇත්තාවූ; රුවන්තනපට, (ශ්‍රී) රත්නමය පයොධරපට්ට ශොභාවක්; මෙනුවර පවුර, මේ නගරයෙහි ප්‍රාකාරයතෙම; කියලිය, ප්‍රකාශ කෙළේයි.

සමනළගිර නමැති කොණ්ඩයෙන් හා මහමුහුද නමැතිමෙඛලා හාරයෙන් යුත් මනාව සැරසී සිටි මහත්වූ ලක්දිව නමැති ස්ත්‍රිය ඓශ්වර්ය්‍යයෙන් තරුණවූ කල්හි බැඳගන්නාලද ස්වර්ණමය තන පටක ස්වභාව ස්ථිරව කරනලද යතුරුබැඳුම් ඇති මේ නගරයෙහි ප්‍රකාරයතෙම ප්‍රකාශකෙළේයි.

10. සි හි ල් සපු සුවඳ ගෙනෑ එන උයන්ව ල
සි හි ල් නෙලෙන් හඬවන මිණි කිකිණිකෑ ල
වි පු ල් රත්සෙමෙර බඳ රත් දද සස ල
ල ක ල් මෙපුර තුල වලහා රිවිතැවි ල

10. උයන්වල, ගෘහොද්‍යානයන්හි; සිහිල් සපුසුවඳ, චන්දන චම්පක පුෂ්පයන්ගේ සුගන්ධය; ගෙනෑ එන, ග්‍රහනයකොට

එන්නාවූ; සිහිල් නෙලෙන්, ශීතල මාරුතයෙන්; හඬවන, නාද පවත්වන්නාවූ; මිණි කිකිණිකැල, මාණික්‍ය කිඞ්කිණික සමූහ ඇත්තාවූ; විපුල්, මහත්වූ; රත්සෙමෙර බඳ, රක්තවර්ණ චාමර බඳනාලද්දාවූ; සසල, චඤ්චලවූ; රත්දද, රක්ත (පට්ට) ධ්වජතෙම; ලකල්, අලඞ්කෘතවූ; මෙපුර තුල, මේ පුරාභ්‍යන්තරයෙහි; රිවි තැවිල, සූර්‍ය්‍යසන්තාපය; වලහා, පහකෙරෙයි.

සමීපවනයෙහි සඳුන් සුවඳ හා සපුමල්සුවඳ ඇසුරුකොටගෙන එන්නාවූ සිහිල් සුලඟින් පවත්වනලද නාදයෙන් යුත් මැණික් එබූ කුඩා මිණිගෙඩි එල්වූ මහත්වූ රක්තචාමරයන් බැඳි චචල වන රක්තවර්ණ ධ්වජයන් විසින් අලඞ්කාරවූ මේ නගරයතුල හිරුරැස් වලක්වයි.

මෙහි සඳුන් සපුමල් සුවඳ ඇසුරුකළාවූ සිහිල් සුලඟ හා රත් සෙමෙර රක්තධ්වජ වර්ණනාකිරීමෙන් වසන්තසෘතුවෙහි ඒ නුවර පවත්වන්නාවූ මකරධ්වජ උත්සවය දක්වූහු.

11. ත ර සර හිවි මහල් මෙහි පහපෙළ නිතො ර
සු ර සිදුවිදුදරන් සැදී සඳලු මනහ ර
ක ර වන මගුල්කෙළියෙන් නොමැති අවස ර
පු ර සිරි බලනලෙස බට සුරවිමන් යු ර

11. මෙහි, මේ පුරයෙහි; තරසර, ස්ථිරසාරවූ; හිවි; උස්වූ; මහල්, ත්‍රිභූමක පඤ්චභූමකාදිවූ; පහපෙළ, ප්‍රාසාදපඞ්ක්තියෙහි; නිතොර, නිරන්තරයෙන්; සුර සිදුවිදුදරන්, දෙව සිද්ධවිද්‍යාධර (ප්‍රතිමාරූප) යන් විසින්; සැදි, සැරහී සිටිනලද්දාවූ; මනහර, මනොඥවූ; සඳලු, චන්ද්‍රශාලාවෝ; කරවන, (සන්තුෂ්ටවූ නාගරික ජනයන් විසින්) කරවනු ලබන්නාවූ; මගුල්කෙළියෙන්, කල්‍යාණොත්සව ක්‍රීඩාවෙන්; අවසර, අවකාශයක්; නොමැති, නැත්තාවූ; පුරසිරි, පුරශ්‍රී සමෘද්ධිය; බලනලෙස, නිරීක්ෂණයකරන පරිද්දෙන්; බට, (ආකාශයෙන් භූමියට) අවතීර්ණවූ; සුරවිමන් යුර, දෙව විමාන හා සමානයෝයි.

අතුරු නොදක්වා පවත්වනලද මඞ්ගලක්‍රීඩා ඇති මේ නගරයෙහි; නිතර සැදීසිටි දිව්‍යසිද්ධවිද්‍යාධර රූපයන් ඇති සඳලුවලින් යුත් තුන්මහල් පස්මහල් ආදි මාල ඇති ස්ථිරසාරවූ උස්වූ ප්‍රාසාද පඞ්ක්තිය; නගරශ්‍රිය බලන පිණිස බැස්සාවූ දිව්‍යවිමාන වැන්න.

12. සි සි වත උවන ඉඟ සුහ ගතහැකි මිටි න
නි සි පුළුලුකුලු රියසක යුරු තිසරත න
දි සි රනලියෙව් රූසිරි යුත් මෙපුරඟ න
ඇ සි පිය හෙලන පමණින් නොවෙති දෙවඟ න

12. සිසි වත, චන්ද්‍රයා බඳුවූ; උවන, මුඛ ඇත්තාවූ; මිටින ගතහැකි, මැණිග්‍රහණයකල හැක්කාවූ; ඉඟ සුහ, කෘශවූ මධ්‍යම ප්‍රදෙශ ඇත්තාවූ; රියසක යුරු, රථචක්‍රාකාරවූ; නිසි, (අභිලාෂ කිරීමට) යොග්‍යවූ; පුළුලුකුලු, පෘථුල ශ්‍රොණිභාග ඇති; තිසරතන, හංසයන් බඳුවූ පයොධර ඇත්තාවූ; රනලියෙව්, ස්වර්ණලතාවන් මෙන්; දිසි, දෘශ්‍යමානවූ; රූසිරි යුත්, රූපශ්‍රියෙන් යුක්තවූ; මෙපුර ඟන, මේ පුරස්ත්‍රීහු; ඇසිපිය හෙලන පමණින්, අක්‍ෂිපක්‍ෂම සපන්දනයකරන මාත්‍රයකින්; දෙවඟන නොවෙති, දිව්‍යස්ත්‍රීහු නොවෙති. සෙසු රූපවිලාසයෙන් දිව්‍යස්ත්‍රීන් හා සමානය යනු භාවයි.

චන්ද්‍රයා වැනි මුහුණුද, මිටින් ඇල්වියහැකි ඉඟපිද; ආලය කට යුතු රථචක්‍රාකාර පළල් උකුළද; හංසයන් වැනි (උස්වූ කැකුළු) තනද ඇති; පෙනෙන්නාවූ හෝ හැසිරෙන්නාවූ ස්වර්ණලතා වැනි රූපශ්‍රීන් යුත් මේ නගරයෙහි ස්ත්‍රීහු; ඇසිපිය හෙලන හෙයින් පමණක් දිව්‍යස්ත්‍රීහු නොවෙති.

13. සොඳුරු සිය නදන් අනතුරුදෙසැ සිටි න
කි නුරු නිසසරන් කදහස වෙත නොව න
ඉ සු රු දනද සිය නිකෙලෙස් තැනැ රද න
උ තු රු දිගිඳු පුර දිනි මෙපුර වැජඹෙ න

13.. සොඳුරු සිය නදන්, (අලකපුරය මෙන් නවනිධානයක් නොව) සුන්දරවූ සියනිධානයන් ඇත්තාවූ; අනතුරුදෙසැ සිටින, (අලකපුරය මෙන් උත්තරදිශාවෙහි නොපිහිටා) තමහට ඉතිරි යක්හු නැති දික්හි හෙවත් දක්‍ෂිණ දිශාවෙහි ස්ථානයකරන්නාවූ; කිනුරු නිසසරන්, (අශ්වමුඛාදී) කින්නරයන් හා යක්‍ෂයන් දෙහෝ නොහොත් කුත්සිත නරයන් හා චොරයන්; කදහස, කිසිකලෙක; වෙතනොවනැ, සමීප නොවන්නාවූ; ඉසුරුදනද සිය, (එක ඊශ්වරයක්හු එක ධනයක්හු නොව) සියගණන් ඊශ්වරයන් හා සියගණන් ධනින්; නිකෙලෙස් තැනැ රදන, (අලකපුරයෙහි කෛලාසස්ථානයෙහි මෙන් වාසයනොකොට) නිෂ්ක්ලේශස්ථානයෙහි හෙවත් බාධාවක් නැත්තාවූ ස්ථානයෙහි රඤ්ජමානවූ;

වැජඹෙන, විජෘම්භමානවන්නාවූ, මෙපුර, මේ නගරය; උතුරු දිසිඳු පුර, උත්තරදිශාධිපති වෛසමුනි රජහුගේ (අලක නම්) රාජධානිය; දිනි, ජයගනී.

සුන්දරවූ සියගණන් නිධාන ඇතී, තමහට වැඩිසිටි අනික් දිශාවක් නොතබා අභ්‍යන්තරදික්හි හෙවත් දකුණුදික්හි පිහිටියාවූ; කිසිකලෙකත් කින්නර නිශාචරයන් සම්පනොවන්නාවූ; සියගණන් අධිපතින් හා ධනවතුන් රඳන්නාවූ; අනුන් විසින් අබාධිත ස්ථානයෙහි පිහිටි, විජෘම්භමානවන්නාවූ මේ නගරය අලකපුරය ජයගනී.

ජයවඩීන නුවර අලකපුරයෙන් වැඩිසිටිබැව් මේ කවියෙන් කීහ, අලකපුරය වනාහි මහාපද්ම නම් නිධානය ආදි නව නිධානයකින් සමන්විත විය, කිනනර නිශාචරයන් විසින් උපද්‍රා සහිත විය, කෛලාසවාසී එකම ඊශ්වරයෙක් හා, වෛශ්‍රවණ නම් එකමධනව තෙක්ද ඇතිවිය; ජයවඩීනපුරය වනාහි සියගණන් නිධාන ඇත්තේවිය. කුත්සිත මිනිසුන් හෝ සොරුන් විසින් අනුපද්‍රැතය, සියගණන් අධිපතීන් හා සියගණන් ප්‍රභූජනයා ඇත්තේය, අබාධිතවූ හෝ ආරක්‍ෂා සහිතවූ ස්ථානයෙහි පිහිටීයේය, එහෙයින් මේ නුවර අලකපුරයෙන් ජයගනී.

මෙසේ පුරවර්ණනා කොට ඉක්බිති හසුන් ගෙන නික්මීමට ශුභනැකැත් කියන්නෝ "උදේ සැපත්" යනාදි කව කීහු.

14. උ දේ සැපත් සුරගුරු අලුකරු අව ට
ස දේ මුදුන්වත අස්විද නැකතැ සි ට
න දේ සිතින් තම කුලදෙවිය සිහිකො ට
යෙදේ ගමන් යහළුව මෙපුරෙන් තොප ට

14. සුරගුරු, වෘහස්පතීහු; අවට, හාත්පස; අලුකරු, ආලෝක කොට; උදේසැපත්, උදාවීමට පැමිණිකල්හි; අස්විදනැකතැ, අශ්විනීනක්‍ෂත්‍රයෙහි; සිට, අවස්ථිතව; සදේ මුදුන්වත, චන්ද්‍රයා නභෝමධ්‍යයට පැමිණි කල්හි; නදේසිතින්, සන්තොෂචිත්තයෙන්; තම කුලදෙවිය, ස්වකීය කුලදේවතා; සිහිකොට, ස්මරණයකොට හෙවත් තුනුරුවන් සිහිකොට); යහළුව, මිත්‍රය; තොපට, භවත් හට; මෙපුරෙන්, මේ පුරයෙන්; ගමන්, ගමනය; යෙදේ, යුක්ත වෙයි.

භාත්පස එලිකොටගෙන උදාවන වෘහස්පතී සමග, අස්විද නාක්‍ෂත්‍රයෙහි සිට චන්‍ද්‍රයා උදාවන කල්හි; තමාගේ කුලදෙවියන් සතුටුසිතින් යුක්තව සිහිකොටගෙන; මිත්‍රය තොපට මේ නුවරින් ගමනාරම්භය කටයුතු වේ.

අස්විදය මුදුන්වූකල කන්‍යා ලග්නය සම්මුඛවීමද, ඒ ලග්න යෙහි වෘහස්පති උච්චක්‍ෂෙත්‍රව රශ්මි සහිතව බලවත් බව දැක්වී මෙන් ලග්නසථවූ වෘහස්පතීහු විසින් සියලු දෙෂයන්ගේ අභාවය, කරනබවද, ගමන්යාමෙහි අශ්විනී නාක්‍ෂත්‍රයාගේ ශ්‍රෙෂ්ඨභාවයද, සියලු කර්‍මයෙහි පූජිතවූ විජයයොගයාගේ යෙදීමද මේ කවියෙන් කීහ.

15. න ල මුදු සුවඳ පිරිකුඹු මියුරු අඹගෙ ඩී
පු ල හෙලකුසුම ලිය පියතෙපල් රන්කෙ ඩි
ස ල සුදුසෙමෙර සේසත් ගිජ්දුනොදවැ ඩී
බ ල සුබනිමිති පෙරමගැ නැකතටත් වැ ඩී

15. සුවඳ, සුගන්‍ධයෙන් යුක්තවූ; මුදු, මොලොක්වූ; නල (අනුකූල) මාරුතයද; පිරිකුඹු, පූර්‍ණකුම්භයන්ද; මියුරු, මධුර යන්ද; නොහොත්—මියුරු, මධුරවූ; අඹගෙඩි, අම්ඵලද; පුල හෙලකුසුම, පුල්ලවූ (ජාතිමාලත්‍යාදි) ශ්වෙතපුෂ්පයන්ද; පියතෙ පල, ප්‍රියවචන කියන්නාවූ; ලිය, ස්ත්‍රීන්ද; රන්කෙඩි, (ජලභරිතවූ) සවර්‍ණභිඞ්කාරද; සල, විජමානවූ හෙවත් සලනු ලබන්නාවූ; සුදු සෙමෙර, ශ්වෙතචාමරද; සේසත්, ශ්වෙතච්ඡත්‍රයන්ද; ඔදවැඩි, ඔජස් අධිකවූ; ගිජ්දුන්, හස්තීන්ද (යන); පෙරමග, පරිපථයෙහි; නැකතටත් වැඩි, නාක්‍ෂත්‍රයොගයටත් වඩා (විශිෂ්ඨවූ); සුබනිමිති, ශුභනිමිත්තයන්; බල, නිරීක්‍ෂණයකර.

සුවඳ සහිත මෘදු සුළඟය, පුන්කලස්ය, මොනරුන්ය හෙවත් මිහිරි අඹඵලය, පිපියාවූ දෑසමන් ආදී සුදුමල්ය, මධුරකථා ඇති ස්ත්‍රීන්ය, රත්රන් කෙණ්ඩිය, සලන්නාවූ සුදුසෙමෙරය, සේසත්ය, ඔදවැඩියාවූ ඇතුන්ය යන පූර්‍වනිමිති නැකතටත් වඩා සැලකිලි ලෙස ඉදිරිමාර්‍ගයෙහි බලව.

16. ලොවැ විහිද සුදුපැහැ සඳරුසෙව් සැ දී
දෙනනොමඳ සිරි සගමොක් සැප නිසැ දී
ල ද මු නි ඳ දම්කඳ පහස මත බැ දී
ව ඳු ද ල ද හිමි තෙමහල් පහයැ රැ දී

16. සඳරැසෙව්, චන්ද්‍රරශ්මි මෙන්; සැදි, සජ්ජිතවූ; සුදුපැහැ, අවදාතවර්ණය; ලොවැ, ලොකයෙහි; විහිදූ, ව්‍යාප්තකොට; නිසැදි, නිරන්තරයෙන්; නොමඳ, අනල්පවූ; සගසිරි, ස්වර්ගලොකයෙහි ඓශ්වර්‍ය්‍යද; මොක්සැප, මොක්ෂසෞඛ්‍යයද; දෙන, දානය කරන්නාවූ; මුනිඳු, මුනීන්ද්‍රයානන්වහන්සේගේ; මනබැඳි, මනොබද්ධවූ; දම්කඳ, (සුවාසූදහසක්) ධර්මස්කන්ධයාගේ; පහසලද, ස්පර්ශය ලද්දාවූ; තෙමහල්පහයෑ රැඳි, ත්‍රිභූමකප්‍රාසාදයෙහි පිහිටියාවූ; දළදාහිමි, ශ්‍රීදන්තධාතු ස්වාමීන්වහන්සේ; වඳු, නමස්කාර කරව.

සඳරැස් පරිද්දෙන් ලොකයෙහි පැතිරසිටි සුදුපැහැය ගෙනොහොත් කීර්තිප්‍රභාව ඇති; මහත්වූ ස්වර්ගමොක්ෂසුඛය නිරන්තරයෙන් දෙන්නාවූ; මුනීන්ද්‍රයානන්ගේ සිත්හි බැඳිසිටි ධර්මස්කන්ධයෙහි පහස ලැබූ; තුන්මහල් ප්‍රාසාදයෙහි විරාජිතවූ දළදාධාතු ස්වාමීන්වහන්සේ වඳුව.

17. ගනරන් කොතින් දිලිහෙන මිණිරුස් විහි   දූ
පවනින් ලෙලෙන පලඅග මුතුලැල් සිනි   දූ
සඳකැන් මිණෙන් බඳ රුදු බිතුපෙළින් රැ   දූ
එතැනින් ගොසින් සැණෙකින් රජවිමන් ව   දූ

17. විහිදූ, ව්‍යාප්තවූ; මිණිරුස්, මාණික්‍යරශ්මි ඇත්තාවූ; ගනරන්කොතින්, ඝනකනක ශෘඞ්ගයෙන්; දිලිහෙන, දීප්‍යමානවූ; පලඅග, ඡදනාග්‍රයෙහි; පවනින්ලෙලෙන, මාරුතයෙන් චඤ්චලවූ; සිනිදූ, සනිග්ධවූ; මුතුලැල්, මුක්තාලතිකා ඇත්තාවූ; සඳකැන් මිණෙන්, චන්ද්‍රකාන්තපාෂාණයෙන්; බඳ, බඳනාලද්දාවූ; රුදු, මහත්වූ; බිතුපෙළින් රැඳු, භිත්තිපඞ්ක්තියෙන් රඤ්ජිතවූ; රජ විමන්, රාජවිමානයට; එතැනින්, ඒ ධාතුමන්දිරයෙන්; සැණෙකින්, ක්ෂණයකින්; ගොසින්, ගමනයකොට; වදු, ප්‍රවෙශවෙව.

ඝන ස්වර්ණමයවූ කොත්කැරලිවලින් දීප්තිමත් මාණික්‍යරැස් පතුරුවන්නාවූ; පියසිඅග සුළඟින් ලෙලදෙනලද සිනිඳු මුතුලැල් ඇති, පළිඟුගලින් බඳනාලද මහත්වූ භිත්ති පෙළින් යුත්, රාජභවනයට; පළමු කියනලද දළදා ප්‍රසාදයෙන් නික්ම ක්ෂණයකින් වදුව.

18 ශ්‍රී වී බි ම් බා සුරු ඊවිතුල කමලාන   ර
පී යුම මී බා නිතරම රැඳි උරමැදු   ර
මෙන රම්බා හිමි රූසිරිනි මනහ   ර
පැ ර කුම්බා නරනිඳුසඳ දකු මිතු   ර

18. රිවිකුල, සූර්යවංශ නමැති; කමලකර, පද්මාකරයට රිවිබිම්බා පුරෑ, සූර්ය මණ්ඩලය හා සමානවූ; නිතරම, නිරන්තරවම පියුමම්බා, ශ්‍රීකාන්තාව විසින්; රුදි, රඤ්ජමානවූ; උරමැදුර, උරස්ථලනමැති මන්දිරයක් ඇත්තාවූ; මනහර, මනොහරවූ; රුසිරිනි, රූපශ්‍රී කරණකොටගෙන; රඹිබාහිමි මෙන, රම්භාවට වල්ලභවූ නලකූබරයා හා සමානවූ; පැරකුම්බා නරනිඳුසඳ, ශ්‍රීපරාක්‍රමබාහු නරෙන්ද්‍රොත්තමයානන්; මිතුර, මිත්‍රය; දකු, නිරීක්‍ෂණයකර.

රජකුලය නමැති නෙළුම් වනයට සූර්යමණ්ඩලය වැනිවූ; නිරන්තරයෙන් ශ්‍රීදේවිය වසන්නාවූ හෘදය නමැති මන්දිරයක් ඇති; මනොඥවූ රූපශ්‍රීය කරණකොටගෙන රම්භාවගේ ස්වාමියා වැනිවූ; පරාක්‍රමබාහු නරශ්‍රෙෂ්ඨයා මිත්‍රොත්තමයා විසින් දකගන්න.

19. උ නු නොව බරණ සිවුසැට ඔවුනුත් පැල ඳ
වෙනු මෙන් පසක් උන්සඳ සීහසුන් මැ ද
ම නු රජකුලෙන් පැවතෙන පිළිවෙල නොසි ඳ
ශ නු අවසරය එනිරිඳු සිරිපතුල් වැ ඳ

19. ඔටුනුත්, කිරීට සහිතවූ නොහොත් ඔටුන්න ඇතුළුවූ; සිවුසැටබරණ, චතුෂෂ්ටි ආභරණයන්; උනුනොව, අඩුවක් නැතිව; පැලඳ, ප්‍රසාදනයකොට; (ඒ නරෙන්ද්‍රයා) පසක් වෙනු මෙන්, ප්‍රත්‍යක්‍ෂ විජ්ජුමෙන්; සීහසුන්මැද, සිංහාසන මධ්‍යයෙහි; උන්සඳ, නිෂණ්ණකාලයෙහි; මනුරජකුලෙන්, මහාසම්මත රජහුගේ වංශයෙන්; පිළිවෙල නොසිඳ, සන්තතිවිච්ඡෙදය නොකොට; පැවතෙන, ප්‍රවෘර්තිතව එන්නාවූ; එනිරිඳු, ඒ (පරාක්‍රමබාහු) නරෙන්ද්‍රයාගේ; සිරිපතුල් වැඳ, ශ්‍රීපාදතල නමස්කාරකොට; අවසරයගනු, අනුඥග්‍රහණයකර.

ඔටුන්න ඇතුළුවූ හැටහතරක් ආභරණයන් අඩුනැතිව පැලඳගෙන, ප්‍රත්‍යක්‍ෂ විජ්ජු සෙයින් සිංහාසනමධ්‍යයෙහි උන් කල්හි; පටිපාටිය කඩනොකොට මනුරාජ පරම්පරාවෙන් පැවතඑන්නාවූ ඒ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ ශ්‍රීපාදය වැඳ (ගමනාරම්භය පිණිස) අවකාශගනුව. මෙසේ කීහු තමන් වසන පුරවර්ණනාව පෙරටුව ඒ නුවරින් දූතයා නික්මෙණ නක්‍ෂත්‍රයොග නියමකොට, ඉක්බිති ශ්‍රීදන්තධාතුනමස්කාරයට විධානකොට, එසින් ඉක්බිති රජගෙට ගොස් ගමන්පිණිස රජහු කෙරෙන් අවසරගෙන යාමට නියමකොට, ඉන්පසු මාර්ගවර්ණනාව ආරම්භකරන්නාහු "පෙරවසඳ කිරණ" යනාදි කව කීහු.

20. පෙරව් සඳකිරණ පිපි කුමුදුමල් ව පි න්
පර ව තඹරපෙති ගිලි දියතලා පි ටි න්
තර ව සිහි ඇතිව පරතෙරට යන අ පි න්
කර ව පියාසර සකි කොන්තගංතො ටි න්

20. සඳකිරණ, චන්ද්‍රකාන්තියෙන්; පෙරව, පොරවනාලද්දවූ වපින්, හාත්පසින්; පිපි, ප්‍රබුද්ධවූ; කුමුදුමල්, කෞමුද පුෂ්පයන් ඇත්තාවූ; පරව, පරිණතභාවයට පැමිණි; ගිලි, ගලිතවූ; තඹර පෙති, තාම්රස පත්‍රයන් ඇත්තාවූ; දියතලා පිටින්, ජලතලා මතුභාගයෙන් උපලක්ෂිතවූ; කොන්තගංතොටින්, කොන්තගංතොට යන නදීප්‍රදෙශයෙන්; පරතෙරට, පරතීරයට; යන අපින්; ගමනෙච්ඡායෙන්; තරව, ස්ථිරභූතව; සිහි ඇතිව, ස්මෘතිමත්ව, සකි, යහළුව; පියාසරකරව් (ආකාශමාර්ගයෙන්) පක්ෂප්‍රසාරණය කරව.

සඳකැලුමෙන් පොරවනාලදින් හාත්පස පිපුනු කෞමුදමල් හා පරවී වැටුනු ඉනලුම්මල් පෙති ඇති ජලතලා මතුභාගයෙන් යුත්; කොන්තගංතොට නම් නදීප්‍රදෙශයෙන් පරතෙරට යන ආශා ඇතිව, යහළුව ස්ථිරබුද්ධියෙන් යුක්තව පියාසරකරන්.

21. ක ලු වැ ල් කපුරු දුමතුල ලෙලෙන දදපෙ ළ
සු වි ස ල් මිහිඟු සක්සන් මිණිහඬ වත ළ
කරු ලොල් සතන් පවසන තිසුති දෙම ළ
මනකල් ඉසුරුකෝවිලැ ලගිනේ ලක ළ

21. කලුවැල්කපුරු දුම්, කාලාගුරු කර්පූරධූමය විසින්; අතුල, ආස්තරණයකරනලද්දවූ (නොහොත්) කලුවැල්කපුරු දුම, කාලාගුරුකර්පූර ධූමයාගේ; ඇතුල, අභ්‍යන්තරයෙහි; ලෙලෙන, චඤ්චලවූ; දදපෙළ, ධ්වජපාළි ඇත්තාවූ; සුවිසල්, අතිවිශාලවූ; මිහිඟු සක්සන්; මෘදඞ්ගනාද ශඞ්ඛනාදයන් හා; මිණිහඬ, ඝණ්ටාරවයන්; වතළ, ව්‍යාප්තවූ; සතන්, (ශෛවසමයෙහි දීක්ෂිතවූ) සත්වයන් විසින්; ලොල්කරු, (මහදෙවියාගේ ගුණයෙහි) ලොභ කොට; දෙමළ තිසුති, ද්‍රවිඩභාෂාවෙන් කරනලද ස්තුති ගීතිකාවන්; පවසන, (අෂ්ටාදශ රාගයෙන්) කථනයකරනු ලබන්නාවූ; ලකළ, අලඞ්කෘතවූ; මනකල්, මනොඥවූ; ඉසුරුකෝවිලැ, ශිවදෙවාලයෙහි; (සකි සනු යපින් වැටේ)—සකි, යහළුව; ලගිනේ, නිවාස හණයකරන්නේයි.

කලුඅගිල් මිශ්‍රවූ කපුරුදුම් පැතුරුනාවූ නොහොත්, පැතිරසිටි කලුඅගිල් කපුරු දුම ඇතුලෙහි ලෙලදෙන ධ්වජපඞ්ක්ති ඇති; මිහිඟුබෙර නාදයද, සක්හඬ හා ඝණ්ටාරනාදයද ඉතා අධිකව පැතිර සිටියාවූ, ශෛවසමයවාදී සත්වයන් විසින් (මහෙශ්වරයා කෙරෙහි) ලොභකොට කියනු ලබන්නාවූ ද්‍රවිඩභාෂාවෙන් කරන ලද ස්තුතිපත්තිකාවන් ඇති; සිත් අලවන්නාවූ අලඞ්කාර ශිවදෙවාලයෙහි ලැගුම්ගනුව.

22. වෙ ස ගන තුඟු තනයුග රෙණ් කොකුමඟ ර
පි ස එන මදපවන් හැද විල්ලිහිණිස ර
ගොස අලුයම් පසතුරු සවනතෙහි කු ර
ඇ ස නිදිගැට හැරු නැගිසිටු උදහි ර

22. වෙසඟන, (සම්පවෘත්තිවූ) වෙශ්‍යාවන්ගේ; තුඟු, (ගජකුම්භාකාරයෙන්) උන්නතවූ; තනයුග, පයොධරයුග්මයෙහි; කොකුමඟර රෙණ්, කුංකුමාඞ්ගරාග රේණූන්; පිස, සම්මාර්ජනයකොට; විල්ලිහිණිසර, සාරසපක්ෂීන්ගේ නාදය; හැද, ආකර්ෂණයකොට; මදපවන් එන, මන්දමාරුතය හමන කාල්යෙහි; අලුයම් පසතුරු, ප්‍රත්‍යූෂකාලයෙහි පවත්නා පඤ්චාඞ්ගික තූර්‍ය්‍යයන්ගේ; ගොසා ඝොෂාව; සවනතෙහි කුර, ශ්‍රවණයෙහි පමුණුවා හෙවත් අසා; උදහිර, සූර්‍ය්‍යොදයකාලයෙහි; ඇස, අක්ෂියෙහි; නිදිගැට හැරු, නිද්‍රාභ්‍රාන්ති මොචනයකොට; (සකි, යහළුව); නැගිසිටු, (තා රාත්‍රියෙහි ශයනයකලාවූ ස්ථානයෙන්) උත්ථානයකර.

වේසියන්ගේ උස්වූ දෙතනයෙහි කොකුම් විලවුන් පිසගෙන, විල්ලිහිණිනාදය එක්කොටගෙන මදසුලඟ එනකල්හි, ඒ ශිව දෙවාලයෙහි අලුයම්තූරය පිණිස පවත්වනලද පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය නාදය අසා, අක්ෂියෙහි නිදිගැට හෙවත් නිදිබර ස්වභාව පහකොට උදසණ පිබිද සිටුව.

23. උ දා ගිරි කසුන්රිපිවැට හිසැ බැබ ළි
එ දා සහසකර පහනෙව් කරත හෙ ළි
යො දා තුවන් ඉසුරුට කරන පුදකෙ ළි
වි දා පියා නිලුඹර යත් නොවී මැ ළි

23. උදගිරි, උදයපර්වත (ශිඛර) නමැති; කසුන්රිපිවැට හිසැ, කාඤ්චනදීපයෂ්ටි මස්තකයෙහි; බැබළි, භ්‍රාජිතවූ; පහනෙව්, ප්‍රදීපයක් මෙන්; සහසකර, ආදිත්‍යයා; එදා, එදිනයෙහි; හෙළිකරත,

පහන්කරනකල්හි; ඉසුරුට කරන පුදකෙළි, ඊශ්වරයාට කරන් නාවූ පූජෝත්සවය; තුවන්, නෙත්‍රයෙහි; යොදා, යොජනකොට; මැළිනොවී, (සීතාදි කාරණයකින්) අලස්‍යයට් නොපැමිණ; පයා විදා, පක්ෂප්‍රසාරණයකොට; නීලම්බර, නිලවර්ණවූ ආකාශයට; යන්, ප්‍රයාණයකරන්.

උදයපර්වතනමැති රත්රන් පහන්කඳ මුදුනෙහි බබලන්නාවූ පහනක් මෙන්, ඒ දිවසමුඛයෙහි සූර්යයා ආලෝකය පතුරුවන කල්හි, ඊශ්වරයාට කරනලද පූජෝත්සවයන් බලා, නිදිබරබව නිසා මලානිකනොව පියාපත් විහිදගෙන නිල්වන් අහසට නගුව.

24. සු ර ර ද සමන් සමගින් සුරගන එව ර
පැහැ න ද මදුරු පරසතු මල්පත ර
ක ර පු ද වදින රුදි මුනි සිරිපාතඹ ර
ස කි ස ද පෙනේ සමනලගල නැගෙනහි ර

24. සකිසඳ, මීත්‍රොත්තමය; එවර, (තොප ආකාශයට නැංගාවූ) ඒ කාලයෙහි; සුරගන සමගින්, දිව්‍යාඞ්ගනාවන් හා එක්ව; සමන් සුරරද, සුමනදිව්‍යරාජයා විසින්; පැහැනද, ප්‍රභාවෙන් ආර්ද්‍රවූ හෙවත් කාන්තියෙන් තෙමීගියාක් වැනිවූ; මදුරුපරසතුමල්පතර, මන්දාරපාරිජාත කුසුමසමූහය; පුදකරු, පූජාකොට; වදින, නමස් කාර කරනුලබන්නාවූ; මුනි, සර්වඥයන්වහන්සේගේ; සිරිපාතඹර, ශ්‍රීපාදපද්මය; රුදී, පිහිටියාවූ; සමනලගල, සමන්තකූටපර්වතය; නැගෙනහිර, පූර්වදිශාභාගයෙන්; පෙනේ, දෘශ්‍යමානවේ.

මිත්‍රොත්තමය, (තොප ශිවදෙවාලයෙන් නික්ම ගමන්ගත්) ඒ කාලයෙහි දෙවඟනන් හා එක්ව සුමනදිව්‍යරාජයා විසින් කාන්ති යෙන් තෙත්වූ හෝ තෙමීගියාක් වැනිවූ මදුරු පරසතු මල්රාශීන් පූජාකොට වදිනුලබන්නාවූ, සර්වඥශ්‍රීපාදපද්මය පිහිටියාවූ සමනළ පර්වතය පූර්වදික්හි පෙනෙයි.

25. ගු ණේ මිණි බැබලි කිරණෙව් සත පා ය
ර ණේ යටග සැවුලිදුදද ගළ පා ය
අ ණේ ලකළ කළ පුර අප නර පා ය
පෙ ණේ දකුණැ මහසෙන්දෙව්රද පා ය

25. අපනරපාය පුර, අපගේ නරෙන්ද්‍රොත්තමයාගේ පුරයෙහි; සතපාය, ශතරශ්මීහුගේ; කිරණෙව්, රශ්මි කදම්බයක් වැනිවූ; ගණේ, ඝනවූ; මිණි, මාණික්‍යයෙන්; බැබලි, භ්‍රාජිතවූ; රණේ

ඝටන, සුවර්ණඝණ්ටාග්‍රයෙහි; සැඟලිදඳද, කුක්කුටධ්වජයන්; ගලීපාය, ඝටනාකොට; අනේලකලිකල, අනෙකාලඞ්කාර කරන ලද්දාවූ; මහසෙන්දෙව්රද පාය, ෂණ්මුඛදෙවිරාජයාගේ ප්‍රාසාදය; දකුණැ, දක්ෂිණදිග්භාගයෙහි; පෙනේ, දෘශ්‍යමානවේ.

සූය්‍ර්‍යරශ්මි පරිද්දෙන් ඝනව බබලන්නාවූ මාණික්‍යයන්ගෙන් යුත්, සුවර්ණඝණ්ට අග්‍රයෙහි නොහොත් මැණික් ඔබා තනනලද රන්කොඬිම්පි අග කුකුළුරූ සහිතවූ දද ගලීපා අනෙකාලඞ්කාර කොට නිමවනලද මහාසෙනදිව්‍යරාජයාගේ ප්‍රාසාදය අපනරෙන්ද්‍රයාගේ පුරයෙහි දකුණුදිගින් පෙනෙයි.

26. ච ල දින අදහසින් මෙන් සුරගඟ අඟ න
න ල බල සසල දළ රළපෙළ නුබ නැගෙ න
වෙල ළසැ ගැවසි මුතු සක් පබලු බබල න
බ ල මහමුහුද එමසඳ උතුරෙන් පෙනෙ න

26. සුරගඟ අඟන, ආකාශගඞ්ගා නමැති අඞ්ගනාව; චලදින අදහසින් මෙන්, ආලිඞ්ගනයකරන අභිප්‍රායෙන් මෙන්; නුබ නැගෙන, ගගනොල්ලඞ්ඝනය කරන්නාවූ; නලබල, මාරුතශක්ති යෙන් හෙවත් වාතවෙගයෙන්; සසල, චඤ්චලවන්නාවූ; දළරළ පෙළ, මහත්වූ තරඞ්ගපඞ්ක්තියෙන් යුක්තවූ; වෙලලසැ, වෙලා න්තයෙහි; ගැවසි, සඤ්ජනනවූ; මුතු සක් පබලු, මුක්තා සංඛ ප්‍රවා ලයෙන්; බබලන, භ්‍රාජමානවූ; එමසඳ, ඒ ක්‍ෂණයෙහි; උතුරෙන්, උත්තරදිග්භාගයෙන්; පෙනෙන, දෘශ්‍යමානවූ; මහමුහුද, මහා සමුද්‍රය; බල, නිරීක්‍ෂණයකර.

අහස්ගඟ නමැති ස්ත්‍රිය වැලඳගන්නා අදහසින් සේ, සුළංවේග යෙන් චඤ්චලව අහසට නගින්නාවූ මහත්රළපඞ්ක්ති ඇති, වෙරල සමීපයෙහි ගැවසුනාවූ මුතු සක් පබලු (රාශීන්) බබලමින්, එකල්හි උතුරුදිශාවෙන් පෙනෙන මහාසාගරය බලව.

27. සන් න න් සිහින් ගෙදී සෙවණලු වැලිතෙලෙ න
තැන්තැන් වලම සැතපී සිවුමැලි බැවි න
ර න් ව න් කරල් ගෙනැ එන ගිරවුන් අති න
ය න් ම න් තොසින් මග තොරතුරු නියම දු න

27. (සකිසඳ යතු යපින් වැවේ—සකිසඳ, සච්චන්ද්‍රය); නන්සිහින් ගෙදි, නොයෙක් සිහින්කොඤ්චාක්‍ෂයන්ගේ; සෙවණලු, ඡායාකුලවූ; වැලිතෙලෙන, (ධවල) පුලිනතලයෙන්; සන්, ගැවසීගත්තාවූ;

තැන්තැන්වලම, ඒ ඒ ස්ථානයන්හිම; සිවුමැලිබැවින; සුකුමාර භාවයෙන් යුක්තවූ හෙයින්; සැතපී, විශ්‍රාමයට පැමිණ; රන්වන් කරල් ගෙනැ, (කල්‍යාණිපුරසමීප ශාලික්ෂේත්‍රවලින්) පිඤ්ජර වර්ණවූ සස්‍යමඤ්ජරීන් ග්‍රහණයකොට; එන, අභිමුඛව එන්නාවූ; ගිරවුන් අතිනූ, කීරපක්ෂීන් කෙරෙන්; මග, මාර්ගයාගේ; තොරතුරු, විශේෂවිභාගය; නියම දැන, නිශ්චයපරිඥානයකොට; මන්කොසින්; චිත්තසන්තෝෂයෙන්; යන්, ප්‍රයාණය කරන්.

බොහෝවූ සිහින්කෙන්ද වෘක්ෂයන්ගේ සෙවණින් වැසුනු වැලි තලාවන්ගෙන් ගැවසිගත් ස්ථානයන්හි, (තොපගේ ශරීරය ඉතා) සිවුමැලිහෙයින් සැතපීහිඳ; රන්වන්වූ වීකරල් ගෙනඑන ගිරවුන් කෙරෙන් (මත්තෙහි තොප යායුතුවූ) මාර්ගප්‍රවෘත්තීන් නියම ලෙස විචාරාගෙන සතුටුසිතින් යුක්තව යව.

28. නි ල තුරඟුට නැගෙමින් රිවිදෙව් සිරි න
දු ල කරු සේසත් මිණිබරණ කිරණි න
බ ල පිරිසෙන් සහ යාපාපටුන් ගෙ න
බ ල සේනානායක සපුකුමරු එ න

28. රිවිදෙව් සිරින, සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාගේ ශෝභාවෙන්; නිල තුරඟුට නැගෙමින්, හරිණවර්ණ අශ්වාරූඪව; මිණිබරණකිරණින, රත්නාභරණකාන්තියෙන්; සේසත්, ශ්වේතච්ඡත්‍රය; දුලකරු, ජ්වලිතකොට; බලපිරිසෙන් සහ, බලවත්වූ සම්පූර්ණ සෙනාව හා එක්ව; යාපාපටුන් ගෙන, යාපාපට්ටන නම් පුරය (තමහට වශගකොට) ගෙන; එන, (අභිමුඛව) එන්නාවූ; සේනානායක, සෙනානායක ස්ථානාන්තරයට පැමිණි; සපුකුමරු, (උලකුඩය දෙවීන්ගේ ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ) චම්පකාභිධාන රාජකුමාරයා; බල, අවලෝකනය කර.

හිරුදෙවියා සදෘශවූ ලීලාවෙන් නිල්වන්වූ අශ්වයෙකුපිට නැගී මැණික්මය ආභරණයන්ගේ රශ්මියෙන් ශ්වේතච්ඡත්‍රය බබුලුවමින් බලවත්වූ සම්පූර්ණසෙනා සහිතව යාපාපටුන නම් නගරය යටත්කර ගෙන එන්නාවූ සෙනෙවිරත් තනතුරට පැමිණියාවූ සපුමල්කුමාරයා (ඉදිරිමාර්ගයෙහි) බලව.

29. අ ග පිපි මල් මලිගියලිය කැ ලේ යා
ව ග බැඳ හෙන රිජහස පුල්වි ලේ යා
ල ග සිරි තුරු ගිලිහුනු රොනවු ලේ යා
ම ග බැස යව පලී හෙල වැලිතෙ ලේ යා

29. අග, මස්තකයෙහි; පිපිමල්, පුෂ්පිත පුෂ්පයන් ඇත්තාවූ; මලියලියකැලේයා, මාලතීලතා ප්‍රධානයෙන් යුක්තවූ; වගබැඳ, වෙෂ්ඨනයකොට; හෙන, (පෙලසැදී) ගලාඑන්නාවූ; රජහස, ("රාජහංසාස්තු තෙ චඤ්චු චරණෛලෝහිතෛඃ සිතා" යනුහෙයින් රත්වූ තුඩු හා පා ඇති සර්වාඞ්ග ධවලවූ) රාජහංසයන් ඇත්තාවූ; පුල්විලේයා, ප්‍රබුද්ධපද්මාකරයන් ඇත්තාවූ; ලඟ, (මාර්ගී) සමීපයෙහි; සිටි; ස්ථානයකරන්නාවූ; තුරු, වෘක්ෂයෙන්; ගිලිහුනු, ගලිතවූ; රොනවුලේයා, රේණුවෙන් ආකුලවූ; පල, ව්‍යාප්තවූ; හෙල, ධවලවූ; වැලිතෙලේයා, පුලිනතල ඇත්තාවූ; මග බැස, මාර්ගයට අවතීර්ණව; යව, ගමනයකරව.

මුදුනෙහි පිපුනාවූ මල් ඇති මාලතීලතාගුම්බයෙන් හා; සමූහව ගලාඑන්නාවූ රාජහංසයන්ගෙන් යුත් මල් පිපි විල් ඇත්තාවූ සමීපයෙහි පිහිටි රුක්වලින් විගුළාවූ කුසුමකෙශරයෙන් ගැවසුනු පළිල් වැලිතලා ඇති මාර්ගයට බැස නොහොත් මාර්ග මතුභාගයෙන් ගමන්කරව.

30. අ සි රාවණ උවත් නවතන-රිසින් එ න
අ සි රාදහස් දිලි දුනු කොත් සිපත් ගෙ න
ක සි කාවලෙහි දැකැ සෙබඑන් රැකැ සිටි න
ව සි යාකරන් මල්තුරුගන වනහිසි න

30. එන, (විපක්ෂභාවයෙන් අභිමුඛව) එන්නාවූ; අසිරාවණ උවත්, ඓරාවණහස්තිරාජයාවීනමුත්; නවතන රිසින්, නිවාරණය කරන්නාවූ රුචියෙන්; අසිරාදහස්, සහස්‍රයෙන් අධිකවූ; දිලි දුනු කොත් සිපත්, ජ්වලිතවූ චාප කුන්ත ඛඩ්ගපත්‍රයන්; ගෙන, ග්‍රහණයකොට; කසිකාවලෙහි, කසිකාවල නම්වූ ආරක්ෂස්ථානයෙහි; රුකැ සිටින, ආරක්ෂාකොට සිටින්නාවූ; සෙබඑන්, සෙවාභටයන්; දැකැ, දර්ශනයකොට; මල්තුරුගන, පුෂ්පවෘක්ෂයෙන් සාන්ද්‍රවූ; වන හිසින, වනමස්තකයෙන්; වසි, ශීඝ්‍රව; යාකරන්, යාත්‍රාකර.

විරුද්ධව එන්නාවූ ඓරාවණයා නමුදු පසුබටකිරීමෙහි ආශා ඇතිව; දහසකිනුත් අධිකවූ දීප්තිමත් චාප කුන්ත කඩුපත් දරා ගෙන; කසිකාවල නම්වූ රැකවල්පලෙහි (සතුරන් වලකනුසඳහා) රැකසිටින මුරහේවායන් දැක; පුෂ්පවත් වෘක්ෂයන්ගෙන් ගැවසුනු වනය මතුභාගයෙන් වහා ගමන්කරව.

31. නි ම ල් සඳපහන් වැනි වැලිපිට උදු ල
සු පු ල් මල්යහන් ලියමඬු ලියගෙපෙ ල
එ ක ල් කෙළින වනදෙව්ලිය දකැ කොම ල
ල ස ල් රුකෙකැ සැතපෙව ලපලු සිහිල ල

31. නිමල්, නිර්මලවූ; සඳපහන් වැනි, චන්ද්‍රකාන්තිය හා සමානවූ; උදුල, උජ්ජ්වලිතවූ; වැලිපිට, වාලුකාසතලයෙහි; සුපුල්, සුපුෂ්පිතවූ; මල්යහන්, පුෂ්පසයනයෙහිද; ලියමඬු, (මාධවී ආදි) ලතාමණ්ඩපයෙහිද; ලියගෙපෙල, ලතාගෘහපන්ක්තියෙහිද; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; කොමල, කොමලවූ; වනදෙව්ලිය, වනදිව්‍යස්ත්‍රීන්; දකැ, දර්ශනයකොට; එකල්, ඒ (දිව්‍යාඞ්ගනාවන්ගේ මල්කෙළි දක්නා) කාලයෙහි; ලපලු, තරුණපල්ලවයෙන්; සිහිලල, ශීතලභාවය එළවූවාවූ; ලසල්රුකෙකැ, බාලසාලවෘක්‍ෂයෙක්හි; සැතපෙව, විශ්‍රාමය කරව.

නිර්මලවූ සඳපහන වැනි දීප්තිමත් වැලිතලා මතුයෙහිද; මනාව පිපුනාවූ කුසුමාසනයෙහි ,නොහොත් පිපුනු මල් නමැති ආසනයන්හිද, ලතාමණ්ඩපයන්හි හා ලතාගෘහ පඞ්ක්තිවලද ක්‍රීඩාකරනු ලබන්නාවූ කොමලවූ හෝ තරුණවූ වනදිව්‍යස්ත්‍රීන් දක, බාලපල්ලවයන් නිසා සිහිල්ගුණ එළවන්නාවූ තරුණ සල් රුකෙක්හි හිඳ එකල්හි විඩා දුරුකරව.

32. ම ල් ද ම් සුවඳදුම් දුන් සොඳ වරල සි නි
ක ල් ගි ම් නිවා සැනහෙන සිහිලසර සි නි
කොල්ල ම් ගසින් නිල්ඉවුරුති පොකුණ සි නි
ව ල් ල ම් බලම දක යාගන් සහතො සි නි

32. මල්දම්, (මහනෙල් දෑසමන් ආදි) පුෂ්පදාමයන් හා; සුවඳදුම්, (කාලාගුරුධූපාදිවූ) සුගන්ධධූපයන්; දුන්, දෙනලද්දාවූ; වරලසිනි, කෙශකලාපයෙන්; සොඳ, සුන්දරවූ; කල්, කාන්තාවන් විසින්; ගිම් නිවා, ග්‍රීෂ්ම නිර්වාපණයකොට; සැනහෙන, සනාතය කරනුලබන්නාවූ; සිහිලසරසිනි, සීතලජලයෙන් උපලක්‍ෂිතවූ; කොල්ලම්ගසින්, තමාලගච්ඡයන් කරණකොටගෙන; නිල්, නිලවර්ණවූ; ඉවුරුති, (උභය) කූලයන් ඇත්තාවූ; පොකුණසිනි, පුෂ්කරණී පාර්ශ්වයෙන් යුක්තවූ; වල්ලම්බලම, විල්ලම්බලම නම්වූ විශ්‍රාමශාලාව; දකැ, නිරීක්‍ෂණයකොට; සහතොසිනි, සන්තොෂසහිතව; යාගන්, යාත්‍රාග්‍රහණයකරන්.

කුසුමදමයන් ගැළපීමෙන් හා සුවඳදුම් ගැවසීමෙන් මනොඥවූ කොස්වැටියෙන් යුත් සතුන් විසින් සිහිල්ජලයෙන් ග්‍රීෂ්මය නිවා සන්තොෂකරන්නාවූ; කොල්ලම්ගස්වලින් නිල්පැහැවූ ඉවුරු ඇති පොකුණුපාර්ශවයෙන් යුක්තාවූ; වල්ලම්බලම නම් විශ්‍රාමශාලාව දැක සතුටුසහිතව ගමන්කරව.

33. කස්තුරිතිලක සැදි නළලත සුමු ටා න
පුල් රතුළුපුල් මල්දම් හිසැ දව ටා න
සලෙලුන් යනෙන නිති කරු කෙළිකව ටා න
රිවිමුදුනතෙහි වන මැද වදු සුමු ටා න

33. නළලත, ලලාටය; සුමුටාන, සුමෘෂ්ටවූ හෙවත් ඉතා සිලුටු ඇත්තාවූ; කස්තුරතිලක, කස්තුරිතිලකයෙන්; සැදි, අලඞ්කෘතවූ; පුල්, පිපුනාවූ; රතුළුපුල්මල්දම්, රක්තොත්පල පුෂ්ප දමයන්; හිසැ, ශීර්ෂයෙහි; දවටාන, වෙෂ්ටනයකළාවූ; සලෙලුන්, සල්ලාල යන්, නිති, නිරන්තරයෙන්; කෙළිකවටාන, ක්‍රීඩාපරිහාසයන්; කරු, කොට; යනෙන, ගමනාගමනය කරනලද්දාවූ; සුමුටාන වනමැද, සුමුටාන නම්වූ වනමධ්‍යයට; රිවිමුදුනතෙහි, මධ්‍යාහ්න කාලයෙහි; වදු, ප්‍රවිෂ්ටවව්.

කස්තුරි මිශ්‍රවූ තිලකයෙන් සරහනලද ඉතා මට්ටම්වූ නළල් තල ඇතිව; පුබුදුවූ රත්මහනෙල් මල්දම් හිසෙහි වෙළාගනිමින්; අන්‍යොන්‍යයන් හා ක්‍රීඩාපරිහාසකථා පවත්වමින් ගමනාගමනය කරන්නාවූ සල්ලාල ජනයන් ඇති; සුමුටාන නම් වනමධ්‍යයට හිරිමුදුන් වේලෙහි පැමිණෙව.

34. මග නිල මි න් සිටි නා දෙඹ නී පිය ල
පියසල මි න් මලගෙහි කෙළැ රොනිනව ල
තතුඹල මි න් බිඳැ විළිකුන් මියුරුප ල
ඉ සු ඹු ල මි න් යා සැළි දඹපඳුරුව ල

34. මග, මාර්ගයෙහි; නිලමින් සිටි, ශ්‍යාමයමානව පෙනෙමින් සිටියාවූ; නා, නාගවෘක්ෂය; දෙඹ, පුන්නාග වෘක්ෂය; නී, නීප වෘක්ෂය හෙවත් බක්මීවෘක්ෂය; පියල, පියාලවෘක්ෂය හෙවත් මොර වෘක්ෂය යන මේ වෘක්ෂයන්ගේ; රොනිනවල, පරාගයෙන් ගැවසී ගත්තාවූ; මලගෙහි, පුෂ්පාග්‍රයෙහි; පියසලමින්, පක්ෂචලනයකො රෙමින්; කෙළැ, ක්‍රීඩාකොට; විළිකුන් මියුරුපල, පරිනත මධුර ඵලයෙහි; තතුඹලමින්, තාගේ චඤ්චුක්ෂෙපනය කෙරෙමින්; බිඳැ,

හෙදකොට නොහොත් අනුභවකොට; දඹපඳුරුවල, ජම්බුවෘක්ෂ සමූහයන්හි; ඉසුඹුලමින්, විශ්‍රාමයකෙරෙමින් හෙවත් සැතපෙමින්; සැළි, ශාරිකාපක්ෂිය; යා, ගමනයකරන්නේසි.

නිල්පැහැයෙන් විද්‍යමානව මාර්ගයෙහි පිහිටියාවූ දෙඹිය බක්මීය මොරය යන වෘක්ෂයන්ගේ කේශරාකුලවූ පුෂ්පයන් මත්තෙහි පියා පත්සලමින් ක්‍රීඩාකොට; ජම්බුවෘක්ෂ ගුල්මයන්හි ඇති මධුරවූ ඉදුනු ඵලයන් තොපගේ තුඩ බැහ්මෙන් හෙදකොට හෝ අනුභවකොට ශාරිකාපක්ෂිය ගමන්විඩා දුරුකරගනිමින් යව.

35. රි වි තැ වු ලේ පිපි කමලේ විල් ගැව සි
මත කො වු ලේ තුරුවදලේ හඬන නි සි
ව න සැ වු ලේ මග අසලේ පොර සැල සි
ගු රු බැ වු ලේ යව අවුලේ නොවී කි සි

35. රවිතැවුලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපි කමලේ, පුෂ්පිත පද්මයන් ඇත්තාවූ; විල්, තටාකයෙන්; ගැවසි, සඞ්කීර්ණවූ; නිසි, සඤ්චරණයට යොග්‍යවූ; තුරු, (අම්‍රාදි) වෘක්ෂයන්ගේ; වදලේ, මුවාවෙහි; හඬන, නාදකරන්නාවූ හෙවත් රුව්පිළිරුව් පවත්වන්නාවූ; මතකොවුලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මගඅසලේ, මාර්ගාසන්නයෙහි; පොරසැලසී, යුද්ධප්‍රවෘත්තවූ; වනසැවුලේ, වලි කුකුළන් ඇත්තාවූ; ගුරුබැවුලේ, ගුරුබැවුල නම්වූ උන්නත ප්‍රදෙශයෙයි; කිසිඅවුලේ නොවී, ස්වල්පමාත්‍රවූද ආකූලයක් (බාධාවක්) නැතිව; යව, ප්‍රයාණය කරව.

හිරුරැසින් පුබුදුවූ නෙලුම් විල්වලින් ගහණවූ; හැසිරීමට සුදුසුවූ රුක්මුවාවෙහි නාද පවත්වන මල්පැණි බීමෙන් මත්වූ කෙවිල්ලන් ඇති; මාර්ගාසන්නයෙහි පොර ඇනගන්නාවූ වනකුකුළන්ගෙන් යුත්; ගුරුබැවුල නම්වූ ප්‍රදෙශයෙහි (පෙරකී වනකුක්කුටාදීන් නිසා) කිසියම් වියවුලක් නොමැතිව ගමන්කරව.

36. ව න සි රි පියුම්රා බඳ රනබරණ පු රු
ව ට පි රි සුපුල් දුනුකේ මල්මුරුතතු රු
බි ඟු පි රි වැරූ ඔලුපුලැඹුලවල තඹු රු
සි ම ස රි සිහිල් දියහෙබ දකැ යන් මිතු රු

36. වනසිරි, වනලක්ෂ්මියගේ; පියුම්රා බඳ, පද්මරාග මාණික්‍ය යන් බඳනාලද්දවූ; රනබරණ පුරු, ස්වර්ණාභරණ බඳුවූ; සුපුල් දුනුකේ, සුපුෂ්පිතවූ රාජකෙතකී වෘක්ෂයන් හා; මල්මුරුතතුරු,

පුෂ්පසහිත අශෝකවෘක්ෂයන්; වට, හාත්පස්හි; පිරි, සම්පූර්ණවූ; බිඟු පිරිවැරූ, භෘඞ්ගයන් විසින් පිරිවරනලද්දවූ; ඔලු, ශාලූක පුෂ්පයෙන්ද; උපුල්, උත්පලයෙන්ද; ඇඹුල්, කෛරවයෙන්ද; තඹුරු, තාමරසයෙන්ද; අවල, ගැවසීගත්තාවූ; හිමසරි සිහිල්දිය, හිම සමාන ශීතලවූ උදකයන් ඇත්තාවූ; හෙබ දුකැ, (මහා) හ්‍රදය දශීනයකොට; මිතුරු, මිත්‍රය; යන්, ප්‍රයාණයකරන්.

වන නමැති ශ්‍රීදෙවියගේ පද්මරාග මාණික්‍යයන් බඳනාලද ස්වර්ණාභරණ සෙයින් සුපුෂ්පිතවූ දුනුකේ හා මල්මුරුත වෘක්ෂයන් හාත්පස්හි පිරිසිපියාවූ; මීමැස්සන් විසින් පිරිවරාගත් ඔලු මානෙල් නෙලුම් යන පුෂ්පයන්ගෙන් ගහණවූ; තුෂාර මෙන් ශීතලවූ දිය ඇති හොය දුක මිත්‍රය ගමන්කරව.

37. ස ලා දු ලා පියයුරු තඹර රෙන් ර ත
පු ලා නි ලා උපුලන් ලාගෙනැ කන ත
ක ලා පි ලා නොවැ ඇල්ගෙවි කෙළිනා ඉ ත
බ ලා ප ලා යව අස්වන් ගුරුළුකෙ ත

37. දුලා, උජ්ජ්වලිතවූ; පියයුරු, පයොධරයන්හි; තඹර, තාමරසයන්ගේ; රතරෙන්, රක්තරේණූන්; සලා, විකීර්ණකොට; නිලා උපුලන්, නීලොත්පලයන්; පුලා, ප්‍රඵුල්ලකොට හෙවත් පෙතිවිදා; කනත, කර්ණාන්තයෙහි; ලාගෙනැ, වින්‍යාසකොටගෙන; කලාපිලා නොවැ, කලහපීඩාවක් නොවී; ඉත, අන්‍යොන්‍ය මිත්‍රභාවයෙන් උපලක්ෂිතව; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; ඇල්ගෙවි, ශාලිගොපිකාවන් ඇත්තාවූ; අස්වන්, අස්වැදී තිබෙන්නාවූ; ගුරුළුකෙත, ගුරුළුකෙත නම්වූ (ශාලි) ක්ෂෙත්‍රය; බලා, නිරීක්ෂණයකොට; පලායව, ප්‍රයාණය කරව.

(උසස්ව) බබලන්නාවූ පයොධරයන්හි රත්නෙලුම් රේණූන් වතුරාගෙන පිපුනු නිල්මහනෙල්මල් කර්ණාන්තයෙහි බහා පැලඳ ගෙන; අන්‍යොන්‍යයන් හා කලහකිරීම් ආදියෙන් පීඩාවට නොපැමිණී මිත්‍රභාවයෙන් යුක්තව ක්‍රීඩාකරන්නාවූ ශාලිගොපිකාවන් හෝ ක්ෂෙත්‍රසංරක්ෂණයෙහි නියුක්ත ස්ත්‍රීන් ඇති, අස්වැදී තිබෙන ගුරුළුකෙත නමැති කෙත බලා (ඒ) පසුකොට යව.

38. බ න් නේ මරාම්ණී දුල පබලු මුතුප ට
වැ න් නේ ගමඹු ගෙලෙ පලමල් කුමුකුව ට
ග න් නේ තසිත එබැවින් නොවැදූ කෙළියට
ය න් නේ වෙලඳගොඩ දුකැ මදකලක් සි ට

38. පල, (නීලවර්ණ රක්තවර්ණ) ඵලයන් හා; මල්, පුෂ්ප පාළි යෙන් යුක්තාවූ; කුමුකුවට, (පතුවගුළු) පුවක්වට; ගම්බු ගෙලෙ, ග්‍රාම නමැති ස්ත්‍රියගේ කණ්ඨයෙහි; බන්, බඳනාලද; නේ, අනේකවූ; මරම්ණි, මරකතමාණික්‍යයෙන්; උදුල, බබලන්නාවූ; පබලු මුතුපට වැන්නේ, ප්‍රවාල මිශ්‍රවූ මුක්තාකලාප වැන්නේය; එබැවින්, ඒ භාවයෙන්; තසිත ගන්නේ, තාගේ චිත්තග්‍රහණය කරන්නේය; (එහෙයින්) කෙළියට නොවැද, ක්‍රීඩාව පිණිස ප්‍රවිෂ්ටනොව; වෙලඳගොඩ, වෙලඳගොඩ නම්වූ ග්‍රාමය; දුකැ, දර්ශනයකොට; මදකලක් සිට, ස්වල්පකාලයක් අවස්ථානයකොට; යන්නේ, ගමනයකරන්නේසි.

ඉදුනු නොසිදුනු බොහෝ ඵල හා මල් ඇති පුවක්වට, ගම්වැසි ස්ත්‍රීන්ගේ කරෙහි බැඳි මරකතමාණික්‍ය හා ප්‍රවාල මිශ්‍රවූ මුක්තා හාරයන් සමානවූයේ, තොපසිත් පැහැරගනී; එහෙයින් ක්‍රීඩා පිණිස නොපැමිණ වෙලඳගොඩ නම් ග්‍රාමය දැක මදවේලා වක් නැවතී ගමන්කරනු.

39. අවට සුපිපි සපු දුනුකේ සල ලා න
හඬන තැනින්තැන විලිකුළු කිර ලා න
පැසී නැමී කරල් රත්හැල් සහ ලා න
වඩින මැනවි මහවෙල මැද වෙර ලා න

39. අවට, හාත්පස්හි හෙවත් ක්ෂෙත්‍රය වටකොට; සුපිපි, සුපුෂ්පිතවූ; සපු, චම්පකවෘක්ෂය; දුනුකේ, රාජකේතකීවෘක්ෂය; සලලාන, සලලවෘක්ෂය හෙවත් හොරගස (යනාදි වෘක්ෂයෙන්) යුක්තාවූ; තැනින්තැන, ඒ ඒ ස්ථානයෙහි; හඬන, නාදකරන්නාවූ හෙවත් රැව්පිළිරැව් දෙන්නාවූ; විලිකුළු කිරලාන, කාදම්බපක්ෂීන් හා කිරලපක්ෂීන් ඇත්තාවූ; පැසී, පරිණතභාවයට පැමිණ; නැමී, අග්‍රාවනතවූ; කරල්, ශස්‍යමඤ්ජරීන් ඇත්තාවූ; රත්හැල්, රක්ත ශාලියෙන්; සහලාන, යුක්තවූ; වෙරලාන, වෙරලාන නම්වූ; මහවෙල මැද, මහාක්ෂෙත්‍ර මධ්‍යයෙහි; වඩින මැනවි, ප්‍රයාණය කිරීම යහපත්වන්නේසි.

සුපුෂ්පිත පුෂ්පසහිතවූ සපුගස්ද, දුනුකේ හා හොරගස්ද හාත් පස පිහිටියාවූ; තැනින්තැන හඬන්නාවූ හෝ රැව්පිළිරැව් දෙන් නාවූ කාදම්බපක්ෂීන් හා කිරලපක්ෂීන් ඇත්තාවූ; පැසී නැමුනු කරල් සහිත රත්හැල් නම් ගොයම් ඇති; වෙරලාන නමැති මහවෙල මැදින් ගමන්කළ මැනවි.

40. ප ත් ගත පුල්මල් දෙඹතුරෙකැ පියක රු
සි ත් පිණවා ඉඳැ සැළලිහිණින් අතු රු
ග ත් සරතැස හැර විඳැ සුවඳමඳම රු
කි ත් සිරි මේ වෙහෙරට වදුව පස්ව රු

40. පත් ගත, පත්‍රයෙන් ඝනවූ; පුල්මල්, ප්‍රඵුල්ල පුෂ්පයෙන්; පියකරු, ප්‍රියකරවූ; දෙඹතුරෙකැ, පුන්නාග වෘක්ෂයෙක්හි; සැළලිහිණින් අතුරු, ශාරිකා පක්ෂීන්ගේ මධ්‍යයෙහි; ඉඳැ, නිෂන්න කොට; සිත් පිණවා, චිත්තප්‍රීතියට පමුණුවා; සුවඳ මඳමරු, සුගන්ධමන්දමාරුතය; විඳැ, ලබා; ගත් සරතැස, ගාත්‍රයෙහි ශ්‍රාන්ත භාවය; හැර, වර්ජිතකොට හෙවත් ගමන්විඩා දුරුකොට; පස්වරු, අපරාහ්නකාලයෙහි; කිත්සිරිමේ වෙහෙරට, කීර්තිශ්‍රී මෙඝ නම්වූ විහාරයට; වදු, ප්‍රවේශවව්.

ඝනවූ පත්‍රයන්ගෙන් හා පුබුදුවූ පුෂ්පයන්ගෙන්ද ප්‍රියඋපදවන් නාවූ දෙඹරුකෙක්හි—ශාරිකාපක්ෂීන් අතුරෙහි ඉඳ සුගන්ධවත් මඳසුළඟ ලබා ශරීරශ්‍රාන්තය දුරුකිරීමෙන් සිත්සතුටුකොටගෙන කීර්තිශ්‍රීමෙඝ නම් විහාරයට සවස්කාලයෙහි පැමිණෙව.

41. සොඳ මුනිරද පිඩුකළ යස මෙරද ස ම
පු ද කළ ඔහු නෙත් නිල්කැලුමෙව් බැර ම
ස ඳ සුරු සඳවෙල රැඳි රුසිරි මනර ම
ව ඳ නෙහි තෝ දගැප් මහබෝ පිළි ම

41. එහි, ඒ විහාරයෙහි; සොඳ, සුන්දරවූ; මුනිරද, සර්වඥ රාජෝත්තමයානන්වහන්සේගේ; පිඩුකළ, පිණ්ඩීකෘතවූ හෙවත් කැටිකරනලද්දාවූ; යසමෙරද සම, යශෝමරීචි හා සමානවූද; ඔහු, ඒ සර්වඥයන්වහන්සේ විසින්; පුදකළ; පූජාකරනලද්දාවූ; බැරම, බොහෝවූ; නෙත්, නෙත්‍රයන්ගේ; නිල්කැලුමෙව්, නීල කාන්තියක් හා සමානවූද; සඳවෙල රැඳි, සන්ධ්‍යාවලාහකයෙන් රඤ්ජිතවූ; සඳ සුරු, චන්ද්‍රබිම්බය බඳුවූ; මනරම, මනොඥවූ; රුසිරි, රූපශ්‍රී ඇත්තාවූද; දගැප් මහබෝපිළිම, (යථාක්‍රමයෙන්) ධාතුගර්භයද මහාබෝධීන්වහන්සේද ප්‍රතිමාරූපයද; තෝ වඳ නෙහි, තෝ නමස්කාරකරන්නෙහිය.

යහපත්වූ බුදුරජානන්වහන්සේ විසින් ඒ විහාරයෙහි කැටි කරනලද කීර්තිමරීචි හා සමානවූද, ඒ බුදුරජානන්වහන්සේ විසින් පූර්වජන්මාන්තරයෙහි ත්‍යාගකරනලද බොහෝවූ නෙත්‍රයන්

සම්බන්ධ නිල්පැහැය මෙන්ද සන්ධ්‍යාවලා මධ්‍යයෙහි බබලන චන්ද්‍රයා මෙන්ද; ඒ විහාරයෙහි පිහිටි ධාතුගර්භයද මහාබෝධිය හා මනොඥවූ රූපශ්‍රීන් යුත් බුද්ධප්‍රතිමාරූපයද වැඳගනුව.

42. ස ල් සපු කිණ දෙඹ රැරඟ නා මිදෙ ලි
පු ල් එරහැදි හෝ පලු මීඅඹ පලො ලි
පොල් පුවකිගු රඹ මලබුලතී සලිම ලී
නි ල් ගනසා සෙවණලු දෙතොර මනක ලී

42. සල්, සාලවෘක්ෂය; සපු, චම්පකවෘක්ෂය; කිණ, කිණ වෘක්ෂය; දෙඹ, පුන්නාගවෘක්ෂය; රැරඟ, ඖෂධීවෘක්ෂය; නා, නාග වෘක්ෂය; මිදෙලි, නිචුලවෘක්ෂය; පුල්, ඵුල්ලවූ; එරහැදි, කෘතමාල වෘක්ෂය; හෝ, අශෝකවෘක්ෂය; පලු, පීලුවෘක්ෂය; මීඅඹ, සහකාර වෘක්ෂය; පලොලි, පාටලීවෘක්ෂය; පොල්, නාලිකේර වෘක්ෂය; පුවක්, පූගවෘක්ෂය; ඉගු, ඉක්ෂුවනය; රඹ, රම්භාවෘක්ෂය යන මොවුන්ගේ; නිල්, නීලවර්ණවූ; ගන, ඝනවූ; සා, ශාඛාවන්ගේ; සෙවණලු, ඡායාකුලත්වයෙන්; මනකලී, මනොඥවූ; දෙතොර, උභයතීරයෙහි:—(කුලක හෙයින් මෙහි දෙතොර යනු මත්තෙහි තුන්වෙනි කවියෙහි ලවැලිපිට ඉඳෑ, යන තැනට සම්බන්ධයි).

සල්ය සපුය කිණය දෙඹය රැරඟය නාය මිදෙල්ලය පිපුනු එරහැදිය හෝය පලුය මීඅඹය පලොල්ය පොල්ය පුවක්ය උක්ය කෙසෙල්ය මලබුලත් හා ඉඹුල්ය යන මොවුන්ගේ ඡායාකුල හෙතුවෙන් මනොහරවූ උභයතීරයෙහි:

43. ගවසා සුපුල් කඩුපුල්මල් නිල්වර ල
සලසා උකුළ වට රසුදුල මිණිමෙවු ල
සකසා දෙතන හරසඳුනෙන් කරා සිසි ල
දෙපසා ඉසින නිල්පැහැ නෙත් දිගුපුළු ල

43. නිල්වරල, නීලධම්මිල්ලයෙහි; සුපුල්, සුප්‍රඵුල්ලවූ; කඩු පුල්මල්, කණ්ඩොපලපුෂ්පයන්; ගවසා, සිඳුරු නොපෙනෙන පරිද්දෙන් පුරාපැළඳ; රසුදුල, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; මිණි මෙවුල, මාණික්‍යමෙඛලාදාමය; උකුළ වට, ජඝනය හාත්පස; සලසා, යොජිතකොට; දෙතන, පයොධරයුග්මය; හරසඳුනෙන්, මුක්තාහාරයෙන් හා (ගොශීර්ෂ) චන්දනයෙන්; සකසා, ඝනපත්ව;

සිසිලකරු, ශීතලභාවයට පමුණුවා; දිගුපුළුල නෙත්, අයතවිශාල නෙත්‍රයෙහි; නිල්පැහැ, නීලකාන්තිය; දෙපසා, උභයපාර්ශ්ව යෙහි; ඉසින, සේචනයකරන්නාවූ:

මනාව පිපුනු කඩුපුල්මලින් නිල්වන්වූ කෙස්වැටිය ගවසාගෙන කිකිණි යෙදූ මැණික්මෙවුල් උකුල වට බැඳගෙන, මුතුවැල් එල්ලීමෙන් හා සඳුන්කලල් ගැල්වීමෙන් පයොධරයුග්මය අලංකාරකොට, දික්වූ නෙත්‍රයන්ගේ ප්‍රභාව හෝ බැල්ම උභයපාර්ශ්ව යෙහි ඉසින්නාවූ:

44. ම න හර නාමෙණෙවියනිඳැ ලවැලිපි ට
ගෙන මිණිවෙණ තත් නියගින් මැදූ රුව ට
ක න හෙවැ ගයන බුදුගුණ ගී මියුරුකො ට
සැ න හෙව කැලණිගඟබඩ මදකලක් සි ට

44. මනහර, මනොඥවූ; නාමෙණෙවියන්, නාගමාණවිකාවන් විසින්; ලවැලි පිට, (ගංවතුරෙන් ගොඩදමනලද්දාවූ නොහොත් ගංගාප්‍රවාහයෙන් අමුතුව රැස්කරනලද) අළුත්වැලිතලා මතු යෙහි; ඉඳැ, නිෂන්නකොට; මිණිවෙණ, මාණික්‍යයෙන් අලංකෘතවූ වීණාව; ගෙනා, ග්‍රහණයකොට; තත්, තන්ත්‍රි (පතහින්); නියගින්, නඛාග්‍රයෙන්; රුවට, (ඝවරොත්පාදනය පිණිස) මනොඥව; මැදූ, මර්දනයකොට; මියුරුකොට, මධුරකොට; ගයන, ගායනාකරනු ලබන්නාවූ; බුදුගුණගී, බුඩගුණ (ප්‍රතිසංයුක්ත) ගීතිකාවන්; කන හෙවැ, කණියෙහි බහා හෙවත් අසා; කැලණිගඟබඩ, කල්‍යාණිගංගා සමීපයෙහි; මදකලක් සිට, ස්වල්ප කාලයක් අවස්ථානයකොට; සැනහෙව, (මාර්ගශ්‍රම දුරුකොට) සන්තර්පණයට පැමිණෙව.

ගංවතුරෙන් රැස්වනලද මනොඥවූ අළුත්වැලිතලා මතුයෙහි හිඳගෙන නාගමාණවිකාවන් විසින් මැණික්මය වීණාවන් හැර ගෙන නියඇගිලින් හෝ ඇඟිලිඇගිින් යහපත්සේ තන්ත්‍රීන් මැද මධුරකොට ගායනාකරන්නාවූ බුඩගුණ සම්බන්ධ ගීතිකාවන් අසා ගෙන කැලණිගංඉවුරෙහි මදකලක් නැවතී විඩා හරුව.

45. ස පු ම ල් යොහොබු ලා බැඳැ වරල මනර ග
පැ හැ දු ල් දෙඹකැකුළු හරකර ලා තන ග
රෙන වු ල් නාකුසුම් කන ලා කොඬොල් ර ග
ද හ ව ල් උයන්කෙළි කෙළෑ සලෙලුන් සම ග

45. සපුමල් යොහොඹු, චම්පකපුෂ්ප මාධවීපුෂ්පයන්; ලා, බහා; වරල, කෙශකලාපය; මනරඟ, සිත්වූ පරිද්දෙන්; බැඳ, බන්ධනය කොට; පැහැදුල්, ප්‍රභාවෙන් උජ්ජ්වලිතවූ; දෙඹකැකුළු, පුන්නාගමුකුළයන්; තනග, පයොධරාග්‍රයෙහි; හරකර ලා, මුක්තාහාර කොට (පැලඳ); රෙනවුල්, (ස්වර්ණවර්ණවූ) පුෂ්පරේණුවෙන් ගැවසීගත්තාවූ; නාකුසුම්, නාගපුෂ්පයන්; කොඬොල් රඟ, කුණ්ඩලාභරණ පරිද්දෙන්; කනලා, කර්ණයෙහි ප්‍රසාධනයකොට; සලෙලුන් සමග, කාමීතරුණ පුරුෂයන් හා සමග; දහවල්, දිවාභාගයෙහි; උයන්කෙළි කෙළී, උද්‍යානක්‍රීඩා කොට:

සපුමල් හා යොහොඹුමල් බහා සිත්වූ පරිද්දෙන් කෙස්වැටි බැඳගෙන; පැහැපත්වූ දෙඹමල් කැකුළු තනමතුයෙහි මුතුවැල් සේ බහාගෙන; රේණුවෙන් ගැවසිගත් නාගපුෂ්පයන් කුණ්ඩලාභරණ සෙයින් කන්හි බහා පැලඳගෙන; දිවාභාගයෙහි තරුණ ජනයන් හා උද්‍යානයන්හි ක්‍රීඩාකොට:

46. නු ව නි න් නිල් උපුල් මඳහසිනි හෙළැඹු ල
උ ව නි න් කමල් පෑ ලවනතිනි රතුපු ල
ප ව නි න් අඹිල රනලිය වන් ලියන්කැ ල
රු ව නි න් ලකළ ගහදිය කෙළී නිමුණු ක ල

46. නුවනින්, නෙත්‍රයෙන්; නිල්උපුල්, නීලොත්පලයන්ද; මඳහසිනි, මන්දහාස්‍යයෙන්; හෙළැඹුල, කුමුදයන්ද; උවනින්, වක්‍ත්‍රයෙන්; කමල්, පද්මයන්ද; ලවනතිනි, අධරයෙන්; රතුපුල, රක්තොත්පලයන්ද; පෑ, (ගංගාජලයෙහි) දක්වා; පවනින්, මාරුතයෙන්; අඹිල, ආවෘතවූ; රනලිය වන්, ස්වර්ණලතාවන් හා සදෘශවූ; ලියන්කැල, කාන්තා සමූහය; රුවනින් ලකළ, රත්නයෙන් අලඞ්කෘතවූ; ගහදිය කෙළී, ගඞ්ගාජලයෙහි ක්‍රීඩාකොට; නිමුණු කල, සමාප්තවූ කාලයෙහි:

නෙත්‍රවලින් නිල්මහනෙල් මල්ද, මඳසිනාවෙන් කුමුදුමල්ද, මුහුණින් නෙලුම්මල්ද, දෙතොලින් රත්මහනෙල් මල්ද දක්ව, සුළඟින් ඇඹරී සිටි රත්රන්වැල් වැනි ස්ත්‍රීසමූහයා මැණික්වලින් අලඞ්කාරවූ ගඞ්ගාජලයෙහි ක්‍රීඩාකොට නිමවූ පසු:

47. ව දි මි න් සවසනල හැසිරෙන දිගතුව ල
සොබමන් සුනිල් මිණි නිල් තුඹතුරු විපු ල
ප ත ස න් අවරගිර නැපිසෙන් වැටෙනක ල
ඊ ලි කු න් සුරත් පල වැනි වේ රවිමඬ ල

**47.** දිගතුවල, (මේඝසමූහ නමැති නීලවර්ණවූ පත්‍රයන් ඇති සන්ධ්‍යාවලාහක නමැති අභිනව පල්ලවයන් ඇති) දිශා නමැති ශාඛාවන්හි; වදිමින්, ප්‍රවිෂ්ටවෙමින්; හැසිරෙන, සඤ්චරණයක රන්නාවූ; සවසහල, සායන්හම්ාරූත ඇත්තාවූ; සොබමන්, ශොභමානවූ; සුනිල් මිණිනිල්, යහපත්වූ ඉන්‍ද්‍රනීලමාණික්‍යයන් මෙන් නිල්වූ; විපුල, මහත්වූ; නුබතුරු, ආකාශ නමැති වෘක්‍ෂයෙහි; අවර ගිර, අපරපර්වත නමැති; නැටියෙන්, වෘන්තයෙන්; වැටෙනකල, (සමුද්‍රයෙහි) වැටෙන්නාවූ කල; අසන්පත්, ආසන්නප්‍රාප්තවූ; රිවිමඬල, සූර්‍ය්‍යමණ්ඩලයතෙම; විලිකුන් සුරත්, පක්වාතිරක්ත වර්ණවූ; පල වැනි වේ, ඵලයක් හා සමානවන්නේය.

දිශා නමැති ශාඛාවන්හි ගැහැටෙමින් සවස්කාලයෙහි සුලඟ හැසිරෙන්නාවූ; ශොභාමත්වූ ඉඳුනිල්මැණික් මෙන් නිල්වූ ආකාශ නමැති මහාවෘක්‍ෂයෙහි, අවරගිරි නමැති නටුවෙන් වැටෙන කල්හි—සාගරාසන්නවූ සූර්‍ය්‍යමණ්ඩලය ඉදුනාවූ ඉතා රතු ඵලයක් සේ පෙනෙයි.

48 ම හ තු න් හසළ තමහට යස පිහිටලෙ ස
නිය ති න් නොහළ යුතුබව පැමිණෙන වෙහෙ ස
සු ද න න් පැවති සිරිතැයි දන්වන විල ස
නුබ මි න් සමග ගෙවෙනුය දහවල් දව ස

48. තමහට යස පිහිටලෙස, තමාහට යහපත්වූ ප්‍රතිෂ්ඨාවිලාසයකින්; හසළ, සඤ්චරිතවූ; මහතුන්, මහාත්මයන්ට; වෙහෙස පැමිණෙන, හිංසාවක් පැමිණෙන කල්හි; නියතින්, ඒකාන්තයෙන්; නොහළයුතු බව, පරිත්‍යාගනොකටයුතු බව; සුදනන්, සත්පුරුෂයන් විසින්; පැවති සිරිතැයි, ප්‍රවෘත්තවූ චාරිත්‍රයකැයි; දන්වන විලස, විඥාපනය කරන්නාවූ විලාසයෙන්; නුබමින් සමග, සූර්‍ය්‍ය මණ්ඩලය හා එක්ව; දහවල් දවස, දිවාභාගයද; ගෙවෙනුය, ක්‍ෂයවන්නේය.

තමාගේ ශුභසිද්ධිය පිණිස පිහිටාධාර ඇතිව හැසිරෙන්නාවූ උත්තමයින්ට, පීඩාවක් පැමිණෙනකල්හි ඒකාන්තයෙන් අත් නොහැරීම සත්පුරුෂයන්ගේ පරම්පරාගත සිරිතක්යයි දන් වන්නාක් මෙන්, සූර්‍ය්‍යයාගේ බැසයාම හා එක්ව දිවාභාගයද ක්‍ෂයවන්නේය.

49. සැ ඳූ ලෙන් වරුණදෙව්රද මුහුදු වි සූ
සැ ඳූ සහසකර එන මහවත සැල සූ
වි ඳූ උපුල් පිල මෙන් රත්පටින් වැ සූ
සැ ඳෑ වලාපෙළ පැලදිගැ පෙතුනු ප සූ

49. මුහුදු විසූ, සමුද්‍රයෙහි වාසයකළාවූ; සැඳූ, (දෙවජාති වංශයෙන්) සමාන ජාති ඇත්තාවූ; වරුණදෙව්රද, වරුණදෙවරාජයා විසින්; සැඳූලෙන්, ශ්‍රද්ධාචිත්තයෙන්; සහසකර, සහස්‍රකිරණයා; එන, (තමාගේ වාසභවනයට) එන්නාවූ; මහවත, මහා පථයෙහි; සැලසූ, යොජනයකරන ලද්දාවූ; රත්පටින් වැසූ, රක්තවස්ත්‍රයෙන් ඡාදනයකරන ලද්දාවූ; විඳූඋපුල්පිල මෙන්, කුරුවින්දපාෂාණයෙන් බඳවූ වෙදිකාවක් මෙන්; සැඳෑ වලාපෙළ, සන්ධ්‍යාවලාහක පන්තිය; පැලදිගැ, පශ්චිමදිශාවෙහි; පෙතුනුපසු, දෘශ්‍යමානවූවාට පශ්චාත් කාලයෙහි:

එම සූර්‍ය්‍යදිව්‍යරාජයාහට සමානගොත්‍ර ඇති, සාගරයෙහි වාසයකළාවූ වරුණ නම් දෙවියා විසින්, තමන්කෙරෙහි සූර්‍ය්‍යයා එන මහා මාර්‍ගයෙහි තනනලද, රක්තවර්‍ණ පටපිළියෙන් වැසූ කුරුවින්ද පාෂාණමය පිළික් නොහොත් හිඳගන්නා අස්නක් මෙන් සවස් කාලයෙහි වලාපඞ්ක්තිය බටහිරදික්හි පෙනුනු ඉක්බිතිව.

50. උ දු ළු සොම්කැලුම් නිසයුරුහිමි පුව ළු
ප හ ළු වන බැවින් තමවෙත නිසඹු දෙ ළු
ල ක ළු ගුවන්තල සිරියහනැ නිකස ළු
අ තු ළු කුසුම් විලසින් සැදෙත තුරුවැ ළු

50. උදුළු, උජ්ජ්වලිතවූ; සොම්කැලුම්, සෞම්‍යකාන්ති ඇත්තාවූ; පුවළු, ප්‍රෞඪවූ; නිසයුරු, නිශාකර නමැති; හිමි, වල්ලභයා; තමවෙත, ආශ්‍රමසමීපයට; පහළුවන බැවින්, ප්‍රකාශවනබව හෙතුකොටගෙන; දෙළු, සාභිලාෂීවූ; නිසඹු, නිශාඞ්ගනාව විසින්; නිකසළු, (අභ්‍රමහිකාදීන්ගේ අභාවයෙන්) කසළු රහිතවූ; ලකළු, මනොඥවූ; ගුවන්තල සිරියහනැ, ගගනතල නමැති ශ්‍රීශයනයෙහි; අතුළු, ආස්තරණයකරනලද්දාවූ; කුසුම් විලසින්, පුෂ්ප විලාසයෙන්; තුරුවැළු, තාරකාවලින්; සැදෙත, සැදෙන කල්හි:

උසස්ව බබලන සෞම්‍යකාන්තියෙන් යුත් පුරහඳ නමැති ස්වාමියා තමාකෙරෙහි පැමිණෙන හෙයින් ලොල්වූ රාත්‍රි නමැති ස්ත්‍රිය විසින් නිර්මලවූ අහස්තල නමැති අලඞ්කෘත ශ්‍රී ශයනයෙහි අතුරනලද මල්රැසින් මෙන් තාරකාපඞ්ක්තිය බබලන කල්හි:

51. ද න කැ න් ගෙනැ දමන ගොදුරට නොහැකිළි ය
ප නි මි න් දියෙන් ඔබුනොවුතැනෙහි පෙර ළි ය
ලෙහෙ ලු න් කෙළින කරු පෙණපිඬු රළරැ ළි ය
එ ත නි න් පියාසරකරු දකු මස්කෙ ළි ය

51. එතනින්, ඒ (පළමුවෙන් සිටියාවූ කැලණිගඟබඩ යන ස්ථානයෙන්; පියාසරකරු, පක්ෂප්‍රසාරණයකොට; දනකැන්, ජන සමූහයා විසින්; ගෙනැ, ග්‍රහණයකොට (අවුත්); දමන, ක්ෂෙපණය කරන්නාවූ; ගොදුරට, ආහාරයට; නොහැකිළිය, සංකුචිතනොව; දියෙන්, (නදී) ජලයෙන්; පනිමින්, උල්ලඞ්ඝනය කරමින්; ඔබු නොවුතැනෙහි, අන්‍යොන්‍ය ශරීරයෙහි; පෙරළිය, පරිවෘතව; පෙණපිඬු, ඩිණ්ඩිරපිණ්ඩයන්ද; රළරැළිය, තරඞ්ගභඞ්ගයන්ද; කරු, (ප්‍රවර්තනය) කොට; ලෙහෙලුන්, රොහිත මත්ස්‍යයන් විසින්; කෙළින, ක්‍රීඩාකරනු ලබන්නාවූ; මස්කෙළිය, මස්කෙළිය නම්වූ නදීතීර්ථය; දකු, දර්ශනයකර.

ඒ පළමු තොප නැවතිසිටි කැලණිගංඉවුරෙන් පිටත්ව ගොස් ජනසමූහයා විසින් දියෙන්නගා ආහාරපිණ්ඩ ගොඩදමන නමුත් ඊට පැකිලිමක් නොමැතිව එකිනෙකා ශරීරයෙහි ගැහැටෙමින් දියෙන් උඩට පනිමින් පෙණපිඬු හා රළයෙන් රළද නගමින් ක්‍රීඩාකරන්නාවූ රොහිත නම් මසුන්ඇති, මස්කෙළිය නම් නදීප්‍රදෙශය බලව.

52. පැහැස ර ණී ය මිණි පැමි ණී ය කොත් අග ට
බ ඳ කි කි ණී ය ද ද ගි හි ණී ය විමන් ව ට
නොවපැර ණී ය වන රම ණී ය විපින් වි ට
සැළි ලි හි ණී ය වදු කැල ණී ය පුරවර ට

52. කොත් අගට, ශෘඞ්ගාග්‍රයට; පැමිණිය, ප්‍රාප්තවූ; පැහැසරණිය, රශ්මිපඞ්ක්තියෙන් යුක්තවූ; මිණි, මාණික්‍ය ඇත්තාවූ; බඳ කිකිණිය, බඳනාලද කිංකිණික (ජාලාවෙන්) යුක්තවූ; දද ගිහිණිය, ධ්වජයෙන් ගහණවූ; වට, හාත්පස්හි; විමන්, ප්‍රාසාද යන් ඇත්තාවූ; නොවැ පැරණිය, පුරාණභාවයට නොපැමිණ; විපින්විට, ක්ෂණක්ෂණයෙහි; රමණිය වන, මනොඥ වන්නාවූ; කැලණියපුරවරට, කල්‍යාණි නම් පුරප්‍රවරයට; සැළලිහිණිය, ශාරිකාපක්ෂිරාජය; වදු, ප්‍රවිෂ්ටවෙව.

කොත් අගට පැමිණි රශ්මිපඞ්ක්තියෙන් යුත් මැණික් ඇති, නොහොත් කොත්අග බඳිනලද ප්‍රභාමත් මැණික් ඇති, විමානයන් හාත්පස යෙදූ කුඩා මිණිගෙඩි බැඳි ධ්වජයන්ගෙන් යුත්, පුරාණ භාවයක් නොමැතිව ක්ෂණයෙන් ක්ෂණයෙහි රම්‍යවන්නාවූ ස්වභාව ඇති, කැලණිය නම් උතුම් පුරයට ශාරිකාපක්ෂිරාජය පැමිණෙව.

53. දි ය ක ඳ ගැඹර පිරි පුවතර මහසයු ර
මු ව ර ද ලෙසින් වත අගතිසි කරතඹ ර
ම න න ද කරන මිණිගණ මෙන් දිසි එව ර
පැහැ න ද පහන් එහි මහවේ බල මිතු ර

53. ගැඹර, ගම්භීරවූ; දියකඳ, ජලස්කන්ධයෙන්; පිරි, සම්පූර්ණවූ; පුවතර, (ජගත්) ප්‍රසිද්ධවූ; මහසයුර, මහාසාගරය; අගතිසි, අගස්ත්‍යමහාඍෂිහුගේ; කරතඹර, හස්තතාමරසයෙහි; මුවරද ලෙසින්, පුෂ්පරසයක් මෙන්; වත, වනකල්හි හෙවත් සියලු සමුද්‍රජලය හස්තපුටයෙන් ගත් කල්හි; දිසි, දෘශ්‍යමානවූ; මනනද කරන, මනොනන්දනය කරන්නාවූ; මිණිගණ මෙන්, රත්නසමූහය මෙන්; එවර, ඒ කාලයෙහි හෙවත් තරු පෙනෙන වේලෙහි; එහි, ඒ කල්‍යාණි පුරප්‍රවරයෙහි; මහවේ, මහාවීථියෙහි; පැහැනද, ප්‍රභාවෙන් ආර්ද්‍රවූ හෙවත් ස්නිග්ධප්‍රභා ඇති; පහන්, ප්‍රදීපයන්; මිතුර, මිත්‍රය; බල, නිරීක්ෂණයකරව.

ප්‍රසිද්ධවූ හෝ පතලාවූ ගැඹුරු මහමුහුදෙහි ජලරාශිය අගස්ත්‍ය ඍෂියාගේ දෙහොත් නමැති නෙළුම්මලෙහි මල්පැණි මෙන් වූකල්හි හෙවත් අගස්ත්‍යඍෂියා විසින් සියලුසාගරජලය දෙහොතින් ගත්කල්හි මුහුදු පත්ලෙහි පෙනුනාවූ සිත් සතුටුකරන මැණික් රාශීනු මෙන්, ඒ කැලණිනුවර මහාවීථියෙහි බබලන දීප්තිමත් පහන් සමූහය මිත්‍රයා විසින් ඒ කාලයෙහි බැලියයුතු.

54. උ ද ය ග පියුම්රා පැහැ වැදූ මෙන් රුදු නු
පෙ ර දි ග පෙනෙන සඳ සඳකැල්මෙන් දිලු නු
ම න ර ඟ එපුර සඳකතගෙහඹින් වැඩු නු
සු ර ග ඟ පතිනිදම් රුකුමෙහි වැනි දුසු නු

54. උදයග, උදයපර්වතශිඛරයෙහි; පියුම්රාපැහැ, පද්මරාග මාණික්‍යප්‍රභාව; වැදූ, ස්පර්ශවූ; රුදුනු මෙන්, රඤ්ජිතවූවාක් මෙන්; සඳකැල්මෙන්, සන්ධ්‍යාකාන්තියෙන්; දිලුනු, ජ්වලිතවූ; සඳ, චන්ද්‍රයා;

පෙරදිග, පූර්වදිග්භාගයෙහි; පෙනෙන, දෘශ්‍යමානවන කල්හි. එපුර, ඒ පුරයෙහි; මනරම, මනොඥවූ; සඳකතගෙහි, චන්ද්‍රකාන්ත පාෂාණයෙන් නිර්මිතවූ ගෘහයෙහි; අඹින් වැඩුනු, ජලය කරණකොටගෙන වර්ධිතවූ; සුරගඟ, ආකාශගංගාතොමෝ; පතිනිදම් රැකුමෙහි, පතිව්‍රතාධර්මය රක්‍ෂාකිරීමෙහි; දූපුනු වැනි, තත්පරවූවාක් වැන්න.

උදයපර්වතයෙහි ඇති පද්මරාග මාණික්‍යයන්ගේ ආලොකය වැදී බබලන්නාක් මෙන්, සන්ධ්‍යාකාලයෙහිවූ රත්වලාකාන්තියෙන් බබලන චන්ද්‍රයා පූර්වදිශාවෙහි පෙනෙනකල්හි නොහොත් චන්ද්‍රයා උදාවූකල්හි, මනොහරවූ ඒ කැලණීපුරයෙහි චන්ද්‍රකාන්ත පාෂාණමය ගෘහයන්ගෙන් වැගිරෙන ජලයෙන් පිරුනාවූ ආකාශගඞ්ගාව පතිව්‍රතාධර්ම රක්‍ෂාකිරීමෙහි ඇලුනාක් මෙනි.

පතිව්‍රතාධර්මයෙහි පිහිටි අඹුසැමියෝ වනාහි ඔවුනොවුන් කෙරෙහි පවත්නා සුවදුක් දෙක්හිම සහභාගිව පවත්නාහුයි, එනම් පුරුෂයා කෙරෙහි පැමිණි සම්පත්ති විපත්ති දෙක්හි විපාක ස්ත්‍රීකෙරෙහිද පැමිණෙයි, එසෙයින්ම ස්ත්‍රීකෙරෙහි පැමිණි සැපදුක් දෙක්හි විපාක පුරුෂයා කෙරෙහිද පැමිණෙයි; මෙහිදී සාගරයට සඳපහන වැටීමෙන් වඩදිය ලැබීමද, එම චන්ද්‍රරශ්මි වැදීමෙන් කැලණීනුවර ඇති පලිඟුගලින් බැඳි ගෘහයන්ගෙන් වැහුනාවූ ජලයෙන් අහස්ගඟ පිරීමද එකවිට සිදුවිය. එහෙයින් ගංගා වල්ලභවූ සාගරය හා අහස්ගඟද යන දෙදෙනා පතිනිදම් රකින්නන් මෙන් වූහ. ප්‍රාසාදයන්ගෙන් වැහෙන ජලධාරාවෙන් අහස්ගඟ පිරුණේයයි කීමෙන්, කැලණීපුරයෙහි ප්‍රාසාදයෝ කෛලාසගංගාවටත් වඩා උස්බැව් උත්ප්‍රෙක්‍ෂාකළහ.

55. සු නි ල් වලා නවසඳ නිලුපුල් පබ ලූ
වි ම ල් සක් ගිජිඳුකුඹු සිරිවැස බැබ ලූ
වි පු ල් පුලින රඹ සිකිගෙළි මුතු ලද ලූ
ල ක ල් රනලියන් සරනා බල යහ ලූ

55. සුනිල් වලා, අතිනීල වලාහකය; නවසඳ, අභිනව චන්ද්‍රයාය; නිලුපුල්, නීලොත්පලය; පබලු, ප්‍රවාලය; විමල්, නිර්මලවූ; සක්, සඞ්ඛය; ගිජිඳුකුඹු, ගජරාජකුම්භය; බැබලු, භ්‍රාජිතවූ; සිරිවැස, ශ්‍රීවත්සය; විපුල්, මහත්වූ; පුලින, වාලුකාස්ථලය; රඹ, කදලි (ස්කන්ධ)ය; සිකිගෙළි, මයූරකණ්ඨය; මුතු, මුක්තාඵලය;

ලදලු, බාලපල්ලවය (යන මෙයින්); ලකල්, අලඞ්කෘතව; සරනා, සංවරණය කරන්නාවූ; රනලියන්, සුවර්ණලතාවන්; යහලු මිත්‍රය; බල, දර්ශනයකර.

ඉතා නිල් වලාකුල්ය, අළුත්හදය, නිල්මහනෙල්මල්ය, පබළුය නොකිලුටුවූ හක්ගෙඩිය, හස්තිකුම්භය, උඩැක්කිය, දීප්තිමත්වූ විශාල වැලිතලාය, කෙසෙල්ගස්ය, මයූරග්‍රීවය, මුතුය, ලාදලුය යන මෙයින් අලඞ්කාර වහැසිරෙන්නාවූ සුවර්ණලතාවන් මිත්‍රොත්තමය බලව.

මෙහි, නිල්වලාවලින් කෙස්වැටිද; අභිනව චන්ද්‍රයාගෙන් මුහුණද; නිල්මහනෙල්මලින් ඇස්ද; පබළුවලින් තොල්ද; හස්තිකුම්භයෙන් උස්ව සිටි පයොධරයන්ද; උඩැක්කිවලින් සිහින්වූ ඉනපිද; වැලි තලායෙන් පලල්වූ උකුළද; කෙසෙල්ගසින් පුෂ්ටිමත් කලවාද; මයූරග්‍රීවයෙන් (ක්‍රමයෙන්) සිහින්වූ කෙණ්ඩාද; මුතුවලින් දත්ද; ලාදලුවලින් (රක්තවර්ණවූ) ඇඟිලිද යන, කැලණිනුවරවාසී ස්ත්‍රීන් සම්බන්ධවූ ශරීර අවයවයන් වර්ණනාකළහ.

56. ඔ ද වැඩි කෙළිමගුල් ලැබ තුටු නිසාක ල
ස ඳ සක්මදෙසිනැදූ දෙත දුනුකැන් දුහු ල
සොඳ පුර අහන පහ සමුගින් පැහැ උදු ල
සෙ ද දුනි අඹර මතු ඇය රැස් මිණිමෙවු ල

56. ඔදවැඩි, ඔජාභිවෘද්ධිවූ; කෙළිමගුල් ලැබ, (ඒ පුරාඞ්ගනාවන් විසින් පමුණුවනලද රාත්‍රිභාගයට යොග්‍යවූ මධුපාන රතාත්සවාදි) ක්‍රීඩාමඞ්ගල්‍යයට ප්‍රාප්තව; තුටු, සන්තුෂ්ටවූ; නිසාකල, නිශා නමැති කාන්තාව විසින්; සඳසක්මදෙසින්, චන්ද්‍ර (මණ්ඩල)නමැති ශඞ්ඛමඤ්ජූෂාවෙන් හෙවත් සක්පෙව්පියෙන්; ඇදූ, ආකර්ෂණය කොට (ඇරගෙන); දුනුකැන්, ජ්‍යොත්ස්නා සමූහ නමැති හෙවත් සඳපහන නමැති; දුහුල, දුකූලය හෙවත් සළුව; දෙත, දනයකල කල්හි; සොඳ, සුන්දරවූ; පුරඅහන, පුරාඞ්ගනාතොමෝ; පැහැ උදුල, ප්‍රභාවෙන් උජ්ජ්වලිතවූ; පහසමුගින්, ප්‍රාසාද නමැති සමුද්ගයෙන් හෙවත් කරඬුවෙන් (ඇරගෙන); රැස් මිණිමෙවුල, රශ්මි නමැති මාණික්‍යමෙඛලාව; ඇය, ඒ නිශාකාන්තාවගේ; අඹර මතු, ව්‍යොමමස්තකයෙහි ද්‍යෞහෝ නොහොත් ආකාශමස්තකයෙහි; සෙද, ශීඝ්‍රව; දුනි, ප්‍රදානයකළා.

ඒ කැලණි නුවර නමැති ස්ත්‍රිය විසින් පමුණුවනලද ක්‍රීඩාමඞ්ගල්‍යයන් ලැබීමෙන් සතුටුව ඔජාහිවෑ ඕවූ හෙවත් මහාප්‍රීතියටපත්වූ රාත්‍රිනමැති ස්ත්‍රිය විසින් චන්ද්‍රයා නමැති සඞ්ඛමඤ්ජූෂාවෙන් හෙවත් සක්පෙට්ටියෙන් සඳරැස් නමැති සිහින් සළුව ඇද දුන් කල්හි—මනොඥවූ ඒ නගර නමැති ස්ත්‍රිය විසිනුදු, ප්‍රාසාද නමැති කරඬුවෙන් බැහැරකොට ගෙන උසස්වූ පැහැඇති ඇය අයත් රශ්මි නමැති මැණික්මය මෙඛලාදමය, ඒ රාත්‍රිනමැති ස්ත්‍රියගේ වස්ත්‍රය මතුයෙහි නොහොත් අහස්තලය මත්තෙහි වහා දුන් නාය, චන්ද්‍රරශ්මියෙන් රාත්‍රිභාගය බබලනවාත් සමගම, කැලණි නුවර පිහිටි චන්ද්‍රකාන්තපාෂාණමයවූ ප්‍රාසාදයන්ගේ දීප්තිය ගුණවූ බව මේ කවියෙන් කීහ.

57. ත ව ර කරු කොකුම් සඳුනෙන් තුනු සිය ල
ප ව ර සුවඳ මල්දම් පැලඳෑ මනක ල
බැහැ ර සිතු නොපෑ හිමිනඹුවො කෙළි ලො ල
ඒ පු ර ඉදිති සඳපානේ සඳලුව ල

57. කොකුම්සඳුනෙන්, කුඞ්කුමයෙන් යුක්තවූ චන්දනාඞ්ගරාගයෙන්; සියල තුනු, සකල ශරීරය; තවකරු, විලෙපනයකොට; පවර, උතුම්වූ; සුවඳ, (කස්තුරිකාදී) සුගන්ධද්‍රව්‍යයන්ද; මනකල, මනොඥවූ; මල්දම්, පුෂ්පදමයන්ද; පැලඳෑ, ප්‍රසාධනය කොට; බැහැර, අන්‍යයන් විෂයෙහි; සිතුනොපෑ, චිත්තදනය නොකළාවූ; කෙළිලොල, ක්‍රීඩාලොලයෙන් යුක්තවූ; හිමිනඹුවො, දම්පතීහු; එපුර, ඒ පුරයෙහි; සඳලුවල, චන්ද්‍රශාලාවන්හි; සඳපානේ; චන්ද්‍රාලොකයෙහි; ඉදිති, නිෂද්‍යකෙරෙත්.

කොකුම් මිශ්‍රවූ සඳුන් කලල් ශරීරයෙහි ගල්වාගෙන, සුගන්ධවත්වූ උතුම් වර්ගයෙහි මාලාදමයන් පැලඳගෙන, අන්‍යයන් කෙරෙහි ආලයක් නොපවත්වන සුලුවූ යහපත් ස්ත්‍රී පුරුෂයෝ ක්‍රීඩාධුරයෙහි යෙදීමෙන් හෙවත් රතික්‍රීඩාවෙහි ආශාවෙන් යුක්තව, ඒ නුවර චන්ද්‍රශාලාවන්හි සඳපානෙ හිඳිත්.

58. මුවලඹ රඹ වලුබර රන් තැඹිලි තු රු
සැදි ගෙවුයන් ගෙවමින් වේමග අ තු රු
කරකැවෙමින් දකුණට අවුදින් හි තු රු
වදූ ශවහෙරට සිහිකරු නවගුණම තු රු

58. මුවලඹ, මුඛාවලම්බිතවූ; රඹ, කෙහෙල්ගසින්ද; වලුබර, එලබරිතවූ; රන්තැඹිලිතුරු, කනකසන්නිර වෘක්‍ෂයෙන්ද; සැදි, අලඞ්කෘතවූ; ගෙවුයන්, ගෘහොද්‍යාන ඇත්තාවූ; වේමග අතුරු, වීථිමාර්ගාන්තරය; ගෙවමින්, පසුකරමින්; දකුණට කරකැවෙමින්, දක්‍ෂිණාවෘත්තාවෙමින්; ඇවිදින්, ආගමනයකොට; නවගුණමතුරු, "ඉතිපි සො භගවා" යනාදී නවගුණමන්ත්‍රය; සිහිකරු, අනුස්මරණයකොට; මිතුරු, මිත්‍රය; වෙහෙරට, විහාරයට; වදු, ප්‍රවිෂ්ටවෙව.

මුඛය හෙවත් කැන් එල්බෙන්නාවූ කෙසෙල්ගස්වලින්ද, වලු බරවූ රන්තැඹිලිගස්වලින්ද සැරසුනාවූ ගෘහසමීප උයන් ඇති වීථිමාර්ගය පසුකොට, දකුණට කරකැවී අවුත්; නවගුණගාථාව සිහිකොටගෙන යහලුව විහාරයට වදුව.

59. දි ය තෙ ක් පැතිරු සිටි බුදුගුණ කියා හැ ම
ස ග මො ක් ලබනුවස් පියයුග ඔබා බි ම
සි ය ස ක් පුරා දුටු මෙන් තුටුවැ මුනිතු ම්
ව දු ල ක් තිලකගෙයි වැඩඋන් මහපිළි ම

59. හැමදියතෙක්, සියලුලොකය ඇතිතාක්; පැතිරු, ව්‍යාප්තව; සිටි, අවස්ථානයකළාවූ; බුදුගුණ, (ගාථා විශෙෂයෙන් රචිතවූ) බුදුගුණයන්; කියා, කථනයකොට; සගමොක් ලබනුවස්, ස්වර්ග මොක්‍ෂ (සම්පත්ති) ප්‍රතිලාභය පිණිස; පියයුග, පක්‍ෂපත්‍රයුග්මය; බිම ඔබා, භූමියෙහි පිහිටුවා; මුනිතුම, (ජීවමානවූ) මුනින්ද්‍රයන් වහන්සේ; සියසක්, ස්වකීය නෙත්‍රය; පුරා, (රූපවිලාසයෙන්) පරිපූර්ණකොට; දුටු මෙන්, දර්ශනයකළාක් මෙන්; තුටුවැ, සන්තුෂ්ටව; ලක්තිලකගෙයි, ලඞ්කාතිලක නම්වූ ප්‍රතිමාලයෙහි; වැඩඋන් මහ පිළිම, (වජ්‍රාසනාරූඪව) වැඩඋන් මහපිළිම සාමින්වහන්සේ; වදු, (මස්තකයෙන්) නමස්කාරකර.

සියලු ලොකයෙහි පැතිරසිටි බුද්ධගුණයන් කියා, ස්වර්ගමොක්‍ෂ සම්පත් ලබනුපිණිස පියාපත්සඟල භූමියෙහි පිහිටුවා හෙවත් බිමට බැස, තොපගේ ඇස්පුරා බුදුන් දුටුවාක් මෙන් සතුටුව, ලඞ්කා තිලක නම් ප්‍රතිමාගෘහයෙහි වැඩඋන් මහාප්‍රතිමාව වඳුව.

60. පෙ ර ද ල නිදු දියකඳ රටබිම් ගල ත
සු ර කු ල හිමි රකිනුව ලක මැවූ ස ත
ම නා ක ල ඒ සමුදුර පැහැසෙන් දිමු ත
ව ඳු ස ල පිළිමහිමි සිරිසරණ සියප ත

60. පෙර, පූර්වකාලයෙහි හෙවත් කැලණිතිස්සරජ කාලයෙහි; දලනිදු, ජලනිධීනු; දියකඳ, ජලස්කන්ධයෙන්; රටබිම් ගලන, ජනපද භූමිප්‍රදේශයන් නිමග්නයකරන කල්හි; ලකසන, ලංකාවාසී සත්ත්වයන්; රකිනුව, රක්ෂාකරනු පිණිස; සුරකුලහිමි, ශක්‍රදේවේන්ද්‍රයා විසින්; මැවූ, නිර්මිතකළාවූ; මනකල, මනෝඥවූ; ඒ සමුදුරපැහැයෙන්, ඒ සමුද්‍රවර්ණයෙන්; දිමුත, දීප්තිමත්වූ; සල පිළිමහිමි, ශිලාප්‍රතිමා ස්වාමීන්ගේ; සිරිසරණ සියපත, ශ්‍රීපාද නමැති පද්මය; වඳු, නමස්කාරකරව.

පූර්වයෙහි මහමුහුද දිය උතුරුවා රටබිම් වසන කල්හි, ලක්දිව් වාසීන් රක්ෂාකරන පිණිස ශක්‍රයා විසින් මවනලද ඒ සාගර ප්‍රභාවෙන්ම දීප්තිමත්වූ මනාවූ ගල්පිළිමය සම්බන්ධ ශ්‍රීචරණ නමැති පද්මය නමස්කාරකරව.

61. ගි ලි ය නොදී සැටමහණුන් බවමහ ණ
ම ලි ය දෙව්තෙරිඳු වැඩහිඳැ දෙසූ බ ණ
දි ලි ය පස්මහල් පහයෙහි මිණිකිර ණ
බැ ලි ය හැකිවිනම් දැකැ වැඳැ යා කල ණ

61. සැටමහණුන්, සැටක් පමණ ශ්‍රමණයන්වහන්සේලා; බවමහණ, සංසාර මහාර්ණවයෙහි; ගිලිය නොදී, නිමග්නවන්ට නොහැර; මලියදෙව් තෙරිඳු, මලියදෙවස්ථවිරයන්වහන්සේ විසින්; වැඩහිඳැ, උපවේශනයකොට; බණ දෙසූ, ඡඡක්කසූත්‍රය දෙසනාකළාවූ; පස්මහල් පහයෙහි, පඤ්චභූමක ප්‍රාසාදයෙහි; දිලිය, උජ්ජ්වලිතවූ; මිණිකිරණ, මාණික්‍ය රශ්මීන්; බැලියහැකි විනම්, දර්ශනක්ෂමවිනම්; දැකැ, නිරීක්ෂණයකොට; වැඳැ, නමස්කාරකොට; කලණ, කල්‍යාණය හෙවත් සුන්දරබවය; යා, යාත්‍රාකර.

සැටනමක් මහණුන්වහන්සේලා සසර නමැති සයුරෙහි ගිලා බස්නට නොහැර, මලියදෙවස්ථවිරයන්වහන්සේ වැඩහිඳගෙන ධර්මදේශනාකළාවූ, පඤ්චභූමක ප්‍රාසාදයෙහි දීප්තිමත් මැණික්පැහැය බැලිම් හැකිවිනම් දැක නමස්කාර පවත්වා යහපත් තැනැත්ත යායුතු.

62. පෙ ර උ වි දූ ගෙනැ ගිරිඳු සිඳු සල ත
නැ ඹ පැ හැ දූ පෙන සමුදු සැපි නුමු ත
මෙ න උ ළි දූ පැහැ වි හි ද නෙදිගුබී ත
සැ දී ව ට දූ ගෙ සි වදු දූ ගැබ දිමු ත

62. පෙර, පූර්වයෙහි; උවිඳ, උපෙන්ද්‍රයා (විසින්); ගිරිඳ, මන්දර පර්වතය; ගෙනැ, ග්‍රහණයකොට; සිඳු, (ක්ෂීර) සාගරය; සලත, මථනයකරන කල්හි; පැහැද, ප්‍රසන්නව; නැගී, උද්ගතවූ; පෙණසමුඳ, ඵේණරාශියගේ; සැපි, සංස්ථානය; නුමුත, නොහැරියාවූ; උළිඳු මෙන, චන්ද්‍රයා හා සමානවූ; පැහැ, ප්‍රභාව; නොදිගු බිත, නොයෙක් දිශා භිත්තීන්හි; විහිද, විස්තීර්ණකොට; සැදී, සැරහුනාවූ; වටදගෙහි, වෘත්තධාතු ගෘහයෙහි; දිමුත, දීප්තිමත්වූ; දගැබ, ධාතුගර්භය; වඳු, නමස්කාරකරව.

පූර්වයෙහි විෂ්ණුදිව්‍යරාජයා විසින් මහමෙර ගෙන මුහුද කලඹනකල්හි (ශ්‍රීදේවිය ගැන්මට මහමෙර ගෙන මුහුද ඇලලූහෙයින් කීය) පැදී නැගුනු පෙණරාශීන්ගේ ස්වභාව අත්නොහැරියාවූ, චන්ද්‍රයා පරිද්දෙන් නානාදිශාභිත්තීන්හි රුස් පතුරුවා, වටදගෙහි බබලන්නාවූ ධාතුගර්භය නමස්කාරකරව.

63. දිගු නෙත් නිලුපුලෙව් රතදර පබල ර ඟ
සි රි ම ත් සුපුන්සඳ වැනි උවන මනර ඟ
පැහැපත් ලකල් රන්වන් විලසින් ලොව ඟ
වැ ද ඔත් පිළිමහිමි වදු පායැ පැලදි ග

64. නිලුපුලෙව්, නීලෝත්පල බඳුවූ; දිගුනෙත්, ආයත නෙත්‍රයන් ඇත්තාවූ; පබලරඟ, ප්‍රවාලාකාරවූ; රතදර, රක්තාධරයෙන් යුක්තවූ; සිරිමත්, ලක්ෂ්මීමත්වූ; සුපුන්සඳ වැනි, සම්පූර්ණ චන්ද්‍රයා බඳුවූ; මනරඟ, මනොරඤ්ජනයකරන්නාවූ; උවන, ශ්‍රීමුඛ මණ්ඩලයක් ඇත්තාවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තියෙන්; ලකල්, අලඞ්කෘතවූ; රන්වන්විලසින්, ස්වර්ණවර්ණවූ (රූප) විලාසයෙන්; ලොවඟ ලොකොත්තමවූ; පැලදිග පායැ, පශ්චිමදිශාභාගයෙහි (පිහිටි) ප්‍රාසාදයෙහි; වැදඔත්, ශයනප්‍රාප්තවූ; පිළිමහිමි, ප්‍රතිමා ස්වාමීන්වහන්සේ; වඳු, නමස්කාරකර.

නිල්මහනෙල්මල් වැනි දික්ඇස්ද, පබලු වැනි රතු තොල්ද, මනා දැකුම්ඇති සම්පූර්ණ චන්ද්‍රයා වැනි යහපත් මුහුණුදඇති, අලඞ්කාරවූ දිප්තිමත් ස්වර්ණවර්ණ විලාසයෙන් ලොකයෙහි අග්‍රවූ බස්නාහිර දිශාවෙහි පිහිටි ප්‍රාසාදයෙහි ශයනප්‍රාප්තව වැඩහුන් ප්‍රතිමා ස්වාමීන්වහන්සේ වඳුව.

64. අ හ සි න් අවුත් මිණි අක්නසිඳු යැදුම ට
ර හ තු න් මැදෙහි මුනි ඉඳැ මිණිපලඟ පි ට
ද හ මු ත් දෙසූ තැනැ කළ සැටරියන් කො ට
මහ දාගැප් හිමින් වදු සොළොස් තැන් සි ට

64. මිණිඅක්නසිඳු, මණිඅක්ඛික නම් නාගරාජයාගේ; යැදුමට, යාච්ඤාවට; මුනි, සර්වඥයන්වහන්සේ; අහසින් අවුත්, ආකාශයෙන් වැඩ; රහතුන් මැදෙහි, (පන්සියයක්) ක්ෂීණාශ්‍රවයන්වහන්සේලාගේ මධ්‍යයෙහි; මිණිපලඟ පිට, රත්නමය පර්යඞ්ක මස්තකයෙහි; ඉඳැ, උපවෙශනප්‍රාප්තව; දහමුත් දෙසූ තැනැ, ධර්මයන් දෙශනාකළාවූ ස්ථානයෙහි; සැටරියන් කොට, ෂෂ්ටිහස්තප්‍රමාණ කොට; කළ, කරනලද්දාවූ; මහදාගැප් හිමින්, මහාධාතුගර්භ ස්වාමීන්වහන්සේ; සොළොස තැන්, ෂොඩශස්ථානයෙහි; සිට, ස්ථානයකොට; වදු, වන්දනයකරව.

මණිඅක්ඛික නාගරාජයාගේ ආරාධනාව පිණිස, බුදුරජාණන් වහන්සේ අහසින් වැඩ, රහතුන්වහන්සේලා මධ්‍යයෙහි මැණික් පුටුවපිට වැඩහිඳගෙන ධර්මදෙශනාකළාවූ ස්ථානයෙහි උසින් සැටරියන් කොට කරනලද මහදාගැප් වහන්සේ, සොළොස් තැනෙක සිට නමස්කාරකරව.

65. ස ව න සතියැ වැසි වසිනා දසදි ගෙ හි
පෙ ණි න සෙවෙණි මුදලිඳුනා දරණ ගෙ හි
ස ව න හිඳිනු දනනදනා නෙතුයු ගෙ හි
ව දි න මැනවි පිළිමය නා පිළිම ගෙ හි

65. දසදිගෙහි, දශදිශාවෙහි, වැසිවසිනා, (සත්තාහවද්දලිකා වශයෙන්) වර්ෂණයකරන්නාවූ; සවන සතියැ, (බුදුවීමෙන්) සවන සතියෙහි; පෙණින, ඵණමණ්ඩලය කරණකොටගෙන; සෙවෙනි, ඡදනය ඇත්තාවූ; මුදලිඳුනා, මුචලින්ද නාගරාජයාගේ; දරණ ගෙහි, භොගාවලි ගෘහයෙහි; සවන, සර්වඥයන්වහන්සේ; හිඳිනු, වැඩහිඳිනා භාවය; දනන්, ජනයන්ගේ; නෙතුයුගෙහි, නෙත්‍රයුග්මයෙහි; අඳනා, අඤ්ජනයකරන්නාවූ හෙවත් දක්වන්නාවූ; නාපිළිමගෙහි, නාගප්‍රතිමාලයෙහි; පිළිමය, ප්‍රතිමාව; වදින මැනවි, නමස්කාරකරනු යහපති.

බුදුහු බුදුවූ සවෙනි සතියෙහි දසදිශාවන් නොහැර නොකඩව වැස්සාවූ මහාවර්ෂාවෙහිදී මුචලින්ද නම් නාගරාජයාගේ දරණ

ගැබතුල බුදුහු වැඩහුන් ආකාරය මනුෂ්‍යයන්ගේ ඇස්හි අදින්නාවූ හෙවත් ඒ සදහන්කරවන්නාවූ නාගප්‍රතිමාගෘහයෙහි වැඩහුන් නාවූ පිළිමය වඳිනු යහපති. '

66. අ ප මු නි ඳු බුදුවන දිනැ මුරුන් පි ඳු
පැහැ විහිඳු දිලි කලදෝ යපින් යෙ ඳු
සැ දි සි නි ඳු ඉඳුනිල්මිණි සතෙක බ ඳු
වැ ඳැ දු මි ඳු වන පින්පල තා අත් බ ඳු

66. අප මුනිඳු, අපගේ (ගෞතම) සර්‍වඥරාජෝත්තමයානන් වහන්සේ; බුදුවන දිනැ, සර්‍වඥපදප්‍රාප්තවන දිනයෙහි; මුරුන්පිඳු, දෙවතාවන් විසින් පූජාකරනලද්දවූ; පැහැ විහිඳු, ආලොක පතුරුවනලද; දිලි; දීප්තිමත්වූ; කලදෝ යපින්, කලධෞත යෂ්ටියෙන් හෙවත් රිදී මිටකින්; යෙදු, යොජිතවූ; සැදි, අලඞ්කෘතවූ; සිනිඳු, සනිග්ධවූ; ඉඳුනිල්මිණිසතෙක බඳු, ඉන්ද්‍රනීලමාණික්‍යඡත්‍රයක් හා සමානවූ; දුමිඳු, බොධිද්‍රුමරාජයන්වහන්සේ; වැඳැ, නමස්කාරකොට; වන, වන්නාවූ; පින්පල, පුණ්‍යඵලය; තා අත් බඳු, තාගේ හස්තප්‍රාප්තකරව නොහොත් තාගේ චිත්තයෙහි බන්ධනයකර.

ගෞතම සර්‍වඥයන්වහන්සේ බුදුවන දවස්හි දෙවියන් විසින් පූජාකරනලද, දීප්තිමත් රිදීමිටක් යොදනලද, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ කුඩයක් වැනි බෝරුක වැඳ, එයින් ඇතිවන පින්ඵලයන් තාගේ ආත්මය හා සම්බන්ධකරව.

67. ස ස රි න් මුදා ලෙව් සදහම් අ මා දී
එ ක ඟි න් මුනිඳු උන් වැනි නිපර මා දී
ලකුණෙන් සපිරි පිළිමය දැකැ ස මා දී
වැඳ ග න් මිතුර තුන්සිත කරු ස මා දී

67. සදහම් අමා දී, සද්ධර්‍ම නැමති අමෘතය (විභාගකොට) දී; ලෙව්, සත්වලොකයා; සසරින් මුදා, සංසාර (බන්ධන) යෙන් මොචනයකොට; නිපරමාදී, සමෘතිවිප්‍රවාසය නැත්තාවූ; මුනිඳු, මුනීන්ද්‍රයානන්වහන්සේ; එකඟින්, චිත්තෙකාග්‍රතාවයෙන් යෙදී; උන් වැනි, වැඩඋන්නාක් වැනිවූ; ලකුණෙන්, (උත්තම දර්ශනීය) ලක්‍ෂණයෙන්; සපිරි, සම්පූර්ණවූ; සමාදී පිළිමය දැකැ, සමාධි නම්වූ ප්‍රතිමාව දර්ශනයකොට; මිතුර, යහළුව; තුන්සිත, ත්‍රිවිධ චිත්තය; සමාදිකරු, එකඟකොට නොහොත් ප්‍රසන්නකොට; වැඳගන්, නමස්කාරකරගනුව.

සද්ධර්ම නමැති අමෘතය දීමෙන්, ලෝවැස්සන් සංසාරයෙන් මුදා හැර අප්‍රමාදගති ඇති බුදුරජාණන්වහන්සේ එකහසිතින් යුක්තව වැඩඋන්නාක් බඳුවූ, තිස්දෙකක් මඟුල්ලකුණෙන් සම්පූර්ණවූ, සමාධි නම් පිළිමය දැක, මිත්‍රය තුන්සිත එකහකොටගෙන වැඳගන්න.

68. වි ටං ක පැකිළිඳු දකුණස දෙරටුයෙ න
නි සං ක යෙන් පුද නන් තුරුගොසසමි න
ක ලං ක නොවැ කළි සුබලකුණු බබල න
ති වං ක නම් දෙපිළිම නැමඳ බැසගෙ න

68. විටංක, කොබෝගෙඩිවලල්ලෙහි; පැකිළි, ප්‍රස්ඵලිතවූ; ඉඳු, චන්ද්‍රයා ඇත්තාවූ; දකුණස දෙරටුයෙන, දක්ෂිණදිශාභාගයෙහි ගොපුරවාරයෙන් (නික්ම); නිසංකයෙන්, සැකනැතිව; පුද නන් තුරුගොසසමින, පූජාකරනලද නොයෙක් තූර්යඝෝෂාවන් ශ්‍රවණයකරමින්; කලංකනොවැ, දෝෂයක් නැතිවැ; කළි, කරනලද්දවූ; සුබලකුණු බබලන, ශුභලක්ෂණයෙන් භ්‍රාජිතවූ; තිවංක නම්, ත්‍රිවංක යන නමින් ප්‍රසිද්ධවූ; දෙපිළිම, ප්‍රතිමාවය; නැමඳ, නමස්කාරකොට; බැසගෙන, මාර්ගයට අවතීර්ණව.

කොබෝගෙඩි වලල්ලෙහි හෙවත් කොත්මුදුනෙහි හැපීසිටි චන්ද්‍රයා ඇති දකුණුවාසල් දොරටුවෙන් නික්ම නිසැකවසිටැ පූජා පිණ්ඩ පවත්වනලද නානාවිධ තූර්යයන්ගේ ඝෝෂාව අසාගෙන නිර්දෝෂලෙස කරනලද ශුභලක්ෂණයන්ගෙන්බබලන්නාවූතිවංක යන නම් ඇති ප්‍රතිමාවය වැඳ එතැනින් බැසගෙන:

69. ස ම න ළ ගිරිගිජිඳු දිගුකළ සොඬොක සැ පි
සි සි ල ළ ගඟැ සිලිල් සනහා මුනි නොගැ පි
පැහැ දු ළ තුන්සිවුරු ඇඳ පෙරවැ වැඩසි පි
තැනැක ළ සිවුරු දගැබ වඳු නොපැපි පි

69. සමනළගිරි, සමන්තකූටපර්වත නමැති; ගිජිඳු, ගජේන්ද්‍රයා විසින්; දිගුකළ, ප්‍රසාරිතවූ; සොඬක සැපි, සුණ්ඩා (දණ්ඩ) යකට බඳුවූ සටහන් ඇති; සිසිලළ ගඟැ, ශීතලප්‍රාප්තවූ ගඞ්ගාවෙහි; නොගැපි, විතරාගවූ; මුනි, සර්වඥයා; සිලිල් සනහා, ජලස්නානය කොට; පැහැදුළ, (සන්ධ්‍යාවලාහක) ප්‍රභාවයෙන් දිලියෙන්නාවූ; තුන්සිවුරු, ත්‍රිචීවරය; ඇඳැ පෙරවැ, නිවාසනපාරුපනයකොට;

වැඩසිටී, ස්ථිතිප්‍රාප්තවූ; තැනැ, ස්ථානයෙහි; කළ, ගොඩනැඟූ, සිවුරුඳගැබ, චීවරධාතුගර්භයට; පිපිනොපෑ, පරාඞ්මුඛනොවී; වඳු, නමස්කාරකරව.

සමනළකන්ද නමැති ඇත්රජු විසින් දික්කරනලද සොඬක් හා සමානවූ සිහිල්දිය ඇති කැලණිගඟෙහි මුනින්ද්‍රයන්වහන්සේ ජලස්නානයකොට ප්‍රභාමත්වූ දෙපටසිවුර ආදි තුන්සිවුරු පෙරවා වැඩසිටියාවූ ස්ථානයෙහි කරනලද චීවරධාතුගර්භයට පිටුනොපා වඳුව.

70: නි රි ඳු න් කැලණිතිස් නිවැරැදි රහත්තැ න
සැකයෙන් ලැවූ හුණුතෙල්සැල ආබූ තැ න
බැතියෙන් පිනැතියන් කළ විසිතුරු විම න
වැ ඩ උ න් පිළිමහිමි නමදින් යහදස න

70. කැලණිතිස් නිරිඳුන්, කැලණිතිස්ස රජහු විසින්; නිවැරදි රහත්තැන, නිරපරාධ රහත්කෙනෙකුන්වහන්සේ; සැකයෙන්, (අග්‍රමහෙසිකාවන් කෙරෙහි සම්බන්ධයයි) ශංකාවෙන්; ලැවූ, ප්‍රක්ෂෙපකරවූ; හුණුතෙල්සැල, තප්තතෛලස්ථාලිය; තුබූ තැන, ස්ථාපිතස්ථානයෙහි; පිනැතියන්, පුණ්‍යාර්ථීන් විසින්; බැතියෙන්, භක්තියෙන්; කළ, කරනලද්දවූ; විසිතුරු විමන, විචිත්‍ර විමානයෙහි; වැඩඋන්, උපවේශප්‍රාප්තවූ; පිළිමහිමි, බුද්ධප්‍රතිමාස්වාමීන්; යහදසනා, ප්‍රියදර්ශනය; නමදින්, නමස්කාර කරන්.

කැලණිතිස්සරජහු විසින් නිරපරාධවූ රහතුන්වහන්සේ (බිසවුන් හා පිළිබඳසිත් ඇතැයි යන) සැකයෙන් ලවනලද හුණුතෙල් තාලිය තුබූ තන්හි, පින්කරනු කැමැත්තන් විසින් කරවනලද විචිත්‍රවූ විමානයෙහි වැඩහුන්නාවූ ප්‍රතිමාස්වාමින්වහන්සේ මනා දකුම් ඇති තැනැත්ත වැඳගනුව.

71. පි රි සි දැ නොදතහැකි මෙවැඳුම් පින්පඩු රැ
මන බැ ඳැ රැගෙනැ දෙනලෙස දකැ එසුරවි රැ
සු ර ර ද පාය වින් විජයොත් නම් මහ රැ
එ ම ස ඳ වඩන රජගෙට මිතුර වැඩක රැ

71. පිරිසිඳැ නොදතහැකි, පරිච්ඡෙදකොට දතගත නොහැක්කාවූ; මෙ වැඳුම් පින්, මේ නමස්කාරයෙන් ජනිතවූ පුණ්‍ය (චෙතනා) නමැති; පඬුරු, ප්‍රාභෘතය; එසුරවිරු, ඒ විභීෂණ නම් සුරවීරයා; දකැ, දර්ශනයකොට; දෙනලෙස, දානයකරනපරිද්දෙන්;

මිත, විතානයෙහි; බැඳෑ, බන්ධනයකොට; ඇරගෙන, ග්‍රහණය කොට; සුරරද, ශක්‍රදෙවරාජයාගේ; මහරූ, මහාර්ඝවූ; විජයොත් නම්, වෛජයන්ත නම්වූ; පාය වන්, ප්‍රාසාදය හා සමානවූ; රජගෙට, (දෙව) රාජභවනයට; වැඩකරූ, අභිවෘද්ධිකාරවූ; මිතුර, මිත්‍රය; එමසඳ, ඒ ක්ෂණයෙහි; වඩන, ගමනප්‍රාප්ත වන්නේයි.

විභාගකොට නොදතහැක්කාවූ මේ වැදීමෙන් හටගත් පින් නමැති සතුටුපඬුරු ඒ විභීෂණ දෙවරාජයා දක දෙනපිණිස සිත්හි තබාගෙන, ශක්‍රයාගේ වෛජයන්ත නම් ප්‍රාසාදය වැනි උතුම්වූ (දිව්‍ය) රාජභවනයට වැඩදයකවූ මිත්‍රය එකල්හි පැමිණෙව.

72. පු ලා සුවඳ මලවුල් කර වරල් බැ ද
දු ලා රන්පතින් සරසා සවන් සො ද
නිලා දිගු නුවන් රසඳුන් තනා ඇ ද
බ ලා සිටු රගන රගමඩලැ කල්බ ද

72. පුලා, ප්‍රඵුල්ලවූ; සුවඳමල්, (ජාතිකල්හාරාදී) සුගන්ධපුෂ්පයෙන්; අවුල්කර, ආකුලකොට (ගවසා); වරල්, කෙශකලාපයන්; බැඳ, බන්ධනයකොට; සොඳ, සුන්දරවූ; සවන්, කර්ණයන්; දුලා, ප්‍රභාස්වරවූ; රන්පතින්, කනකපත්‍රයෙන්; සරසා, අලඞ්කෘත කොට; නිලා, නීලවර්ණවූ; දිගු, දීර්ඝවූ; නුවන්, නෙත්‍රයන්හි; රසඳුන්, රසාඤ්ජනයන්; තනා, අලඞ්කෘතකොට; ඇඳ, අඤ්ජනයකොට; රඟමඬලැ, නෘත්‍යමණ්ඩලයෙහි; රඟන, නෘත්‍යකරන්නාවූ; කල්බඳ, (නාටක) ස්ත්‍රීන්; බලාසිටු, අවලොකනයකොට අවස්ථානය කරව.

සුගන්ධවත්වූ පිපුනු මල්වර්ගයන්ගෙන් ගවසා කෙස්වැටිබැඳගෙන දීප්තිමත් රත්රන් තෝඩුවලින් යහපත්වූ උභයකර්ණයන් සරසාගෙන නිල්පැහැයෙන් බබලන්නාවූ දික්ඇස්වල රසාඤ්ජනයන් තනාගෙන නෘත්‍යමණ්ඩලයෙහි නැටුම් පවත්වන මනොඥවූ ස්ත්‍රීන් බලාසිටුව.

73. වි දෙ න ලෙලෙන නරුබර පුළුලුකුළැ රැ දී
හෙ ල න න ග න අතැ නුවනග බැලුම් දී දී
රූ ව න දි ලෙ න අබරණකැලුම ගතැ යෙ දී
සැ ලෙ න පග න සිළු වැනි රඟන ළිය සැ දී

73. පුලුළුකුලැ, විශාලවූ ජඝනස්ථලයෙහි; රුදී, රක්‍ෂිතවූ; විදෙන, (සංකොචභාවය හැර) විකාශවන්නාවූද; ලෙලෙන, ලීලොපෙතවන්නාවූද; නැරුඹර, නීවිභාරයෙන් යුක්තවූ; හෙලන නගන, උත්ක්‍ෂෙපණාවක්‍ෂෙපණ කරන්නාවූ; අතැ, හස්තය කෙරෙහි; නුවනඟබැලුම් දිදී; නෙත්‍රාන්තදර්ශනය පවත්වා පවත්වා; රුවන, (පද්මරාග) රත්නයෙන්; දිලෙන, උජ්ජවලිතවූ; අබරණ කැලුම, භූෂණකාන්තිය; ගතැ, (හස්තපාදාදී) ගාත්‍රයෙහි; යෙදී, යුක්තව; සැදී, (නාටකවෙෂයෙන්) අලඞ්කෘතව; රඟන, නෘත්‍ය කරන්නාවූ; ලිය, කාන්තාවන්; සැලෙන, චලිතවන්නාවූ; පහන සිළු වැනි, ප්‍රදීපශිඛාවන් වැන්නාහ.

පලල්වූ උකුලෙහි විහිදෙන්නාවූද ලෙලදෙන්නාවූද කුඩාතුමු හෙරිපට ඇතිව, උඩට නගන්නාවූද පහළට හෙලන්නාවූද අත්කෙරෙහි නෙත්අග බැලුම් පවත්වමින් ශරීරයෙහි යෙදුනාවූ රත්නයෙන් බබලන අභරණකාන්ති ඇතිව, නෘත්‍යවිලාශයෙන් සැරසී නටන්නාවූ ස්ත්‍රීහු චචලවන්නාවූ පහන්සිළු වැන්නෝය.

74. ල කු ළු පුලුලුකුලැ බඳ මිණි මෙවු ල් ලා
සමග රන්සලඹ රුවිදී වෙවු ල් ලා
වයන පදට තබමින් පදකම ල් ලා
රඟන ලඳුන් බල රූසිරි සිය ල් ලා

74. ලකුළු, අලඞ්කෘතවූ; පුලුලුකුලැ, විශාලවූ ශ්‍රොණියෙහි; බඳ, බන්ධනයකරනලද; මිණි මෙවුල්ලා, මාණික්‍යමෙඛලාදාමය; සමඟ, එක්ව; රන්සලඹ, ස්වර්ණ නූපුරය; වෙවුල්ලා, කම්පාකොට; රුවිදී, නාදපවත්වා; වයන පදට, වාදනයකරන (මද්දලධ්වනි) පදයට; පදකමල්ලා, පාදපද්මය; තබමින්, වින්‍යාසකරමින්; රඟන, නෘත්‍ය කරන්නාවූ; ලඳුන්, කාන්තාවන්ගේ; රූසිරි සියල්ලා, සකල රූපසම්පත්තිය, බල, නිරීක්‍ෂණයකර.

අලඞ්කාරවූ පළල් උකුලෙහි බඳිනලද මැණික්මය මෙවුල්දම සමග රත්නනූපුරයන් නාදපවත්වමින් කම්පිතකොට, වාදනය කරනලද බෙරපදයට එකභව පාපියුම් තබමින් නටන්නාවූ ස්ත්‍රීන්ගේ සියලු රූපශ්‍රිය බලව.

75. වස්දඬු බිඟු කොවුල් විණතද මියු රු
රුස්වූ සෙයින් සත්සර රසඟ් සොඳු රු
අස්වන ලියන් දකැ ලියකිඳුරඟන යු රු
තොස්කර නසිත සඞනත නුවනත මියු රු

75. වස්දඬු, වස්කුලල්ය; බිඟු, භෘඞ්ගය; කොවුල්, කොකිලය; වීණා, විපඤ්චිකාය (යන මොවුන් සම්බන්ධවූ); නද, නාදයන්ගේ; මිහුරු, මාධුර්‍ය්‍යය; රුස්වූ සෙයින්, රාශීභූතවූවා සෙයින් හෙවත් එකතැන්වූවාක් මෙන්; සත්සර, ස, රි, ග, ම, ප, ධ, නි, යන සප්තස්වරයෙන් යුක්තවූ; සොඳුරු, (එහෙයින්) මනොඥවූ; රසඟී, රසවත් ගීතිකාවන්; අස්වන, ශ්‍රවණයකරවන්නාවූ; ලියකිඳුරඟන සුරු, ලියකින්නරාඞ්ගනාවන් වැනිවූ; ලියන්, කාන්තාවන්; දකා, දර්ශනයකොට; මිතුරු, මිත්‍රය; තසිත, තාගේ චිත්තයද; සවනත, ශ්‍රවණයද; නුවනත, නෙත්‍රයද; තොස්කර, සන්තොෂකරව.

වස්දඬුය භෘඞ්ගය කොකිලය වීණාය යන මොවුන් සම්බන්ධවූ මධුරනාදය කැටිවූවාක් මෙන්, සප්තස්වරයෙන් යුත් මනොඥවූ රසවත් ගීතිකාවින් අස්වන්නාවූ; ලතාකින්නරාඞ්ගනාවන් වැනි ස්ත්‍රීන් දක, මිත්‍රය තොපගේ සිතද කනද ඇස්ද යනමොවුන් සතුටු කරගනුව.

76. මෙ සේ පැවති අනතුරු ගී රුඟුම්පු ද
තොසේ සිතින් වැඩසිටි සුරවිමන් මැ ද
ය සේ පතළ දියතුළැ උතුළු මනන ද
ඇ සේ පුරා දකු විබිසණ සුරිඳුස ද

76. මෙසේ, යථොක්තප්‍රකාරයෙන්; පැවති, ප්‍රවෘත්තවූ; ගීරුඟු පුද අනතුරු, ගීතනෘත්‍ය පූජාවට අනන්තරව; තොසේසිතින්, සන්තොෂචිත්තයෙන්; සුරවිමන් මැද, දෙවවිමාන මධ්‍යයෙහි; වැඩසිටි, ස්ථානප්‍රාප්තවූ; දියතුළැ, ජගදන්තරයෙහි; පතළ, ව්‍යාප්තවූ; උතුළු, ඉතිරගියාවූ; මනනද, මනොනන්දනවූ; යසේ, කීර්තිඇති; විබිසණසුරිඳුසද, විභීෂණ නම්වූ සුරෙන්ද්‍රොත්තමයා; ඇසේ පුරා, දෘෂ්ටිපූරණය කොට; දකු, දර්ශනයකර.

මෙපරිද්දෙන් පවත්නා නෘත්‍යගීත පූජාදියට අනන්තරව, දෙවාලය මධ්‍යයෙහි සතුටුසිතින් වැඩසිටියාවූ, ලොකයෙහි පැතිර ඉතිරී සිටි මනොඥවූ කීර්ති ඇති, විභීෂණදිව්‍යරාජයා ඇස්පුරා බලව.

77. පැ මි ණ සිටි අඳුන්ගිරිකුළු මුදුනවෙ ත
රෙහෙණ නැකත ගැලසිරි විලසින් දිමු ත
ස ර ණ මුළුලොවට එසුරිඳු සිරසප ත
ක ල ණ කිරුළු දිසි මුතුලැල් රුවන්යු ත

77. අඳුන්ගිරිකුළුමුදුන වෙත, අඤ්ජනපර්වතකූට මස්තකයක්හුගේ සමීපයෙහි; පැමිණසිටි, ප්‍රාප්තව සිටියාවූ; රෙහෙණනැකත ගැලසිරි, රොහිණී නක්‍ෂත්‍රශකටශ්‍රීහුගේ; විලසින්, විලාසයෙන්; දිමුත, දීප්තිමත්වූ; මුළුලොවට, සමස්තලොකයට; සරණ, ප්‍රතිශරණ, ධාරවූ; එසුරිඳු, ඒ විභීෂණසුරෙන්ද්‍රයාගේ; සිරසපත, ශීර්ෂප්‍රාප්තවූ; මුතුලැල්, මුක්තාලතිකාවෙන් හා; රුවන් යුත, රත්නයෙන් යුක්තවූ; කලණ කිරුළ, මනොඥ කිරීටය; දිසි, දෘශ්‍යමානවී.

අඳුන්ගිරිශිඛරයෙක සමීපයට පැමිණ සිටියාවූ රොහිණීනක්‍ෂත්‍රය සම්බන්ධ රථලීලාව පරිද්දෙන් දීප්තිමත්වූ සකලලොකයට පිහිටවූ ඒ දිව්‍යරාජයාගේ හිසෙහි පිහිටියාවූ මුතුවැල් හා රත්නයන්ගෙන් යුත් මනොහරවූ ඔටුන්න පෙනෙයි.

78. සු නි ලේ පැහැය හැරු සුදුවනුය ගනවෙ ලේ
වි දු ලේ එයින් වියොවට පැමිණී වියවු ලේ
නි ස ලේ ඒ මේසිරි ගත් සුරිඳු හැමක ලේ
උ දු ලේ දෙහෝ රන්පට මෙන් නලල්ත ලේ

78. ගන, ඝනවූ; වෙලේ, වලාහකතෙම; සුනිලේ, අතිනිලවූ; පැහැය, ප්‍රභාව; හැරු, හරණයකොට හෙවත් පරිත්‍යාගකොට; සුදුවනුය, ශුභ්‍රවර්ණ වන්නේය; එයින්, ඒ (වර්ණවිපර්යාසවූ) කාරණයෙන්; විදුලේ, විද්‍යුල්ලතාතොමෝ; වියොවට පැමිණී, (ඒ මෙඝනමැති වල්ලභයා හා එක්ව ශරත්කාලයෙහි) වියොගයට පැමිණී; වියවුලේ, ව්‍යාකූලයෙන්; හැමකලේ, සදාකාලයෙහි; නිසලේ, නිශ්චලවූ හෙවත් අන්‍යවර්ණයකට නොපැමිණෙන්නාවූ; මේ සිරි ගත්, මෙඝශ්‍රී ධාරණයකළාවූ; එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; නලල්තලේ, ලාලටතලයෙහි; රන්පට මෙන්, උෂ්ණීෂපට්ටාකාරයෙන්; උදුලේදෙහෝ, බබලන්නේදෝහෝ.

ඝනවූ වලාපටලයතෙමේ සුනිල්පැහැය හැර සුදුපැහැයට පැමිණේ; ඒ හෙතුවෙන් විදුලිය එයින් වෙන්වීමට පැමිණී වියවුලෙන් සියලුකල්හි විපර්යාසයක් නොවන්නාවූ වලාපටලශ්‍රිය ගත් ඒ දෙව්රජහුගේ නලල්තලයෙහි නලල්පට මෙන් බබලන්නේදෝහෝයි සිතමි.

79. රු වි නේ උතුම් එසුරිඳු මිණිරල මෙ නේ
ස ව නේ රුඳුනු රසුදුල තෝඩු ගනර නේ
උ ව නේ වැජඹී සිරසරසවිය හැමදි නේ
සොබ නේ කනා කැටපත් යුවල විලසි නේ

79. රුවිනේ උතුම්, රූපයෙන් උත්තමවූ; එසුරිඳු, ඒ සුරෙන්ද්‍රයාගේ; මිණිරල මෙනේ, (ඉන්ද්‍රනීල) මාණික්‍ය දෙලා වැනිවූ; සවනේ, කණ් (පාශ) යෙහි; රුඳුනු, රඤ්ජිතවූ; රසුදුල, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; ගනරනේ, ඝනකනකමයවූ; තෝඩු, තාඩඩ්ක (සුවර්ණමය) තෙම; උවනේ, මුඛ (පද්ම) යෙහි; හැමදිනේ, සද කාලයෙහි; වැජඹී, විජෘම්භිතවූ; සිරිසරසවිය, ශ්‍රීකාන්තා සරස්වතී දෙදෙනාගේ; කනා කැටපත්සුවල, සුවර්ණමයවූ දර්පණයුග්මයක් මෙන්; විලසිනේ, විලාසයෙන්; සොබනේ, ශොභමානවන්නේය.

උතුම්වූ රූඇති ඒ දිව්‍යරාජයාගේ මැණික්මය උත්සිල්ලාවක් වැනිවූ කන්හි රුඳුනාවූ දීප්තිමත් ප්‍රභාඇති ඝනකනක තාඩඩ්කයෝ සියලුකල්හි මුහුණෙහි වාසයකරන ශ්‍රීකාන්තා සරස්වතී දෙදෙන අයත් සුවර්ණමය කැටපත් යුගලයක් සෙයින් බබලයි.

80. නමකල සත හැලේ සි හි ලේ සැපසිලි ලී
බියසෙන රුපුකැලේ තු මු ලේ දෙන නොක ලී
නලලත ගිරි තෙලේ සු නි ලේ රුසිනිපි ලී
සුරරද දෙ මැ ලේ ග න ලේ සිරි කිය ලී

80. නමකල, නමස්කාරකලාවූ; සත, සත්වනමැති; හැලේ, හාලික්ෂෙත්‍රයට; සිහිලේ, ශීතලවූ; සැපසිලිලී, සම්පත්ති නමැති ජල (ධාරාවන්) ද; තුමුලේ, මහත්වූ; රුපුකැලේ, ශත්‍රු ගුල්මයට හෙවත් සතුරන් නමැති වනලැහැබට; නොකලී, අමනොඥවූ; බියසෙන, භයනමැති නිර්ඝාතයන්ද; දෙන, දනයකරන්නාවූ; නලලත, ලලාට නමැති; ගිරිතෙලේ, පර්වත තටයෙන්; සුනිලේ රුසින්, අතිනීලවූ කාන්තියෙන් (උපලක්ෂිතව); ඉපිලී, උද්ගතවූ; සුරරද දෙබැමලේ, සුරෙන්ද්‍රයාගේ භ්‍රෑලෙඛායුග්මයතෙම; ගනලේ සිරි කියලී, මෙඝාවලි (දෙදෙනෙකුගේ) ශොභාව ප්‍රකාශකෙළේයි.

නමස්කාරකලාවූ හෝ යටහත්වූ සත්ව නමැති හැල්කෙත්ට සම්පත් නමැති සිහිල්දියද, වෛරිජන නමැති මහවනයෙහි අමනොඥවූ භය නමැති සෙනද දෙන්නාවූ ඒ දිව්‍යරාජයාගේ නලල් නමැති පර්වතතටයෙහි ඉතා නිල්පැහැයෙන් යුක්තව නැඟි පෙනන භ්‍රෑයුග්මය වලාපටල දෙදෙනෙකුගේ සොභාව දක්වී.

81. ස තු රැ සුර අඳුරැ එකපැහැර දුරැක ළ
මි තු රැ තඹුරැ වන නිරතුරැ පුබුදුක ළ
අ තු රැ තුසර සිඳුවන දැකුමෙන් පහ ළ
ල හි රැ සිරින් දිලිහිනි හිමි නෙත් සග ළ

81. සතුරැ, විරුද්ධවූ; සුර, දෙවතා නමැති; අඳුරැ, අන්ධකාරය; එකපැහැර, එකප්‍රහාරයෙන්; දුරැකළ, නිරාසයකළාවූ; මිතුරැ තඹුරැවන, මිත්‍ර නමැති තාමරසවනය; නිරතුරැ, නිරන්තරයෙන්; පුබුදුකළ, ප්‍රබුධකළාවූ; පහළ, ප්‍රකාශවූ; අතුරැ, අන්තරාය නමැති; තුසර, තුෂාරයන්; දැකුමෙන්, දර්ශනයෙන්; සිඳුවන, ශුෂ්කකර වන්නාවූ; හිමි, ස්වාමීහුගේ; නෙත්සගළ, නෙත්‍රයුග්මයතෙම; ලහිරැ සිරින්, බාලාක (මණ්ඩල) ශොභාවෙන්; දිලිහිනි, උජ්ජ්වලිතවිය.

විපක්ෂවූ දෙවතා නමැති අන්ධකාරය එකහෙලා දුරැකළාවූ මිත්‍ර නමැති නෙළුම්වනය නිරන්තරව පුබුදුකළාවූ, පැමිණිසිටි විපත් නමැති පිනි දැකීම පමණින් සිඳුවන්නාවූ, ඒ විහිඟණ දෙව් ස්වාමීහුගේ නෙත්‍රයුග්මය උදාසණ හිරුමඬල මෙන් දීප්තිමත්විය.

82. ස ස ගා නකළ තැනැ තැනැ සිදඟනන් සැ දී
නොල ගා එහිමි දිගුතුඟු නැහැයට වොරැ දී
ස ම ගා රදුන් දෙවියන් සෙවමින් නිසැ දී
මු ර ගා අහෝ මිණි කාලම වෙහෙස වි දී

82. සැදී, අලඞ්කෘතවූ; සිදඟනන්, සිද්ධාඞ්ගනාවන් විසින්; තැනැතැනැ, ඒ ඒ ස්ථානයෙහි; ගානකළ, ගායනාකරනලද්දාවූ; යස, කීර්ති ඇත්තාවූ; එහිමි, ඒ (දිව්‍ය) රාජයාගේ; දිගු, දීර්ඝවූ; තුඟු, උත්තුඞ්ගවූ; වොරැදී, විරාජමානවූ; නැහැයට, නාසිකාවට; නොලගා, (ආකාරසදෘශයෙන්) ආසන්නනොවී; මිණි කාලම, (ඉඳුනීල) මාණික්‍යකාහලයතෙම; රදුන්, රජදරුවන් හා; දෙවියන්, දෙවතාවන්; සමගා, එක්ව; නිසැදී, නිරන්තරයෙන්; සෙවමින්, සෙවනයකෙරෙමින්; මුරගා, උද්ඝොෂණයකොට; වෙහෙස විදී, දුක් විඳී; අහෝ, ඛෙදයෙකි.

(ආභරණාදියෙන් හා රූපලාවණ්‍යයෙන්) සැරසුනාවූ සිද්ධාඞ්ගනාවන් විසින්, තන්හි තන්හි ගායනාකරනලද කීර්ති ඇත්තාවූ ඒ දෙව්ස්වාමීහුගේ දීර්ඝවූ උස්ව බබලන නාසයට ළංනොවීමෙන් නොහොත් එහි ආකාරය නොලැබීමෙන්, මිණි හොරණෑ තෙමේ රජුන් හා දෙවියන් නිරතුරුව සෙවනයකරමින් (ඒ දෙවරජහුගේ නාසයෙහි ස්වභාවය පතා) මුරගසා, අහෝ දුක්විඳියි.

83. සි රි ස ර හිඟුල්විලැ සේහසවැලෙව් ග න
සු ර ව ර සලෙල රතලවනත දළ දුල න
ම න හ ර සඳවලාපෙළ කෙළවර පෙනෙ න
පැහැ ස ර ලසඳ සුවලෙක් ඇත්නම් එමෙ න

83. සිරිසර, ශ්‍රීසාරවූ; හිඟුල්විලැ, හිඞ්ගුලතටාකයෙක්හි; ගන, සාන්ද්‍රවූ: සේහසවැලෙව්, ශ්වෙතහංසාවලි (යුග්මයක්) හා සමානවූ; සුරවර, දිව්‍යරාජයාගේ; සලෙල, ලීලාසහිතවූ; රතලවනත, රක්තාධරාන්තයෙහි; දුලන, දිලියෙන්නාවූ; දළ, දංෂ්ට්‍රා (යුග්මය) තෙම; මනහර, මනොඥවූ; සඳවලාපෙළ, සන්ධ්‍යාභ්‍රපංක්තියගේ; කෙළවර, අවසානයෙහි; පෙනෙන, දෘශ්‍යමානවූ; පැහැසර, ප්‍රභාසාරවූ; ලසඳසුවලෙක්, බාලචන්ද්‍රයුග්මයෙක්; ඇත්නම්, විද්‍යමාන වීනම්; එමෙන, ඒ සමානයි.

ශ්‍රීසාරවූ සාදිලිංගම් විලෙක්හි ඝනවසිටි ශ්වෙතහංස දෙපෙළක් වැනි, (මෙසින් දත්දෙපෙළ කියා); ඒ දෙව්රජහුගේ ලීලාසහිතවූ රත්පැහැති දෙතොල කෙළවර දිලිහෙන්නාවූ මහදළ දෙක, මනොහරවූ සන්ධ්‍යාවලාපඞ්ක්තියක්හුගේ අවසානයෙහි පෙනෙන ප්‍රභාමත්වූ බාලචන්ද්‍රයුග්මයෙක් ඇත්නම් එවැනිවේ.

84. ක නා මිණිවලලු නැඟි රුස් මල්කැනැ ති
ම නා දිගු ඇඟිලි නවතඹ ලපලු ඇ ති
ද නා කැමති දෙන පලඹන එසුරප තී
දි නා දිමුතු අතුසිරි සුරතුරු පැව ති

84. කනාමිණි වලලු, කනකමාණික්‍යයෙන් නිර්මිතවූ කටකයෙන්; නැඟි, උද්ගතවූ; රුස්, රශ්මි නමැති; මල්කැනැති, පුෂ්පස්තවක ඇත්තාවූ; මනා, යහපත්වූ; දිගුඇඟිලි, දීර්ඝාඞ්ගුලි නැමති; නව, අභිනවවූ; තඹ, රක්තාවර්ණවූ; ලපලු ඇති, බාලපල්ලවයන් ඇත්තාවූ; දනා, ජනයන්ට; කැමතිදෙන, අභිමත (වස්තු) ප්‍රදානය කරන්නාවූ; එසුරපති පලඹන, ඒ විභිෂණ දිව්‍යරාජයාගේ ප්‍රලම්බහස්තයතෙම; සුරතුරු පැවැති, කල්පවෘක්ෂයෙහි ප්‍රවෘත්තවූ; දිමුතු, දීප්තිමත්වූ; අතුසිරි, ශාඛාවිභූතිය; දිනා, ජයගනියි.

ස්වර්ණමයවූද මාණික්‍යමයවූද වලලුවලින් නැංගාවූ දීප්තිනමැති මල්කැන් ඇති, මනොඥවූ දික්ඇඟිලි නමැති අභිනවවූ තඹපැහැයෙන් යුත් ලාදලු ඇති, මනුෂ්‍යයන්ට රිසිවූ දේ දෙන්නාවූ ඒ විභීෂණදෙව්රජහුගේ ලම්බමානවූ හස්තය, කල්පවෘක්ෂයෙහි පැවති දිලිහීම් සහිතවූ ශාඛාසොභාව පරදවයි.

| | | | |
|---|---|---|---|
| 85. පා නා | සෙනෙහෙ සසිනිදු මඳලස බැ | ල් | ම |
| ගා නා | නිමහනෙව් දෙව්හන නෙත් කැ | ල් | ම |
| නා නා | සුරිඳු පුළුලුර සිරිසඳ ඇ | ල් | ම |
| නු නා | කෙළිනා ගලතල වැනි ඉඳුනි | ල් | ම |

85. දෙව්හන, දිව්‍යාඞ්ගනාවන්ගේ; සෙනෙහෙ පානා, ස්නේහ ප්‍රකාශකරන්නාවූ; සසිනිදු, සස්නිග්ධවූ; මඳලස බැල්ම, මඳලස නිරීක්‍ෂණය කරණකොට ගෙන; ගානා, ආලේපය කරනුලබන්නාවූ; නිමහනෙව්, සමාප්තකර්මයෙහි කරනලද අඤ්ජනරේඛා සමානවූ; නෙත්කැල්ම, නෙත්‍රකාන්ති (නමැති ජල) යෙන්; නානා, ස්නානයකරන්නාවූ; සුරිඳු පුළුලුර, (ඒ සුරේන්ද්‍රයාගේ) පෘථුලවූ වක්‍ෂස්ථලය; සිරිසඳ, ශ්‍රීකාන්තාව විසින්; ඇල්ම, අනුරාගය; නුනා, මුක්තනොකොට; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; ඉඳුනිල්ම, ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ; ගලතල වැනි, ශිලාතලයක් මෙනි.

දිව්‍යස්ත්‍රීන්ගේ සෙනහය දක්වන්නාවූ මෘදුගතියෙන් යුක්තවූ මඳක් අලසස්වභාවෙන් යුත් බැල්ම නිසා, චිත්‍රකර්මයක්හුගේ නිම්මාවෙහිදී ගාන අඳුන්රේඛා වැනි (දෙව්හනන්ගේම) නෙත්‍රකාන්ති නමැති ජලයෙන් ස්නානය කරන්නාවූ ඒ විභීෂණදිව්‍යරාජයාගේ පළල්වූ ලය, ශ්‍රීදේවිය විසින් ආලය සහිතව ක්‍රීඩාකරන්නාවූ ඉන්ද්‍ර නීලමාණික්‍ය ශිලාතලයක් මෙනි.

| | | | |
|---|---|---|---|
| 86. ල කු | ළු | පුළුලුකුළ වටබිමැ එසුරවි | රැ |
| වෙ ර | ළු | මිණි කැලුම් පතරින් මෙවුලතු | රැ |
| නැ බු | ළු | සොඳුරු සුසිලිටු වටොර රඹතු | රැ |
| බැ බ | ළු | සිලිල් ඉසිනා විලස සිරි දූ | රැ |

86. එසුරවිරු, ඒ විභීෂණනම් සුරවීරයාගේ; පුළුලුකුළවටබිමැ, පෘථුලවූ ශ්‍රෝණි නමැති වෘත්ත භූමියෙහි; ලකුළු, අලඞ්කෘතවූ; මෙවුලතුරු, මේඛලාන්තරයෙහි; වෙරළුමිණි කැලුම් පතරින්, වෛදූර්‍ය්‍ය මාණික්‍යකාන්ති සමූහය කරණකොටගෙන; නැබුළු, මහත්වූ; සොඳුරු, සුන්දරවූ; සුසිලිටු, සුශ්ලිෂ්ටවූ; වටොර රඹතුරු, වෘත්තවූ ඌරු (මඤය) නමැති රම්භාවෘක්‍ෂයෝ; බැබළු, භ්‍රාජිතවූ; සිලිල් ඉසිනාවිලස සිරි, ජලසේචනයකරන්නාවූ විලාසශ්‍රිය; දූරු ධාරණයකළාහුයි.

ඒ විභීෂණ දෙව්රජහුගේ උකුළු නමැති වටවූ භූමියෙහි, අලඞ්කෘතවූ මේඛලාදාමය අතරතුර බැඳි වෛදූර්‍ය්‍ය මාණික්‍ය ප්‍රභා රාශියනිසා, සුශ්ලිෂ්ටගති ඇති වටවූ කලවා නමැති රම්භාවෘක්‍ෂයෝ දීප්තිමත්වූ දියඉසීමක් ලබන්නාන් මෙනි.

87. ච ඳ නා සුරන් කිරුළඟ රුවනකැලුමෙ නා
බ ඳ නා කොමල ලතුවිලසළු රතින් ම නා
ම ඬ නා බැවින් සියපත් එහිමි පතුලෙ නා
බියෙ නා ලතඹ හෝපලු සදිසි වෙවුල නා

87. වඳනා, නමස්කාර කරන්නාවූ; සුරන්, දෙවතාවන්ගේ; කිරුළඟ, කිරීටාග්‍රයෙහි; රුවනකැලුමෙනා, (පද්මරාග) මාණික්‍ය කාන්ති හෙතුකොටගෙන; බඳනා, බන්‍ධනයකරන්නාවූ; කොමල, කොමලවූ; ලතුවිලසළු, ලාක්‍ෂාරසවිලාසය එළවූවාවූ; රතින්, රක්තවර්ණයෙන්; මනා, යහපත්වූ; එහිමි පතුලෙනා, ඒ ස්වාමිහුගේ පාදතලයෙන්; සියපත්, පද්ම දේහෝ නොහොත් පද්මපිට; මඬනා බැවින්, මර්දනයකරන හෙයින්; ලතඹහෝපලු, බාලවූ රක්තාශොකපල්ලවයෝ; බියෙනා, භිතියෙන්; වෙවුලනා සදිසි, කම්පාවන්නවුන් වැන්නහුය.

වඳින දෙවියන්ගේ ඔටුනුමුදුනෙහි බැඳි ලාකඩදිය දූක්වූ මනා රත්පැහැයෙන් යුත්, ඒ විභීෂණදෙව්රජහුගේ පත්ලෙන් පද්මයන් මඩිත හෙයින්, තරුණවූ අශොකපල්ලවයෝ ඒ මැඩීම් පීඩාව සඳහා භයින් චලිතවන්නාන් වැන්නෝය.

88. වෙසෙසින් පහන් පැහැසර ගැඹුරු පිවිතු රු
බැ ලු ව න් ඇලුම්කරවන යළිදු බියක රු
සි රි පි න් රුවන් පිරි එසුරිඳු සයුරු යු රු
මු ව කි න් කියා නිමවිය හැකිද රූසි රු

88. වෙසෙසින්, විශෙෂයෙන්; පහන්, ප්‍රසන්නවූ; පැහැසර, ප්‍රභාසාරවූ; ගැඹුරු, ශීතොෂ්ණාදි දුඃඛපීඩාපහරණයකරනහෙයින් ගම්භිරවූ; පිවිතුරු, පවිත්‍රවූ; බැලුවන්, අවලොකනය කරන්නවුන්; ඇලුම්කරවන, ප්‍රෙම ඇතිකරවන්නාවූ; යළිදු, නැවතද; බියකරු, භයඞ්කරවූද; සිරිපින්, ශෞභාග්‍ය පූර්ණ (සම්පත්ති) නමැති; රුවන් පිරි, රත්නයෙන් සම්පූර්ණවූ; නොහොත්—සිරි, ලක්‍ෂ්මිය ගෙන් හා; පින්, පවිත්‍රවූ; රුවන්, රත්නයෙන්; පිරි, සම්පූර්ණවූ; සයුරු යුරු, සාගරය බඳුවූ ආකාර ඇති; එසුරිඳු, ඒ සුරෙන්‍ද්‍රයාගේ; රූසිරු, රූපසම්පත්තිය; මුවකින්, මුඛයකින්; කියා, කථනයකොට; නිමවිය හැකිද, සමාප්තියට පැමිණවියහැක්කේද (නොහැක්කේ මැයි).

ඉතා ප්‍රසන්න පැහැයෙන් යුත්, ගම්භීරභාවයෙන් හා නිර්මලභාවයෙන් බැලූබැලූවන් ආලයකරවන්නාවූද, ඉක්බිති 'භයගන්වන්නාවූද, ඓශ්වර්‍ය්‍යයෙන් හා පින් නැමැති රත්නයෙන්ද පිරුනාවූ නොහොත් ශ්‍රීදේවියගෙන් හා පිරිසිදු රත්නයන්ගෙන්ද යුක්තවූ සාගරය වැනි, ඒ විභීෂණදෙව්රජහුගේ රූපශ්‍රිය මුඛයකින් කියා නිමකළ හැක්කේද.

89. ලෙව් හට තමන් නම කිව රිසි දෙනවි සි නි
දෙ ව් තුරු සුරබි සුරමිණි සරිද කෙලෙ සි නි
ප ව් රෝදුක් දුරුරලන පොකුරඹ ලෙ සි නි
දෙ ව් වෙද ඇසෙන පමණෙකි වියතුන් බ සි නි

89. තමන් නම කිව, තමන්ගේ විභීෂණ යන නාමය උච්චාරණයකළ කල්හි; ලෙව්හට, ලොකයාට; රිසි දෙනවිසිනි, අභිමත (වස්තු) ප්‍රදානයකරන හෙයින්; දෙව්තුරු, (මදාරාදි) දිව්‍යවෘක්ෂය; සුරබි, කාමධෙනුය; සුරමිණි, චින්තාමාණික්‍යය යන මොහු; කෙලෙසිනි, කවරප්‍රකාරයෙකින්; සරිද, සදෘශවේද්ද; පොකුරඹ ලෙසිනි, පුෂ්කරයෙහි (ලගනතොවන්නාවූ) ජලය මෙන්; පව් රෝදුක්, පාප රොගදුඃඛ (යන දෙෂ); දුරුරලන, නිරාකරණය කරන්නාවූ; දෙව්වෙද, නාසත්‍යාදි දෙවවෛද්‍යයන් ඇතැයි කියා; වියතුන් බසිනි, ශාස්ත්‍රකාරක ව්‍යක්තයන්ගේ වචනයෙන්; ඇසෙන පමණෙකි, ශ්‍රවණවිෂයවන මාත්‍රයෙක්මැයි.

තමන්ගේ නාමය කී ප්‍රමාණයෙකින්ම ලෝවැස්සන්ට අභීෂ්ටාර්ථ දායකහෙයින් කප්රුකද සුරභිධෙනුවද චින්තාමාණික්‍යයද යන මොහු මේ දෙවරාජයාට කවරපරිද්දෙකින් සදෘශවන්නාහුද; එපමණක්ද නොව මේ දෙව්රජහු විසින් පාපරොග ව්‍යසනයන් පොකුරැපත දිය සෙයින් දුරුකරනහෙයින් දිව්‍යවෛද්‍යයන් ඇතැයි යනු පණ්ඩිතවාක්‍යයෙන් ඇසෙන ප්‍රමාණයෙකි.

90. ම න් පිණවන යසසිරි තෙද නැණ විපු ල
සෙ න් යුද ජය රජබව තනතුරු සිය ල
දෙ න් තෙන් පැතු විට සුඛවැඩ දිගාබ ල
පි න් නම් සත කළ දෙව්රජමය මෙක ල

90. මන්පිණවන, මනොපිණනයකරවන්නාවූ; යස, කීර්තිය; සිරි, ඓශ්වර්‍ය්‍යය; තෙද, තෙජසය; විපුලනැණ, මහත්වූ ඥාණය; සෙන්, සෙනාවය; යුදජය, යුධයෙහි ජයගැනීමය; රජබල,

රාජ්‍යප්‍රාප්තිය; සියලතනතුරු, (සේනාපත්‍යාදි) සකලස්ථානාන්තරය; සුඛවැඩ, මඞ්ගල්‍යාභිවෘද්ධිය; දිගා, දීර්ඝායුෂය; බල, කායශක්තිය (යන අභිමතාර්ථයන්); පැතූ විට, ප්‍රාර්ථනාකළ කාලයෙහි; දෙන්නෙන්, ප්‍රදානයකරනහෙයින්; සත කළ පින්නම්, සත්වයා විසින් කටයුතුවූ (අනවද්‍යවිපාකලක්ෂණවූ) කුශලයනම්; මෙකල, මේ කාලයෙහි; දෙව්රජමය, විභීෂණ දිව්‍යරාජයාමැයි.

මෙබඳු ගුණඇති හෙයින් සිත්පිණවන්නාවූද; කීර්තියද තේජසද මහත්වූ ඥාණයද සේනාවද යුධයෙහි ජයද රජබවද සියලු ස්ථානාන්තරද මනාවූ අභිවෘද්ධියද දීර්ඝායුසද කායශක්තියද යන මෙතෙක්ද, පැතූවිට දෙනහෙයින් ලෝවැස්සන් විසින් කටයුතුවූ කුශලකර්මයනම් මෙකල්හි ජීවමානවූ මේ විභීෂණ දෙව්රජහු (පිදීම) මැයි.

91. තු න් ලෝ තමා නතුකළ රවුළු සොහොවු රු
තු න් කල් බලා රම්දුට වූ ඉටුමිතු රු
තු න් වේ ඇදුරු පුලතිසිකුල මිණිමිතු රු
තු න් විටකම වඳුව එසුරිඳු පාතඹු රු

91. තුන්ලෝ, ස්වර්ගමර්ත්‍යපාතාල සඞ්ඛ්‍යාතවූ භුවනත්‍රයවාසීන්; තමා නතුකළ, තමහට අවනතකළාවූ; රවුළු සොහොවුරු, රාවණ මහරාජයාහට සහෝදරවූ; තුන්කල් බලා, (භූත භවිෂ්‍යත් වර්තමාන යන) කාලත්‍රය පරීක්ෂාකොට; රම්දුට, ශ්‍රීරාමචන්ද්‍රයාහට; ඉටුමිතුරුවූ, කල්‍යාණමිත්‍රවූ; තුන්වේඇදුරු, (ඍග්යජුර් සාම යන) වේදත්‍රයට ගුරුවූ; පුලතිසිකුල, පුලස්ති මහාඍෂීහුගේ වංශයට; මිණිමිතුරු, රත්නප්‍රදීපායමානවූ; එසුරිඳු, ඒ (විභීෂණ) දිව්‍යරාජයාගේ; පාතඹුරු, පාදපද්මය; තුන්විටකම, ත්‍රිවාරයෙක්හිම; වඳුව, නමස්කාරකරව.

තුන්ලෝවැස්සන් තමහට යටහත්කළාවූ රාවණයාගේ සහෝදරවූ තුන්කල්හිම වන අභිප්‍රාය සැලකීමෙන් රාමචන්ද්‍රයාහට කල්‍යාණමිත්‍රවූ, ත්‍රිවේදාචාර්යවූ පුලස්ති ඍෂීහුගේ වංශයට මැණික්පහනක් වැනිවූ ඒ විභීෂණ දෙව්රජහුගේ පාපියුම තුන්වාරයෙක්හිම වඳුව.

92. අනතුරු බලා අදහස අවසර විග ස
සුහුසුලුනොවී සලකා පසු පළමු බ ස
පෙරදූරිකොටම සුරිඳුට තියුවදන්ගො ස
සැලකර තගිය කටයුතු සිටැ එකත්ප ස

92. අනතුරු, තදනන්තරව; අදහස, (ඒ දෙව්රජහුගේ) අධ්‍යාශයද; අවසරවිගස, අවකාශක්ෂණයද; බලා, අවලෝකනයකොට; පුහුසුලුනොවී, ශීඝ්‍රශීලිනොව; පසුපලමුබස, පූර්වාපරවාක්‍ය (සම්බන්ධය); සලකා, වීමංසනයකොට; සුරිඳුට, ඒ සුරේන්ද්‍රයාට; තිසු වදන්ගොස, ස්තුතිවචන ඝොෂාව; පෙරදැරිකොටම, පූර්වාඞ්ගම කොටම; එකත්පස සිටැ, එක්පාර්ශ්වයෙක්හි අවස්ථානය කොට; නගිය කටයුතු, නාගිය කාර්‍ය්‍යය; සැලකර, ආරොචනයකර.

ඉක්බිති ඒ දිව්‍යරාජයාගේ අදහසද අවකාශකාලයද බලා ඉවසීම් සහිතව පසුව කියන්නාවූද පළමු කීවාවූද වචනයන් සිහිකොට ඒ දිව්‍යරාජයාට ස්තුතිවාක්‍ය ඝොෂාව පුරස්සරව තොප ගියාවූ කටයුත්ත මේ මතු දක්වන පරිද්දෙන් සැලකරව.

93. ත ර ස ර සුනෙර තදතෙද දිමුතු දිවයු ර
පු ව ත ර ගැඹර සමුදුර කැලුම නිලඹ ර
සොම්බ ර පවර නිසයුරු නුවණ සුරගු ර
සු ර ව ර සැරද විබිසණ නම් කැළණිපු ර

93. තරසර, ස්ථිරසාර ගුණයෙන්; සුනෙර, මහාමේරු පර්වත රාජයා වැනිවූ; තදතෙද, ස්තබ්ධතෙජසින්; දිමුතු, දීප්තිමත්වූ; දිවයුර, දිවාකරයා වැනිවූ; පුවතර, ප්‍රසිද්ධවූ; ගැඹර, ගම්භිරගුණයෙන්; සමුදුර, සමුද්‍රය වැනිවූ; කැලුම, (දෙහ) කාන්තියෙන්; නිලඹර, නීලාම්බරය හා සමානවූ; සොම්බර, සෞම්‍යභාරයෙන්; පවර, උත්තමවූ; නිසයුර, චන්ද්‍රයා වැනිවූ; නුවණ, ප්‍රඥාවෙන්; සුරගුර, වෘහස්පති වැනිවූ; කැලණිපුර, කල්‍යාණී පුරප්‍රවරාධිපතිවූ; විබිසණ නම් සුරවර, විභිෂණ නම් දෙව්රජානන්වහන්ස; සැරද, චිරකාලයක් ජිවත්වුව මැනවි.

ස්ථිරසාරත්වයෙන් මහමෙර වැනි, දැඩිවූ තෙජසින් දීප්තිමත් සූර්‍ය්‍යයා වැනි, විශාලත්වයෙන් හා ගම්භිරත්වයෙන් සාගරය වැනි, ශරීරකාන්තියෙන් නිල්වන් අහස වැනි, නුවණින් වෘහස්පති වැනි, කැලණිනුවරවාසී විභිෂණ නම් දිව්‍යරාජයා, චිරකාලයක් ජීවත් වේවා.

94. ර ජ කු ල සුපුල්විලැ රජහස වන් සර න
පෙ ර ම ල වියා වන් රුසිරෙන් මනනඳ න
හැ ම ක ල විපුල සව්සැපතින් නොඅඩුව න
තෙ ද බ ල විකුම් ගුණමිණිබරණින් තෙවු න

94. රජකුල, රජවංශ නමැති; සුපුල් විලැ, සුත්වූලලවූ පද්ම වනයෙහි; සරන, සඤ්චරණයකරන්නාවූ; රජහස වන්, රාජහංස යකු වැනිවූ; මනනඳන, මනොනන්දනාවූ; රුසිරෙන්; රූපශ්‍රියෙන්; පෙරමලවියා වන්, පූර්වමන්මථයා හා සමානවූ; හැමකල, සදාකාල යෙහි; විපුල, මහත්වූ; සව්සැපතින්, සකලසම්පත්තියෙන්; නොඅඩු වන, ඌනත්වයක් නැත්තාවූ; තෙදබලවිකුම් ගුණ, තෙජෝබල වික්‍රමගුණ නමැති; මිණිබරණින්, මාණික්‍යාභරණයෙන්; තෙවුන; විරාජමානවූ.

රජකුලය නමැති ප්‍රබුද්ධ තඩාගයෙහි හැසිරෙන රාජහංසයෙක් වැනිවූ සිත්සතුටුකරන රූපශොභාවෙන් පූර්වකාමදෙවයා වැනිවූ (උමයංගනාව හා මිත්‍රවූ කාමදෙවතෙම මඤ්කා විලාසයෙන් ඊශ්වරයාගේ ජටායෙහි සැඟවීහිඳ නික්ම යනකල කිපුනාවූ ඊශ්වරයා විසින් මහත් ගිනිදලක් විහිදුවා දැවූහෙයින් අනඞ්ගයාගේ පූර්වශරීරශොභාව විකලවූයේය යනුහෙයින් යිය) සියලුකල්හි අඩුනොවන්නාවූ සකලසම්පත්තින් පිරිසිපි, තෙජසය බලය වික්‍රමය යන මේ ගුණ නමැති මාණික්‍යාභරණයෙන් විරාජිතවූ.

95. ග රු ත ර නල්ලූරුතුනයා නමැති මැ ති
සි හි ක ර නිතර මහපුද පඬුරු දී රු ති
නො වි සි ර ඔබට දන්වනලෙස කී සිතැ ති
සු ර ව ර මඳක් කල් එපවත් ඇසිය යු ති

95. ගරුතර, අතිශයින් මහත්වූ; නල්ලූරුතුනයා නමැති; නල්ලූරුතුනයාභිධානවූ; මැති, (සෙනානායක) අමාත්‍යතෙම; නිතර සිහිකර, නිරන්තරයෙන් (ඔබවහන්සේ) සඳහන්කොට; රුති, අභිමතවූ; මහපුදපඬුරු දී, මහත්වූ පූජාප්‍රාභෘතයන් ප්‍රදානය කොට; සිතැති, (ස්වකීය) සන්තානාවර්තාඞ්වූ අභිප්‍රාය; නොවිසිර, විශිර්ණනොකොට හෙවත් අන්‍යවිහිතනොවී; ඔබට, ඔබවහන්සේට; දන්වනලෙස, විඥාපනයකරන පරිද්දෙන්; කී, කථනය කෙළේය; සුරවර, දිව්‍යරාජෝත්තමයානන්වහන්ස; එපවත්, (ඔහු විසින් කියා එවනලද) ඒ ප්‍රවෘත්තිය; මඳක් කල්, ස්වල්පමාත්‍ර කාලයක්; ඇසියයුති, ශ්‍රවණය කටයුත්තේයි.

ඉතා ගරුකටයුතු නල්ලූරුතුනයා නමැති මහාමාත්‍යතෙම, ඔබවහන්සේ සිහිකොට, නොකඩවි පවත්වනලද මහපූජා ඇතිව

රුචිවූ සතුටුපඬුරු දීමෙන්ද, තමා සිත්හි ඇති ආශාව නොවිහි දුවා ඔබවහන්සේට දන්වනුපිණිස ආරාධනා කළහ. දිව්‍යරාජයාණෙනි ඒ ප්‍රවෘත්තිය මඳවේලාවක් අසනු මැනවි.

96. රි වි කු ල ලමැණි ගොත් පිරිසිදු ගුවන් මැ ද
පැ හැදු ල සරාකල් පත් සහසකර බ ඳ
කිවි කැ ල ගෙළට මුතුහර වන් යසපබ ඳ
සි රි ක ල කුලනිවෙස් දිය පතළ තදතෙ ද

96. රිවිකුල, සූර්‍ය්‍යවංශයෙහි (ප්‍රවෘත්තවූ); ලමැණිගොත්, ලම්බකර්ණවංශ නමැති; පිරිසිදු, නිර්මලවූ; ගුවන් මැද, ගගනමධ්‍යයෙහි; සරාකල්පත්, ශරත්කාලයට ප්‍රාප්තවූ; පැහැදුල, ප්‍රභාවෙන් දිලියෙන්නාවූ; සහසකර බඳ, සහශ්‍රකිරණයා වැනිවූ; කිවිකැල කවිසමූහයාගේ; ගෙළට, කණ්ඨයට; මුතුහර වන්, මුක්තාහාරයක් බඳුවූ; යසපබඳ, කීර්තිප්‍රබන්ධ ඇත්තාවූ; සිරිකල, ශ්‍රීකාන්තාවට; කුලනිවෙස්, කුලගෘහයක් බඳුවූ; දියපතළ, ජගත්ව්‍යාප්තවූ; තද තෙද, සන්බද්ධතේජස් ඇති:

සූර්‍ය්‍යවංශය සම්බන්ධවූ ලම්බකර්ණවංශ නමැති නිර්මලාකාශය මධ්‍යයෙහි ප්‍රභාමත්වූ ශරත්සූර්‍ය්‍යයා වැනි, කවිජනයාගේ ග්‍රීවයෙහි මුක්තාහාරයක් වැනි කීර්තිරාශි ඇති, ශ්‍රීදේවියගේ කුලගෘහයක් වැනිවූ, ලොකයෙහි පැතිර සිටි දෘඪවූ තෙජස්ද ඇති:

97. හ ළ දුසිරිතන් දැනැ තෙවළා මුනිඳුබ ණ
කො ළ පත් සියල් අවිසිප් කිවිනළු සත ණ
ඔ ළ මොළ රුපුන් දප මැඬැ පෑ උපා නැ ණ
ක ළ මුළු මෙලක්දිව එකසේසත් සෙව ණ

97. තෙවළා මුනිඳුබණ, ත්‍රිපිටක බුද්ධවචනය; දැනැ, (ශ්‍රවණමය ඥානයෙන්) අවබොධකොට; දුසිරිතන්, දුශ්චරිතයන් හෙවත් දසඅකුසලකර්මපථයන්; හළ, පරිත්‍යාග කළාවූ; සියල් අවිසිප්, (චාපචක්‍රාදි) සියලු ආයුධශිල්ප හා; කිවිනළුසතණ, කාව්‍යනාටකාදි ශාස්ත්‍ර නමැති සමුද්‍රයාගේ; කොළපත්, කොටිප්‍රාප්තවූ; උපානැණ පෑ; (සාමදානාදි චතුර්විධ) උපායඥානය දක්වා; ඔළමොළ රුපුන්, උද්දාම ගුණයෙන් ප්‍රචණ්ඩවූ ශත්‍රූන්ගේ; දප මැඬැ, දර්පමර්දනය කොට; මුළු මෙක්ලදිව, සමස්ත මේ ලඞ්කාද්වීපය; එකසේසත් සෙවණ කළ, එකශ්වේතච්ඡත්‍ර ඡායාවට පැමිණවූ.

සර්වඥයන්වහන්සේගේ ත්‍රිපිටකධර්මය උද්ග්‍රහණ ධාරණ කිරීමෙන් පාපයන් දුරුකළාවූද, සියලු ආයුධශිල්ප හා කාව්‍යනාටක ශාස්ත්‍ර නමැති සාගරයෙහි එතර දුටුවාවූද, ප්‍රකර්ෂයෙන් දැඩිවූ සතුරන්ගේ එඩිමැඩීමෙන් උපායඥනය දක්වූවාවූද, මේ මුළුලක් දිව්හිම පවත්වනලද ආඥචක්‍ර ඇත්තාවූද:

98. සත නෙත දුන් රූසිරි රසඅ  දු න් ව න
පත නරලොව පුරදුරු සිරි අ  දු න් ව න
විකුමෙන් දඹදිවැ නිරිඳුන් මු  දු න් ව න
අප පැරකුම් නිරිඳුට දුල  දු න් ව න

98. සතනෙත දුන්, (සකල) සත්වයාගේ නෙත්‍රයට (ආලම්බන වශයෙන්) දෙනලද්දාවූ; රසඅදුන් වන, රසාජනයක් හා සමානවූ; රූසිරි, රූපශ්‍රී ඇත්තාවූ; නරලොව පත, මනුෂ්‍යලොකප්‍රාප්තවූ; පුරදුරුසිරි, පුරන්‍දරශ්‍රිය; අදුන්වන, ප්‍රත්‍යභිඥනය කරවන්නාවූ; විකුමෙන්, වික්‍රමයෙන්; දඹදිවැ නිරිඳුන්, ජම්බුද්වීපයෙහි නරෙන්‍ද්‍රයන්ට; මුදුන්වන, ශිරොභූතවූ; අප පැරකුම් නිරිඳුට, අපගේ ශ්‍රී පරාක්‍රමබාහු රාජෝත්තමයානන්ට; දුලඳුන් වන, දුහිතෘභාවයම (පැමිණ තරුණවයසෙහි) සිටියාවූ.

සත්වයන්ගේ ඇස්හි දෙනලද රසාජන වැනිවූ රූපශ්‍රී ඇති, මිනිස් ලොවට පැමිණි ශක්‍රයාගේ ස්වභාව හඳුන්වන්නාවූ, වික්‍රමයෙන් දඹදිව රජුන් කෙරෙහි අධිපතිව සිටි, අපගේ පරාක්‍රමබාහු මහරජතුමාට දුහිතෘවූ තරුණ කුමාරියක් වන:

99. සි රි ස ඳ ව න් සව්සිරි දියුණුවැ රඳ  න
සි තු මි ණ ව න් යදි යදිනට දනින් දෙ  න
ස ර ස වි ව න් නුවණින් පහළවැ පෙනෙ  න
න ව ස ඳ ව න් ලෙව්වැසි අදරින් වඳි  න

99. සව්සිරි, සියලු (ද්‍රව්‍ය) සම්පත්තිය; දියුණුවැ, අධිකව; රඳන, රඤ්ජමානවූ; සිරිසඳ වන්, ශ්‍රීකාන්තාව හා සමානවූ; යදි, යාච්ඤකළාවූ; යදිනට, යාචකයන්ට; දෙන, පරිත්‍යාගකරන්නාවූ; දනින්, වස්තුව කරණකොටගෙන; සිතුමිණ වන්, චින්තාමාණික්‍යය බඳුවූ; නුවණින්, බුද්ධියෙන්; පහළවැ පෙණෙන, ප්‍රකාශව දෘශ්‍යමානවූ; සරසවි වන්, සරස්වතී හා සමානවූ; ලෙව්වැසි, ලොකවාසීහු; අදරින්, ආදරයෙන්; වඳින, නමස්කාරකරනුලබන්නාවූ; නවසඳ වන්, අභිනව චන්‍ද්‍ර (ලෙඛාවක්) බඳුවූ.

සියලුඉසුරෙන් වැඩිසිටි ශ්‍රීදෙවිය වැනිවූද යාචකජනයාකෙරෙහි පවත්වනලද ත්‍යාගයෙන් චින්තාමාණික්‍යය සමානවූද, ප්‍රකාශව පෙනෙන්නාවූ ඥාණයෙන් සරස්වතිය වැනිවූද, ලෝවැස්සන් විසින් ආදර සහිතව නමස්කාර කරනු ලබන්නාවූ අභිනව චන්ද්‍ර යෙක් වැනිවූද:

100. යෙහෙළින් කෙරේ සකිසැප සමග සි ත් මේ
කුළුණෙන් දුසිඳුසුන් වෙතැ වසින ව ත් මේ
රකි මි න් පතිනිදම් යහපත් සිරි ත් මේ
සිහිනෙ න් නිපන් වැනි දසපින් පැවැ ත් මේ

100. යෙහෙළින් කෙරේ, සර්ව්ජනයන් කෙරෙහි; සකිසැප, ස්වකීයසම්පත්තියෙහි; සමග, (වෙනස්නැතිව) සමගිව පවත්නාවූ; සිත්මේ, චිත්තයක්ම ඇතිවූ; කුළුණෙන්, කරුණාවෙන්; දුසිඳුසුන් වෙතැ, දුසිදුසයන් කෙරෙහි; වත්මේ, වස්තු නමැති මේඝය; වසින, වර්ෂණය කරන්නාවූ; පතිනිදම්, පතිව්‍රතා ධර්මය හා; මේ, මෙධ්‍යවූ හෙවත් පවිත්‍රවූ; යහපත් සිරිත්, මනොඥවූ චාරිත්‍රයන්; රකිමින්, රක්ෂාකරමින්; දසපින්පැවැත්මේ, (දානශීලාදී) දශපුණ්‍ය ක්‍රියාවස්තූන් ප්‍රවර්තනයෙහි; සිහිනෙන් නිපන් වැනි, සිහිනුවණින් උපන්නියක් වැනිවූ.

සර්ව්ජනයා කෙරෙහි ස්වකීය සම්පත්තියෙන් විශෙෂයක් නො දක්වන්නාවූ නොහොත් සියසැපත් අනුභවයෙහි සමසිත් ඇති, දුසිදුසයන් කෙරෙහි කරුණාවෙන් පවත්වනලද වස්තු නමැති මේඝ ඇති, පතිව්‍රතාධර්මය හා පවිත්‍ර චාරිත්‍රයන් රකිමින් සිටින, දශවිධ කුශලකර්මයන් රැකීමෙහි සිහි ඇතිවම උපන් තැනැත්තියක් වැනිවූ.

101. මි හි රි තෙපලැ තන්වැසි කිවිකම් පුරු දු
ඉ ති රි බැතිපෙමැති පෙළඳහමෙහි මුනි දු
නොහැරි පෝයැ අටසිල් රැකුම පිරිසි දු
ස සි රි උලකුඩයදේවිහට පසි දු

101. මිහිරිතෙපලැ තන්වැසි, මධුර වචනයෙහි නොපිපිසරවූ හෙවත් ප්‍රස්තාවොචිතකොට ප්‍රියතෙපුල් කීමෙහි දක්ෂවූ; කිවිකම් පුරුදු, කාව්‍යකර්මයෙහි පරිචිතවූ හෙවත් ගද්‍ය පද්‍යබන්ධන යමක

ප්‍රහෙළිකා ක්‍රියාගුප්තක අක්‍ෂරෞච්ත්‍ය ගූඪක චතුර්ථාදිවූ අංගනක කවික්‍රියායෙහි දක්‍ෂවූ; මුනිඳු, මුනීන්‍ද්‍රවූ සර්වඥයන්වහන්සේගේ; පෙළිදහමෙහි, (ත්‍රිපිටක) පාලිධර්මයෙහි; ඉතිරි, අධිකවූ; බැතිපෙමැති, භක්තිප්‍රේම ඇති; පෝය, උපොසථ දිනයෙහි; පිරිසිදු, නිර්මලවූ; අටසිල් රැකුම, අෂ්ටාංගශීලරක්‍ෂණය; නොහැරී, වර්ජනය නොකළාවූ; පසිදු, ප්‍රසිද්ධවූ; සසිරි, සශ්‍රිකවූ; උලකුඩය දේවීහට, උලකුඩයදෙවි නම්වූ රාජකුමාරිකාවට.

මධුරකථායෙහි චතුරවූ හෙවත් සමර්ථභාවයක් ඇත්තාවූද, කවිකර්මයෙහි පුරුදුවූද; සර්වඥයන්වහන්සේගේ ත්‍රිපිටක ධර්මය කෙරෙහි බොහෝවූ භක්තිප්‍රේම ඇති, උපොසථ දිනයෙහි නොකඩ කළාවූ අෂ්ටාඞ්ගශීල සමාදානයෙන් යුත්, ප්‍රසිද්ධවූද ශ්‍රීමත්වූද උල කුඩය දේවියට.

102. දි ත් රුපු සිළු මල්දම් සුවඳ මී වැ ස
තෙත් සිරිපා යුත් සුරිඳුනි තිලෝඇ ස
සි ත් පිණවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුන මැනවි නිසිලෙස

102. දිත්රුපු සිළු, දෛත්‍යාරීන්ගේ (කිරීට) ශිඛාවන්හි; මල් දම්, මාලාදාමයන්ගේ; සුවඳමී වැස, සුගන්ධමකරන්ද වර්ෂණයකොට; තෙත්, ආර්ද්‍රවූ; සිරිපා යුත්, ශ්‍රීපාදයෙන් යුක්තවූ; තිලෝඇස, ත්‍රෛලොක්‍යනෙත්‍රවූ; සුරිඳුනි, එම්බා විභීෂණ නම් සුරරාජයානෙනි; සිත් පිණවන, ජනමනොරඤ්ජනය කරවන්නාවූ; ආ, ආයුසය; සිරි, (ත්‍රිවර්ග) සම්පත්තිය; නුවණ, ප්‍රඥාවය; යස, කීර්තිය යන මෙකී ගුණයන්; ඇති, විද්‍යමානවූ; සොඳ, සුන්දරවූ; පුත්රුවනක්, පුත්‍රරත්නයක්; නිසිලෙස, යොග්‍යවූ පරිද්දෙන්; දුනමැනවි ප්‍රදානයකළ මැනවි.

දෙවියන්ගේ මෞලිමාලාදාමයන්හි වූ සුගන්ධමධු වර්ෂණයෙන් තෙත්වූ ශ්‍රීපාද ඇති, තුන්ලොවට ඇසක් වැනිවූ සුරෙන්ද්‍රයානෙනි, සිත් සතුටුකරවන ගුණයෙන් හා ආයුසශ්‍රීයෙන්ද ඥානයෙන්ද කීර්තියෙන්ද යුත් යහපත්වූ පුත්‍රරත්නයක් දුනමැනවි.

103. කි ස ව ට පළමු රත්නාවලි නම් සොඳු රු
ස හ තු ට දෙවූ හිමි දිවැසින් කුලුණු පි රු
මෙලක ට ඉසුරුවී පැරකුම් රජකුම රු
පළකො ට කිමෙක ඔබ සොඳ තෙදබල මහරු

**103.** පළමු, පූර්වකාලයෙහි; සොඳුරු, සෞන්දර්යයෙන් යුක්තවූ; රත්නාවලි නම් බිසවට, (මහලු විජයබාහු නම් රජ්ජුරුවන්ගේ දූවූ මානාභරණ රජ්ජුරුවන්ට බිසෝවූ) රත්නාවලි නම් බිසවට; හිමි, ස්වාමීහු විසින්; කුලුණුපිරු, කරුණාපූර්ණවූ; දිවැසින්, දිව්‍යාක්ෂියෙන්; සහතුට, සන්තොෂ සහිතව; දෙවු, ප්‍රදානයකරවූ; පැරකුම් රජකුමරු, පරාක්‍රමබාහු රාජකුමාරතෙම; මෙලකට ඉසුරුවී මේ ලඞ්කාවීපයට අධිපතිවූයේය; ඔබ, නුඹවහන්සේගේ; සොඳ සාධුවූ; මහරු, මහාර්ඝවූ; තෙදබල, තෙජෝබලය; පළකොට කිමෙක, ප්‍රකාශකොට (කියනු) කිම.

සිත් පිණවන්නාවූ රත්නාවලි නම් බිසවහට, දිවැසින් යුත් කරුණාභරිතවූ ස්වාමිහු විසින් පූර්වයෙහි දෙනලද පරාක්‍රමබාහු රාජකුමාරයා මේ මුළුලක්දිවට රජවිය; එහෙයින් යහපත්වූ ඔබවහන්සේගේ මහාර්ඝ තෙජෝබලමහිමය කුමට කියනුද.

104. එසෙයින් දෑසමන් මහනෙල් කුසුම් ගෙ   න
පුද මින් එසුරවර සිරිසණ වදිමි   න
බුහු මන් කරන රජදූසඳුට මෙකිය   න
දු න පින් සමග යසසිරි වඩි පුත්රුව   න

104. එසෙයින්, ඒ කාරණයෙන්; දෑසමන් මහනෙල් කුසුම් ගෙන, ජාතිසුමනපුෂ්ප රක්තොත්පල පුෂ්පයන් ගෙන; පුදමින්, පූජාකරමින්; සුරවර, සුරොත්තමයාගේ; සිරිසරණ වඳිමින,ශ්‍රී පාදය නමස්කාරකරමින්; බුහුමන් කරන, බහුමානකරන්නාවූ; මෙකියන, මේ යථොක්තවූ; ඒ රජදූසඳුට, ඒ උත්තම රාජදුහිතෘවට; පුත් රුවන, පුත්‍රරත්නය; දුන, ප්‍රදානයකළහොත්; පින් සමග, පින් හා සමග; යසසිරි වඩි, කීර්තිශ්‍රිවර්ධනය වන්නේයි.

එබැවින් දෑසමන්මල් හා මහනෙල්මල්ද ගෙන පූජාකෙරෙමින් දෙවෙන්ද්‍රයාගේ ශ්‍රිපතුල් වඳිමින් බුහුමන් කරන්නාවූ මේ කියන ලද ඒ උතුම් රජකුමරියට පුත්රුවනක් දුනහොත් එයින් ජනිතවූ කුශලය හා එක්ව ඔබගේ කීර්තිශ්‍රියද වර්ධනයවේ.

105. මෙහසුන් සුරිඳුහට සැලකර මෙ   සේ යා
වඳි මි න් බැතින් පැදකුණුකොට තො සේ යා
දකි මි න් බිසෝ දෙවියන් ගොවල   සේ යා
කිය මි න් යදින් සඝසඳ මෙම ලෙ   සේ යා

105. මෙහසුන්, මේ (යථොක්ත) සන්දෙශය; සුරිඳුහට, (විභීෂණ නම් සුරෙන්ද්‍රයාට; මෙසේයා, එතන් ප්‍රකාරයෙන්; සැලකර, විඥපනයකොට; බැතින්, භක්තියෙන්; වඳිමින්, නමස්කාරකරමින්; තොසේයා, සන්තොෂ (චිත්ත) යෙන්; පැදකුණුකොට, ප්‍රදක්ෂිණකොට; බිසෝ දෙවියන්, (සුරෙන්ද්‍රයාහට) අග්‍රමහෙසිකාවූ දෙවතාදූන්; දකිමින්, දර්ශනයකරමින්; නොවලසේයා, (එතැන්හි) ප්‍රමාදනොවී; සකිසඳ, මිත්‍රොත්තමය; මෙම ලෙසේයා, මෙම පරිද්දෙන්; කියමින්, කථනය කරමින්; යදින්, යාච්ඤා කරන්.

මේ සන්දෙශවාක්‍යය ඒ විභීෂණ දෙවිරජහට මෙසේ සැලකොට අභිවාදනයකරමින්, භක්තියෙන් හා සතුටුසිතින් යුක්තව ප්‍රදක්ෂිණකොට ඒ දෙවිරජහුගේ බිසෝවූ දෙවතාදූන් දකිමින් මිත්‍රොත්තමය අලසනොවී මේ පෙර කී සේම අයදින්න.

106. පැහැ ප ත් පුන්සඳෙව් කිරිසමුදුරු පලි ට
සියගො ත් බබුලුවන දෙවුරජ කුමරහ ට
නැව ත ත් එකලාව අවසර ලැබුනු වි ට
මෙ ප ව ත් කියව සැලකරනුව සුරරදු ට

106. කිරිසමුදුරු, ක්ෂීරසාගරයෙහි; පළිට, ප්‍රකටවූ හෙවත් පතළාවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; පුන්සඳෙව්, පූර්ණචන්ද්‍රයා මෙන්; සියගොත්, ස්වකීයවූ (පුලස්ති) ගොත්‍රය; බබුලුවන, දීප්තිමත් කරවන්නාවූ; දෙව්රජකුමරහට, දිව්‍යරාජයාට පුත්‍රවූ කුමාරදෙවියන්ට; නැවතත්, නිවෘත්තිමත්ව හෙවත් දෙවෙනිවත්; එකලාව, එකාකීව; අවසර ලැබුනු විට, අවකාශලාභ ප්‍රාප්ත කල්හි හෙවත් ප්‍රාප්තාවසරයෙහි; සුරරදුට, (ඒ විභීෂණ) දිව්‍යරාජයාට; සැලකරනුව, විඥපනයකරන පිණිස; මෙපවත්, මේ ප්‍රවෘත්තිය; කියව, කථනය කරව.

ප්‍රසිද්ධවූ ස්වකීයගොත්‍ර නමැති කිරිමුහුදට ප්‍රභාමත් පූර්ණචන්ද්‍රයා සම්සේද (චන්ද්‍රරශ්මීන් සාගරය ඔජාභිවෘද්ධියට පැමිණේ) එමෙන් ස්වකීයගොත්‍රය බබුලුවන්නාවූ, දිව්‍යරාජකුමාරයාට (එනම් විභීෂණ දෙවිරජහුගේ පුත්‍රකුමාරයාහට) නැවත හුදකලාව අවකාශලැබුනු විටෙක ඒ විභීෂණ දෙවිරජුට සැලකරනපිණිස මේ පෙරකී ප්‍රවෘත්තිය මතක්කරව.

107. මේ සියලුම අදහස කුළුණෙන් ගිහි ණී
සේ සිය පතක් සලසා උදයෑ දිනම් ණී
නෑසිය ඉටුමිතුරු සමගින් සැළලිහි ණී
වාසිය පවතු සිතුලෙස සැපතින් පැමි ණී

107. සැළලිහිණී, ශාරිකාපක්ෂි (රාජෝත්තම) ය; මේ සියලුම අදහස, මේ (යථොක්තප්‍රකාරයෙන් උද්දිෂ්ටවූ) සියලුම අධ්‍යාසය; ගිහිණී, (චිත්තයෙන්) ග්‍රහණයකරනලද්දාවූ නොහොත් ගහණවූ; කුළුණෙන්, කරුණාවිශෙෂය හෙතුකොටගෙන; දිනමිණි උදයෑ, (නභොමණ්ඩලොද්ගතව දිනරත්න නම්වූ) සහශ්‍රරශ්මිහු උදාවූ කාලයෙහි; සියපතක් සේ, ශතපත්‍රයක් මෙන්; සලසා, සම්‍යක් භාවයට අර්ථ කියා සම්බන්ධියට පමුණුවා (හෙවත් උදාවූ පමණින් ඒ හිරුගේ අන්‍යප්‍රයොගයක් නැතිව පද්මය තෙමේම පත්‍රවිකාශාදියෙන් යුක්තව ප්‍රබුඩවේද එසේම මේ කීවාවූ වචන සංක්‍ෂෙප වචන වුවද මිත්‍රවශයෙන් ප්‍රාප්තවාර්ථා ප්‍රකාශකොට තමාගේ සර්වොචිත ප්‍රඥාවෙන් අනුකතාකාර විස්තරකොට පරීක්‍ෂාකිරීමෙන් නිෂ්පත්තියට පමුණුවා); සිතුලෙස, චිත්තානුකූල පරිද්දෙන්; පැමිණී, ප්‍රාප්තවූ; සැපතින්, (යොගක්‍ෂෙම) සම්පත්තියෙන් යුක්තව; නෑසිය ඉටුමිතුරු සමගින්, ඥාති ජනයා හා ස්වකීය පිරිවර ජනයන් හා ඉෂ්ටමිත්‍රයන් හා සහිතව; වාසිය පවතු, වර්ෂ ශතයක් (මුලුල්ලෙහි සැපසේ ජීවත්ව) පවතු හෙවත් ජීවිත සංරක්‍ෂණයෙහි යෙදී ජීවත්වීගන්.

කරුණාවෙන් ගහණවූ ශාරිකාපක්‍ෂිරාජය උදාවූ සූර්‍ය්‍යයා විසින් පුබුදුකරනලද පද්මයක් සේ මෙහි කියනලද සියලු අභිප්‍රාව සඵල බවට පමුණුවා, බන්ධු ස්වජනයන් හා ඉෂ්ටමිත්‍රයන් සමග පැමිණෙනලද සම්පත්ති ඇතිව සිත්වූ පරිද්දෙන් වර්ෂ සහශ්‍රයක් පවතු.

සැළලිහිණි අස්න නිමි.

108. පැ ර කු ම් රජුට පන්තිස්වන නවම්ම ස
ම න රං ම් කර බඳුතු මෙහසුන් නොවීල ස
අ ය දු ම් ලෙසට සිදුකරු කිවිඳු අදහ ස
දෙව් ර ම් මිතුරු දුනි ගැබ බිසවට සක ස

108. පැරකුම් රජුට, පරාක්‍රමබාහුරාජයාහට; පන්තිස්වන, පන්තිස්වන්නෙහි හෙවත් තිස්පස්වෙනි වර්‍ෂයෙහි; නවම්මස, මාඝමාශයෙහි; මෙහසුන්, මේ සන්දේශය; මනරම්කරු, මනොරම්‍යකොට; බඳුතු, බන්ධනකළ කල්හි; ලසනොවී, ප්‍රමාදනොව; අයදුම් ලෙසට, ආයාචිතපරිද්දෙන්; කිවිඳු, කවීන්‍ද්‍රයාගේ; අදහස, අභිප්‍රාශය; සිදුකරු, සිඩකොට; රම්මිතුරු දෙව්, රාමමිත්‍රදෙවතෙම හෙවත් විභීෂණදෙව්රජතෙම; සකස, සකස්ව; බිසවට, (ඒ උල කුඩයදෙවි නම්වූ) මහෙසිකාවට; ගැබ, (දරක) ගර්‍භය; දුනි, දුනය කෙළේයි.

109. ස ති ස් වන නවයැ පුර අස්ලිස නැක ත
ප හ ස් ලැබ සුපුන්සඳ නුබතුරු පෙනෙ ත
ස හ ස් කර කුලට වැඩ වන ලෙස සත ත
වෙසෙස් රජකුමර විලසින් දැකුම්ප ත

109. සතිස්වන නවයැ, (පරාක්‍රමබාහුරජහට තිස්වෙනිවර්‍ෂය සම්බන්ධිවූ) නවවෙනි මාසයෙහි පුරශුක්ලපක්‍ෂයෙහි; අස්ලිස නැකත, ආශ්ලේෂා නක්‍ෂත්‍රයාගේ; පහස්, ස්පර්‍ශය; ලැබ, ලබ්ධව; සුපුන් සඳ, සම්පූර්‍ණ චන්‍ද්‍රයා; නුබතුරු, නභාන්තරයෙහි; පෙනෙත, දෘශ්‍යමානකාලයෙහි; සහස්කරකුලට, සූර්‍ය්‍යවංශයට; සතත, අනවරතයෙන්; වැඩවනලෙස, වෘද්ධිවනපරිද්දෙන්; රජකුමර, (ඒ ගර්‍භස්ථවූ) රාජකුමාරතෙම; වෙසෙස්, විශිෂ්ටවූ; විලසින්, (දෙහ) විලාසයෙන් (උපලක්‍ෂිතව); දැකුම්පත, දර්‍ශනප්‍රාප්තවූයේය හෙවත් උපන්නේයි.

110. දු ව න බඳ කිකිණි හයකුර පහර න ද
සව න තල නිනද ගිජ්ඳුන් සෙමෙර බ ද
රව න නොයෙක තුරු ජයසක් හඬ නොම ද
දෙවන මුහුදු මෙන් ගුම්ගති පුර නිබ ද

110. කිකිණි, කිඞ්කිණීකයන්; බඳ, බන්ධනයකරනලද්දවූ; දුවන, ධාවනයකන්නාවූ; හය, අශ්වයන්ගේ; කුරපහරනද, ඛුර

ප්‍රහාර නාදයෙන් හෙවත් කුරවැදීමේ ශබ්දයෙන්ද; සෙමෙර බඳ, චාමරබන්ධනය කරනලද; ගිජිඳුන්, ගජේන්ද්‍රයන්ගේ; සවනතල නිනද, කර්ණතාල ශබ්දයෙන්ද; රවන, නාද පවත්වනුලබන්නාවූ; නොයෙකතුරු, අනෙකතූර්‍ය්‍යයන් හා; ජයසක්, ජයසඞ්ඛයන්ගේ; නොමඳ, බොහෝවූ; හඬ, ශබ්දයෙන්ද; පුර, නගරය; දෙවන මුහුදු මෙන්, ද්විතීය සමුද්‍රයක් මෙන්; නිබඳ, නිරන්තරයෙන්; ගුම්ගති, ඝොෂා ගත්තේයි.

111\. ක ඳ වු රු කුල මැඳුරු මිණිපහනෙව් සුසැ දි
නැණ ගුරු සබස සමයද දැනුමෙන් වොරැ දි
ර ජ ගු රු විජයබාපිරිවන් හිමි පැහැ දී
මෙ මි යු රු පදැති සැළලිහිණිය අස්න යෙ දී

111\. කඳවුරුකුල මැඳුරු, සකන්ධාවාර කුල නමැති මන්දිරයෙහි; සුසැදි, සුසජ්ජිතවූ; මිණිපහනෙව්, මාණික්‍යප්‍රදීපයක් වැනිවූ; නැණගුරු, ඥානයෙන් වෘහස්පති වැනිවූ; සබස, (සංසකෘතාදි) ෂඩ්භාෂාවද; සමයද, සමයාන්තරයද; දැනුමෙන්, ඥානයෙන්; වොරැදි, විරාජමානවූ; රජගුරු, රාජගුරුවූ; විජබාපිරිවන්හිමි, විජයබාහු පරිවෙනාධිපතිවූ ස්වාමිතෙම; පැහැදී, ප්‍රසන්නව; මෙ මියුරු පදැති, මේ මධුරපාදයුක්තවූ; සැළලිහිණියඅස්න, ශාරිකා සන්දේශය; යෙදී, යොජිතකළසේකි.

සැළලිහිණි අස්න නිමි.

# ගැටපද විවරණය.

අක්ෂි, නෙත්‍ර, ඇස්
අක්ෂිපක්ෂ්මස්පන්දන, ඇසිපිය ගැසීම, ඇසිපිය උඩටනැගීම සහ පහළට හෙළීම
අග්‍රාවනත, අගින් නැමුණු
අඞ්ගනාව, ස්ත්‍රී
අච්ඡාදන, (වස්ත්‍රාදිය) ඇඳීම
අඤ්ජන, (ඇසගෑම් ආදියට ගන්නා) අඳුන්
අඤ්ජනපර්වතකූට මස්තක, අඳුන් වර්ණ ඇති පර්වතයක මුදුන
අතිරික්ත, ඉතිරි, අධික, වැඩි
අධුනාකාලය, මේ කාලය
අනල්පවූ, අල්පනුවූ, බොහෝවූ
අනවද්‍ය විපාක ලක්ෂණවූ, යහපත් විපාක දෙන ස්වභාව ඇති හෙවත් මතු යහපතක් පැමිණේයයි ඇදහිය යුතුවූ
අනාගත, නොපැමිණි, මතු පැමිණෙන
අනුකූල, අවිරුද්ධ, එකතු
අනුක්තාකාර, නොකියනලද තතු
අනුවර්තන, එක්ව පැවැත්ම
අන්‍යප්‍රයොගයක්, අනික් උපායක් හෝ කරුණක්
අන්‍යවිෂයයෙහි, අනුන් අතරේ
අන්‍යවිහිතනොවී, අනික්කාරණයක සිතනොඑලවා, අනිකක් නොසිතා
අන්‍යොන්‍ය, ඔවුනොවුන්, උනුනුන්
අපභ්‍රංශ, අව්‍යාකරණීය භාෂාවක්, අපශබ්ද බහුලවූ(ම්ලේච්ඡ) භාෂාවක්, ප්‍රාකෘතාදි භාෂාවලින් බිඳීගිය භාෂාවක්
අපරාන්හකාලය, සවස් කාලය

අභිනවපල්ලව, අළුත්දළු, ලාදළු
අභිමත, කැමති, රුචි
අභිලාෂ, ආශාව, රිස්ස
අභ්‍රමහිකාදි, වලාකුල් පිනි (පටල) ආදි
අර්ථාන්විත, අර්ථයෙන් යුක්ත
අලකාපුරය, (යක්ෂයන්ට අධිපතිවූ) වෛශ්‍රවණ වරම් රජුගේ නුවර, අලකමන්දාව
අලඞ්කෘත, සැරසුණු, සැරසූ
අවතීර්ණව, බැසගෙන, බැසලා
අවදාතරශ්මිය, සුදුපැහැය
අවනත, නැමීම, පහත්වීම
අවනතකළාවූ, යටත්කළාවූ
අවබොධ, දැනීම, දැනගැන්ම
අවයවාර්ථ, (යම් රචනාවක) පදයක් පාසා ධාතුප්‍රත්‍යයාදිය වෙන්කොට විස්තර කිරීම නොහොත් එසේ විස්තරකොට දක්වනලද අර්ථ සමූහය
අවස්ථා, කාලය, වේලාව
අවස්ථාන, සිටීම
අව්‍යක්ත ලෙඛක, අපණ්ඩිත ලිපිකරුවෝ, නූගත් ලියන්නෝ
අශ්ව මුඛාදි, අශ්වයන්ගේ (වැනි) මුහුණු (ඇත්තන්) ආදිවූ [අසුන්ගේවැනි මුහුණුද, මනුෂ්‍ය ශරීරද ඇති අමනුෂ්‍ය විශෙෂය සලකා යිනු]
අශ්විනී ගමනොපෙක්ෂා, අස්විද නැකත ගමනට උතුම්
අසාදෘශ[illegible], අසදෘශ කාය [illegible]

අස්මද් ශබ්ද වාච්‍යයා සම්බන්ධවූ, අස්මද් යන වචනයෙන් කියයුතු අයගේ හෙවත් අපේ
අස්වැද්දී, ධාන්‍ය ඇතිව, වී ඇතිව
ආකර්ෂණ, ඇදීම, ඇදගැන්ම
ආකාරසදෘශ, ස්වභාවයෙන් ඇති සමානකම
ආකාශ ගඞ්ගා, අහස්ගඟ, අහසෙහි කෛලාසාග්‍රයෙන් වැටීතිබෙයයි සලකනා ගඟ
ආගන්තුක චිහ්නයක්, අමුතු සලකුණක්
ආදිත්‍යයා, හිරු
ආද්‍රවූ, තෙත්වූ, තෙමුනු
ආම්‍රාදි, අඹ ආදී
ආයත, දික්වූ, දිගඇති
ආරක්‍ෂස්ථාන, (සොර සතුරන් වලකන පිණිස) රැකවල් කොට සිටින තැන, මුරපල
ආරූඪව, නැඟ, ආවේශව
ආලම්බන, එල්ලීම
ආලිඞ්ගන, වැලඳගැන්ම, බද ගැන්ම, තුරුළුකර ගැනීම
ආලේපනය, ගෑම, තැවරීම
ආවරණ, මුවාකිරීම, වැසීම
ආවෘතවූ, ඇහිරුනාවූ, අපසු කැරකී ගියාවූ
ආශීර්වාද පුරස්සර, (බොහෝ කල් පවතු යනාදි) ශුභප්‍රාර්ථනා පෙරටුකර
ආසන්න ප්‍රාප්තවූ, ලඟට පැමිණියාවූ
ආස්තරණ, ඇතිරිලි
ඉක්‍ෂුවන, උක්වනය
ඉතිරියක්හු, වැඩිසිටිකෙනෙකු
ඉෂ්ට, කැමති, යහපත්
ඊශත් රක්තභාව, මදක් රතු ස්වභා
ඊශ්වර, මහේශ්වරයා; අධිපතියා
උක්ෂේපණ වික්ෂේපණ, (උක්ෂේපණ අවක්ෂේපණ) උඩට නැංවීම, පහළට හෙළීම
උච්චක්ෂේත්‍ර, උස්වූ ගරුඉඩම
උච්චාරණ, කීම
උජ්ජ්වලිත, දීප්තිමත්, උසස්ව බබලනා
උත්ථාන, නැගිටීම, නැගිටසිටීම
උදයපර්වත, හිරුඋදවනපර්වතය
උද්දාමගුණ, උඩඟුගුණ
උද්‍යානක්‍රීඩා, උයන්වල පවත් වන සෙල්ලම්
උද්භිද, දක්වතල
උන්නතවූ, උස්වූ
උන්නත ප්‍රදේශ, උස් ඉඩම, ගොඩලිබිම
උපලක්ෂිත, යුක්ත, ඇති
උපවේශන, ඉඳීම
උපායඥත, උපාය, නුවණ
උපේන්ද්‍ර, විෂ්ණු
උභයකූල, ඉවුරු දෙක
උෂ්ණීෂපට්ට, (රජුන්ගේ) නළලෙහි පලඳිනා ආභරණයක්
ඌනත්වය, අඩුබව, අඩුස්වභාව
ඌරු, කලවා
ඍක්, යජුර්, සාම (යන) වේද ත්‍රය, ඍග්වේද යජුර්වේද සාම වේද යන වේදශාස්ත්‍ර තුන
ඒකප්‍රහාරයෙන්, එකපහරින්
එලඹුවාවූ, පැමිණවූ, පෑවාවූ
ඓරාවණ හස්තිරාජයා, ශක්‍රයාගේ ඇතා
ඓශ්වර්ය, ඉසුරු, (රන්රුවන් ආදී) ධන
ඔජස්වික, ශක්ති වැඩි, නොමැලි
ඔජස්විතාදී, ශක්තිය හෝ නොමැලි ස්වභාව වැඩි
ඖෂධීවෘක්ෂ, රැරහරුක්

කණ්ඨ, බොටුව, බෙල්ල
කථාශරීර, (යම් රචනාවකින් ප්‍රකාශවන) කථාව, නමැති ශරීරය
කරුණා විශෙෂ, කරුණාවෙහි ඇති අමුතු (ස්වභාව)
කර්ණපාශ, කන්සිදුර
කර්ණාටක, එනම් රටවැස්සෝ
කර්ණාවතංස, කන්වල පලඳින ආභරණ
කලිකා, මල්කැකුල, මොට්ටුව
කල්පවෘක්ෂ, ශක්‍රපුරයෙහි පිහිටියේයයි සලකනලද සිතූ පැතූ වස්තු දෙන දිව්‍යවෘක්ෂයක්
කල්‍යාණ, යහපත්, ශුභ
කල්‍යාණීපුර, කැලණි නුවර
කල්‍යාණෝත්සවක්‍රීඩා, යහපත්වූ ප්‍රීතිමත් සෙල්ලම්
කල්හාර, හෙල්මැලි (මල්)
කසලරහිත, නොකිලුටු, පිරිසිදු
කස්තූරිකා, මුවවර්ගයකුගේ බඩතුල පෙකණිය අසල හටගන්නා සුවඳ ද්‍රව්‍යයක්
කාඤ්චනදීපයෂ්ටි, රනින් කළ පහන්රුක
කාදම්බපක්ෂි, විල්කුකුළෝ
කාමධෙනු, ප්‍රාර්ථනාකළ වස්තු දෙන්නියකැයි අදහනලද එලදෙනක්
කාලාගරු, කළුඅගිල්
කාව්‍යකර්ම, කවිබැඳීම
කාව්‍ය සුභාෂිත, කවියෙන් කියනලද යහපත් වචන
කිඞ්කිණීකජාල, කුඩා මිණිගෙඩිවැල්, රනුවැල්
කින්නර, වෛශ්‍රවණ වරම්රජුගේ අනුචරවූ අමනුෂ්‍ය වර්ගයක්
කිවි, කවිබඳින්නා, පණ්ඩිතයා
කිරීට, ඔටුන්න, කිරුළ
කීර්ති ප්‍රබන්ධ, නොකඩව පවත්නා යසස හෝ යසස් වර්ණනා වෙන්පුත් කවි
කුක්කුටෙන්ද්‍රධ්වජ, මහත් කුකුළු රූප සටහන් ඇති කොඩි
කුත්සිත, නින්‍ද්‍යකටයුතු, නින්දිත
කුඞ්කුමාගරාගරේණු, ඇඟගෑමට තැනූ කොකුම්කුඩු
කුන්ත, අනිනා ආයුධයක්
කුමුද, සුදු මානෙල්
කුරුවින්දපාෂාණ, එනම් ගල් වර්ගය
කුලගෘහ, පවුලේ ගෙය
කුලදෙවතා, පවුලේ හෝ පරම්පරාවේ අය විසින් අදහන දෙවියා '
කුශලප්‍රශ්න, මිත්‍රකමින් විචාරණ ප්‍රශ්න
කුසුමකෙශර, මල්රොන්
කෘතපුණ්‍යභාව, පින්කළබව
කෘශවූ මධ්‍යප්‍රදෙශ, සිහින්වූ ඉඟ
කෙශකලාප, කෙස්වැටිය
කෙශර, රොන්
කෛරව, සුදුමානෙල්
කෛලාසස්ථානය, මානසවිලට උතුරෙන් පිහිටි කන්දක්, වෛශ්‍රවණගේ වාසස්ථානය
කොකිල, කොහා, කවුඩුපතික් කියා
කොටිප්‍රාප්ත, කෙළවරටපැමිණි
කොණප්‍රවෙශ කරන්නාවූ, කොණකට පමුණුවන්නාවූ, මුලුගන්වන්නාවූ
කොබෝගෙඩ වලල්ල, චන්ද්‍රශාලා මත්තෙහි සාදන කුරු එගේ
ක්ෂණය, ඇසවරක් අසුරගැසීමට ගතවන කාලය
ක්ෂීණාශ්‍රව, රාගාදිකෙලෙස් නැසූවෝ, රහත්හු

ක්ෂීර, කිරි
ඛේද, ශෝකය, දුක
ගගනතලලඞ්ඝන, අහසට හෝ උඩට නැඟීම
ගජකුම්භාකාර, ඇතුන්ගේ කුම්භස්ථල බඳු
ගද්‍යපද්‍ය බන්ධන, වාසගම් සහ කවිබැඳුම්
ගමනෙච්ඡා, යාමට කැමැත්ත
ගර්භස්ථවූ, ගැබෙහි පිහිටි
ගලිතවූ, වැටුනාවූ, ගැලවුනාවූ
ගහණවූ, (අතුරුසිදුරු නැතිව) ගැවසුනාවූ
ගාත්‍ර, ශරීරය, ඇඟ
ගාථාවිශේෂයෙන් රචිත, නොයෙක් ප්‍රකාර ගාථාවලින් රචනාකළ
ගුණග්‍රහණ, ගුණයෙන් ගැවසී
ගුප්තභාෂා විෂය, රහස්කථා කියමන
ගුල්ප, කැලෑව, පඳුර
ගෘහොද්‍යාන, ගෘහ අසල පිහිටි වතු
ගොපුරද්වාර, නුවර දොරටුව
ගොශීර්ෂ චන්දන, ඉතා සුවඳැති රත්සඳුන් වර්ගයක්
ගෞතම, එනම් මුනිවරයා හෝ එම ගෝත්‍රයෙන් පැවතෙන
ඝට්ටනා, ගැලපීම, වැදීම
ඝණ්ටාරව, මිණි ගෙඩි ශබ්දය
චඤ්චුව, තුඩ, හොට
චඤ්චුක්ෂේපණ, තුඩ හෙලීම
චතුර්විධ, සතරආකාර
චතුශ්ෂෂ්ටි, හැටහතර
චන්දනාඞ්ගරාග, ශරීරයෙහි ගැල්වීමට තැනූ සඳුන්මඩ
චන්ද්‍රකාන්තපාෂාණ, සඳරැස් වැදුනු කල දිය වැගිරෙන ගල්වර්ගයක්
චන්ද්‍රශාලා, ගෘහය ඉදිරියෙහි හිඳිම් ඇවිදීම් ආදියට තනන මහල
චම්පක කලිකාව, සපුමල් කැකුළ
චම්පකාභිධාන, චම්පක යන නමක් ඇති
චරණ යුග්මය, පා දෙක
චාපචන්ද්‍රාදි, දුනු හා චන්ද්‍රනම් ආයුධ ආදි
චිත්තෙකාග්‍රතාව, සිත එකඟ බව
චින්තාමාණික්‍යය, ප්‍රාර්ථනාකළ වස්තු දෙන්නේයයි අදහන මැණිකක්
චිරකාලයක්, බොහෝ කලක්
චෞර, සොර
ඡත්‍ර, ආතපත්‍රය, කුඩේ
ඡදන, පලය, පියස්ස
ඡදනාග්‍ර, පියසි කෙලවර
ඡායාකුල, සෙවණින් ගැවසුනු
ජගත්, ලෝකය
ජගදන්තර, ලොව ඇතුල
ජඝනස්ථල, උකුල්තලය
ජනපද, මිනිසුන්ඇති පලාත
ජනරඤ්ජන, මනුෂ්‍යයන්ගේ සිත් අලවන
ජලභරිත, දිය පිරුනු
ජලස්කන්ධ, දියකඳ, දියරාශිය
ජලාභිවෘෂ්ටි, දිය වැසිවීම
ජල්පමානාවස්ථා, කථාවෙන් යුක්තව පවතින කාලය
ජාතිකල්හාර, දෑසමන් සහ හෙල්මැලි (මල්)
ජාතිමාලත්‍යාදි, දෑසමන් සහ ඉද්ද (මල්) ආදි
ජීවමාන, ජීවත්ව සිටින
ජ්‍යෙෂ්ඨභ්‍රාතෘ, වැඩිමල් සහෝදරයා
ඩිණ්ඩිරපිණ්ඩ, පෙණපිඬු

තත්පරවූවාක්, යෙදීසිටි තැනැත්තියක්
තදනන්තරව, ඊටපසුව
තදර්ථසාධක, ඒ ප්‍රයොජනය සිඬකරන
තන්ත්‍රි, වීණාතත්
තප්ත තෛල ස්ථාලිය, උණුතෙල්කටාරම
තරඞ්ගභඞ්ග, රලබිඳීම
තාදෘශ, එබඳු, එවැනි
තාමරස, නෙලුම්මල්
තාම්බුජස නිලයකොටඇති, නෙලුම්මල් වාසස්ථානකොට ඇති
තිලක, සඳුන්මඬ ආදියෙන් නළලෙහි කරන ලකුණ
තුෂාර, පිනි, හිම
තූර්ය, බෙරවර්ග
ත්‍රිචීවර, දෙපටසිවුර තනිපට සිවුර අඳනය පොරෝනය යන සිවුරු තුන
ත්‍රිපිටක, සූත්‍ර විනය අභිධර්ම යන තුන්පිටකය
ත්‍රිභූමක පචභූමකාදිවූ, තුන්මහල් පස්මහල් ආදිවූ
ත්‍රිවර්ග සම්පත්ති, ධර්මිෂ්ඨබවය ප්‍රියබවය ධනවත්බවය යන තුන්ආකාර සැප
ත්‍රිවිධකාව්‍යමුඛ, ආශිර්වාද නමස්කාර වස්තුනිර්දෙශ යන තුන්ආකාර කාව්‍යමුඛ (කාව්‍යමුඛයනම්: යම් රචනාවක පටන්ගැන්මයි)
ත්‍රිවිධ චිත්ත, මුලය මැදය කෙළවරය යන තුන්තැන පවත්නා සිතිවිලි
ත්‍රෛලොක්‍ය නෙත්‍ර, තුන්ලොවට ඇසක් (වැනි)
දංෂ්ට්‍රා, දළ
දම්පතීහු, අඹුසැමියෝ

දර්පණ (මුහුණබලන) කන්නාඩිය
දර්ශනක්ෂම, දක්කයුතු, දක්කහැකි
දශඅකුශලකර්මපථ, ප්‍රාණඝාතාදි දසආකාර පාපකර්මයි
දශපුණ්‍යක්‍රියාවස්තු, දානශීලාදි දසආකාර පින්කම්
දිනරත්න, දවාලට මැණිකක්වූ
දිව්‍යවෘක්ෂ, ප්‍රාර්ථනාකළ වස්තු දෙන්නේයයි අදහන දිව්‍යලොකයෙහි පිහිටි රුකක්
දුශ්චරිත, අකුසල්, දුසිරිත්
දූත, පණිවිඩකාරයා, හසුන්ගෙන යන්නා
දූතකාව්‍යලක්ෂණ, දූතයෙකු ඇතිව කළයුතු කාව්‍යයක ලකුණු
දූතක්‍රියා, පණිවිඩකාරයකු විසින් කළයුතු ක්‍රියාව
දෘශ්‍යමාන, පෙනෙමින් තිබෙන
දෙවජාති වංශය, දෙවියන්ගේ ජාතිගොත්‍රය
දෙවවිමාන, දෙවාල, කෝවිල්
දෛත්‍යාරි, අසුරයන්ගේ සතුරෝ, දෙවියෝ
ද්වන්ද්ව, දෙක
ධනද, වෛශ්‍රවණ වරම්රජ
ධනින්, වස්තු ඇත්තවුන්
ධනුර්ගුණ සම්බන්ධන්‍යාය, දුන්නෙහි ලනුව බඳින ක්‍රමය
ධම්මිල්ල, කොණ්ඩය
ධර්මස්කන්ධ, (එකිනෙක ධර්මකොට්ඨාස එකට රුස්වූ) දහම් සමූහය
ධාතුමන්දිර, ධාතු තබන ගෙය
නක්ෂත්‍රයොග, නැකැත් යෙදීම
නදී, ගඞ්ගාව, ගඟ
නභස්තල, අහස්තලය
නභාන්තර, අහස අතර

නභොමණ්ඩලොද්ගතව, අහස් මඬුල්ලට නැග්

නභොමධ්‍යය, අහස මැද

නලකූබර, වෛශ්‍රවණ වරම්රජුගේ පුත්‍රයෙක්

නවගුණ මන්ත්‍රය, බුදුන් පිළිබඳ අර්හත්ආදි නවගුණය ප්‍රකාශවූ "ඉතිපි සො භගවා" යනාදි ගාථාව

නවනිධාන, වෛශ්‍රවණ වරම්රජු අයත් මහාපද්මාදි නිධාන නවය

නාගමානවිකා, තරුණසැපිනිනු

නාගරික, නුවර (ඇතුලත) වාසයකරන

නාටකස්ත්‍රීන්, නටන ස්ත්‍රීන්

නාසත්‍ය යන දෙවවෛද්‍යයන්, සූර්‍ය්‍යයාට භාර්‍ය්‍යාවූ අශ්විනිගේ පුත්‍රයන් වන "නාසත්‍ය" යන දිව්‍ය වෙදුන්

නිෂ්ක්ලෙශස්ථාන, නොකිලුටු හෝ අනතුරු නැති තැන්

නිද්‍රාඝූර්ණ, නින්දෙන් ඇතිවන බැඳුම් ගතිය, ඇස්පිල්ලන් බැන්දක්මෙන්. නිදි මතින් ඇතිවන මැලිස්වභාව

නිමග්න, ගැලුනු, ගිලුනු

නිරාකරණ, පැමිණෙන්ට නොදීම, වැලැක්වීම

නිශාත, හෙන

නිර්මිත, මවනලද, මැවූ

නිශාඞ්ගනා, (උපමා වශයෙන්) රාත්‍රිනමැති ස්ත්‍රී

නිශ්චය පර්‍ය්‍යඥානය, ඇතිසැටිය දැනගැන්ම, නියමයෙන් හෝ නිසැකලෙස දැනගැන්ම

නිෂ්පත්ති, ඇතිවීම, ඉපදීම

නීලාම්බර, නිල් (වන්) අහස

නීවිපට්ට, නරුපට, නෙරිය

නෘත්‍ය, නැටීම්, නැටුම්

පක්ෂචලන, පියාපත් සෙලවීම

පක්ෂප්‍රසාරණ, පියාපත් දිගහැරීම, පියාසරකිරීම

පක්ෂසංඝාතිය, පිහාටු සමූහය

පඞ්ක්තිය, පෙළ, පේළිය

පඤ්චාංගිකතූර්‍ය්‍ය, ආතත විතතාදි පස්ආකාර බෙරවගී

පට්ට, වස්ත්‍ර හෝ පටවස්ත්‍ර

පතන, වැටීම හෝ බැසීම

පතාකා, ධවජ, කොඩි

පතිව්‍රතාධර්ම, පරපුරුෂ සෙවනය පරස්ත්‍රී සෙවනය (යන) දෙකින් දුරුව විසීම වන අඹුසැමියන් පිළිබඳ ධර්මය

පතු වගල, පිහි ගැලවුනු

පත්‍රවිකාශ, පෙති විහිදීම, පිපීම

පයොධරපට්ට ශොභාව, තනපටේ ස්වභාව, චෝලියේ ආකාරය

පරතීර, එගොඩ, පරතෙර

පරාග, රේණු, රොන්

පරාඞ්මුඛ නොවෙති, අනික් පිට නොබලති, පිටිනොපාති

පරික්ෂෙප, වටකිරීම

පරිචිත, පුරුදු, හුරු

පරිච්ඡෙද, වෙන්කිරීම, බෙදීම

පරිත්‍යාග, දීම හෝ අත්ඇරීම

පරිණත, පැසුනු, ඉදුනු

පරිණතභාව, පැසුනු ස්වභාව

පර්‍ය්‍යඞ්කමස්තක, පුටුව උඩ

පශ්චාත්, පසු

පාලිකා, පේළිය, පෙළ

පාෂාණ, ගල්

පිඤ්ජරවර්ණ, රත්රන් පැහැය

පුණ්‍යාපී, පින්කැමති (අය)

පුලස්තිමහර්ෂි, බ්‍රහ්ම ඍෂීන් සත්දෙනා අතුරෙන් කුන්වෙනි ඍෂිවරයා

පුෂ්කර, නෙලුම්

පුෂ්කරණී, පොකුණ

පුෂ්පරස, මල්පැණි

පූජෝත්සව, පූජා සහ සෙල්ලම්
පූර්ණ කුම්භ, දියපිරුණු කළ
පූර්ව මන්මථ, (ඊශ්වරයා විසින් දවන්නට) පළමු අනඞ්ගයා
පූර්වාපදන, පෙර කළ දෙයක්
පූර්වාර්ධ, පළමුවෙනි භාගය
පෘථුල ශ්‍රෝණී භාග, පළල්වූ උකුලු ප්‍රදෙශ
පෛශාචී, අමනුෂ්‍යයන්ගේ භාෂාව
ප්‍රකෝප, දැම්ම, හෙලිම
ප්‍රචණ්ඩ, ඉතා නොයික්මුනු
ප්‍රතිමාරූප, පිළිමරූප
ප්‍රතිමාලය, පිළිම ගෙය
ප්‍රතිෂ්ඨාධාර, පිහිට උදව්
ප්‍රතිසංයුක්ත, එක්ව යෙදුනු
ප්‍රත්‍යක්ෂ, අත්දුටු
ප්‍රත්‍යභිඥා, ඇඳිනීම
ප්‍රත්‍යුපකාර, කළ උපකාරයක් වෙනුවට කරන උපකාරය
ප්‍රත්‍යූෂ, උදය (කාලය)
ප්‍රදක්ෂිණ, දකුණු ප්‍රාශ්වයදක් වමින් දෙයක හෝ කෙනෙකු වටේ කැරකීම
ප්‍රදීපශිඛා, පහන්දැල්ල
ප්‍රඵුල්ල, ඉතා හොඳට පිපුනු
ප්‍රබුද්ධ පද්මාකර, පිපුනුමල් ඇති නෙලුම්විල්
ප්‍රභාස්වර, කාන්තිමත්, රශ්මි සහිත
ප්‍රභූ, පොහොසත්, පුළුවන්
ප්‍රභේද, වෙනස් ගති, විශෙෂ ස්වභා
ප්‍රමාණ වන්නේය, සෑහෙන් නේය
ප්‍රයාණ, යාම, ගමන්කිරීම
ප්‍රවිෂ්ටවූ, පැමිණී යාවූ
ප්‍රවෘත්ත, පවතින, නොනැසුනු
ප්‍රවේශවව්, පැමිණෙව්
ප්‍රසාරිත, නොහකුළුවනලද, දික්කරනලද

ප්‍රස්ඛලිත, හැපී නැවතුනු
ප්‍රස්තාවොචිත, කාලයට සුදුසු
ප්‍රාකෘත, සංස්කෘතයෙන් බිඳිගිය භාෂාවක්
ප්‍රාප්තවාර්තා, පැමිණි පණිවිඩය
ප්‍රාභෘත, පඬුර, තෑග්ග
ප්‍රෞඪ, මේරූ, තද
ඵෙණමණ්ඩල, පෙණ මඩුල්ල
ඵලභරිත, ගෙඩිවලින් බරවූ
බද්ධ, බැඳුනු, බඳිනලද
බහුමාන, ඉතා ගෞරව
බාලාර්ක මණ්ඩලය, උදෑසණ ඉර මඩල
බුද්ධි, නුවණ
භක්ති, ආගම කෙරෙහි ශ්‍රද්ධාව
භූත භවිෂ්‍යත් වර්තමාන, පසුගිය මතු පැමිණෙන දැන් පවතින (කාල තුන)
භූමිප්‍රදෙශ, ඒ ඒ තැන පොළොව
භෘඞ්ගපඞ්ක්ති, මීමැසිපෙළ
භෘඞ්ගාවලී, මීමැසිපෙළ
භොගැවලිගෘහ, දරණවැල නමැති ගෙය
භ්‍රෑලෙඛා, බැමරෙද
මකරධවජ පූජෝත්සව, අනංග යාට කරන පුද සෙල්ලම්
මකරන්ද, මල්රොන්, මල්පැණි
මත්ත, මත්වූ
මථන, කැලඹීම, කැලඹවීම
මධුරවචනොපෙත, මිහිරි වච නඇති
මධ්‍යාහ්නකාල, ඉරමුදුන් වේලාව
මනොඥ, සිත් ප්‍රියවන
මනොරථසිද්ධි, හිතේ ආශාව සිද්ධවීම
මන්දාර පාරිජාත, එනම් දිව්‍ය වෘක්ෂ දෙක
මයූර, මොනරු
.මරකත මාණික්‍ය, එනම් සුත් මැණික්

මර්දන, පොඩිකිරීම, මැඩීම
මර්දලධ්වනි, දෙමළබෙර ශබ්දය
මහදෙවියා, ඊශ්වරයා
මහාර්ණව, මහමුහුද
මහාර්ඝ, ඉතා අගයඇති
මාගධ, මගධරට භාෂාව, මගධ දෙශීන්ගේ භාෂාව
මාණික්‍යකාහල, මැණික් හොරණෑව
මාණික්‍ය කිඞ්කිණීක, මැණික් ඇල්ලූ කුඩා මිණිගෙඩි
මාධවීලතා, යොහොඹුවැල්
මාධුර්‍ය්‍ය, මිහිරි
මාධුර්‍ය්‍ය අවිච්ඡෙද, මිහිරිබව නොසිඳීම
මාරුත, සුලඟ
මාරුත ශක්ති, සුලඟේ ශක්තිය, සුළංවේගය
මාලතිලතා ප්‍රතාන, පැතිර වැවුනු ඉද්දවැල්
මිථ්‍යාදෘෂ්ටි, වැරදි ඇදහිල්ල, අයහපත් ඇදහිල්ල
මුක්තාකලාප, මුතුවැල්
මුක්තාලතිකා, මුතුවැල්
මෘදඞ්ග, දෙමළබෙර
මෘෂ්ටිග්‍රහණ, මිටින් අල්වා ගැන්ම
මෙඛලා, මෙවුල, හවඩිය
මෙඝ, වලාපටලය
මොක්ෂ සෞඛ්‍ය, නිවන්සැප
මොචන, බැඳුම් ලිහීම, මිදීම
යන්ත්‍ර බන්ධන, ගාඩු ආදිය ලා බැඳීම
යශොමරීචි, කීර්ති ආලොකය
යාචිත, ඉල්ලූ, යාච්ඤාකල
යාච්ඤා, ඉල්ලීම, යැදීම
යාත්‍රා, යාම; යාත්‍රාව
යුද්ධප්‍රවෘත්ත, දබරයෙහි යෙදුනු
යුෂ්මතුන්ගේ, තොපගේ
රක්තාධර, රතුතොල්
රක්තාධරාන්ත, රතුතොල්වල කෙළවර
රක්තාශොක, රත්හෝපලු
රඞ්ගමණ්ඩල, නැටුම් බිම
රචනා, (ගද්‍ය පද්‍යාදි) ග්‍රන්ථ
රඤ්ජන, රැඳීම, සිත් ආශාකිරීම
රඤ්ජමාන, රැඳීතිබෙන, සිත් ආශා කරමින් පවතින
රඤ්ජිත, රැඳුනු, ඇලුනු
රතොත්සව, කාමක්‍රීඩා, රතික්‍රීඩා
රත්නත්‍රය, (බුද්ධාදි) තුනුරුවන්
රත්නමය, මැණික්වලින් කර නලද
රථචක්‍ර, රථරෝද
රම්භාව, එනම් දිව්‍යාඞ්ගනාව
රසාඤ්ජන, පිත්තලබොර මිශ්‍ර කොට සෑදූ අඳුන්
රශ්මිකදම්බ, රැස්සමූහය
රැව්පිළිරැව්, නාදයට විරුද්ධව පවත්වන නාදය
රොහිතමත්ස්‍ය, ලේල්ලු
ලක්ෂ්මීමත්, ශ්‍රීසහිත, ශ්‍රීඇති
ලග්න නොවන්නාවූ, නොඇලෙන්නාවූ
ලම්බකර්ණවංශ, එනම් රජ කුලය
ලාක්ෂාරස, ලාකඩවතුර
ලාඤ්ඡන ප්‍රවෙශ, කැලලට පැමිණි
ලීලොපෙත, ලෙලදෙමින් පවතින, සැලුම් ඇති
ලෙඛාව, රොද, රෙඛාව
වක්ෂස්ථල, ළැපැත්ත, හෘදය මතුභාගය
වජ්‍රාසන, විදුරසුන
වනලක්ෂ්මී, වනය නමැති ශ්‍රීදෙවි
වරප්‍රාර්ථනාව, වරක් පැතීම
වර්ගබන්ධන, රංචුගැසීම, සමූහවීම

වර්ණවිපර්‍යාසය, වර්ණයෙන් වෙනසට පැමිණි
වර්ධිත, වැඩුනු, වැඩීවූ
වලි, රැලි
වල්ලභ, ස්වාමියා
වශග, කැමැත්තෙහි පිහිටීම, යටත්වීම
වසන්තකාල, බක් වෙසක් දෙමස
වාර්තාවිශෙෂ, පණිවිඩ තොරතුරු
වාලුකාස්ථල, වැලිතලා
විකසිත, පිපුනු, ප්‍රබුඩවූ
විකාශවන්නාවූ, දිගඇරෙන්නාවූ
විකීර්ණ, විසිරීගිය
විකීර්ණකොට, විසුරුවාගෙන
විජෘම්භමාන, ප්‍රීතිමත්ව උසස් ලෙස පවතින
වින්‍යාස, පිළියෙළකිරීම
විඥාපන, දැන්වීම
විපඤ්චිකා, වීණාව
විභාගකොට, විමසා, බෙදා
විලෙපන, ගැල්වීම, ගෑම
විශිෂ්ට, විසිතුරු, උතුම්
විශීර්ණනො කොට, නොවිසුරුවා
විශෙෂ විභාග, වෙනස් තොරතුරු
විශ්‍රාම, විඩා දුරුකිරීම, නවාතැන් ගැන්ම
විශ්‍රාමශාලා, අම්බලම
විස්තීර්ණකොට, විසුරුවා
වීජමාන, සලනලද
වීතරාගී, රාගයක් නොමැති
වෘත්තාවූ, වටවූ
වෘත්තධාතු ගෘහ, වටවූ ධාතු මන්දිරය
වෙදිකා, පිල, පිලක්වැනි ඉඩම
වෙලාන්ත, වෙරළ අයින
වෛශ්‍යා, වෙසී, ගණිකාව

වෙෂ්ටන, වෙළුම
වෛශ්‍රවණ, වෙසමුණි වරම්රජ
ව්‍යාකුල, අවුල්, ආකුල
ව්‍යාප්ත, පැතිරීගිය, පැතුරුනු
ශඞ්ඛමඤ්ජූෂා, සක්වලින් තැනූ පෙට්ටිය
ශතපත්‍ර, නෙළුම්මල්
ශතරශ්මි, සූර්යයා, හිරු
ශයනප්‍රාප්ත, ශයනයට පැමිණි, සැතපෙන
ශරත්කාලය, වක් ඉල් දෙමස
ශරීරලාවණ්‍ය, ශරීරයෙහි ඇති යහපත් රූපශොභාව
ශාඛාභාර, බරවූ අතු (සමූහය)
ශාඛාවිභූතිය, අතුවලින් ඇතිවූ ශොභාමත් ගතිය
ශාරිකාපක්ෂි, සැළලිහිණි
ශිඛර, මස්තකය, මුදුන
ශිලාප්‍රතිමා, ගල්පිළිම
ශීඝ්‍රශිලී, ඉක්මන් ස්වභාවක්ඇති
ශුක්ලපක්ෂ, මාසේපෝයෙන්පසු පසළොස්වකදක්වා ඇතිදවස්
ශුෂ්ක, වේලුනු, වියලි
ශෘඞ්ග, කොත; අඟ
ශෛවසමයෙහි දීක්ෂිතවූ, ශිවාගමෙහි තාපසවූ නොහොත් භක්ති ඇත්තාවූ
ශොභමාන, බබලමින් පවතින
ශෞරසෙනී, එනම් භාෂාව
ශ්‍යාමායමාන, නිල්පැහැයෙන් යුක්තව පවතින
ශ්‍යාමවර්ණ, නිල්පැහැය
ශ්‍රවණ, සවන්, කන්
ශ්‍රවණමනොහර, කන්සිත් සතුටු කරන
ශ්‍රවණමය ඥාණය, ඇසීමෙන් ඇතිවූ නුවණ
ශ්‍රවණ විෂය; ඇසීමෙන් දැනගතහැකි
ශ්‍රාන්තභාවය, විඩාව

ශ්‍රීවත්ස, උඩැක්කිය
ශ්‍රීසමෘද්ධිය, සම්පත් වැඩිකම
ශ්‍රීසාර, ශොභාවෙන් හෝ ධනයෙන් සාරවූ
ශ්‍රොණි, උකුල
ශ්වෙතච්ඡත්‍ර, සුදුකුඩ
ෂඩ්භාෂා, සංස්කෘත ප්‍රාකෘත ශෞරසෙනි පෛශාචි මාගධි අපභ්‍රංශ යන භාෂා හය
ෂඩ්භාෂා කවිත්වය, මෙකී භාෂා හයෙහි පණ්ඩිතබව
ෂණ්මුඛදෙවි, කතරගම දෙවියා
ෂළ්විතස්ති ප්‍රමාණ, ගැටවිරියතක් පමණ
ෂොඩශ, දහසය
ස්වර්ණවර්ණ, රත්රන් පැහැය
සංකුචිතනොවූ, නොහැකිළී
සංකොචභාව, හැකිළීම
සංවර්ත, ආශ්‍රයකරනලද
සංසාර, (කෙලවරක් නොමැතිව) වරින්වර ඉපදීම
සංස්කාරජන්‍ය ගුණවිශෙෂ, සම්පූර්ණයෙන් ඇතිවිය යුතු ගුණකොටස්
සංස්ථාන, සටහන, අන්දම
සඛීන්ද්‍ර, මිත්‍රොත්තමයා, උතුම් මිත්‍රයා
සඞ්කෙත, සලකුණු
සඤ්චාරණය, හැසිරීම, ඇවිදීම
සඤ්ජනන, වැසුනු, ගැවසුනු
සතිය, සත්දවස, සප්තාහය
සප්තාහවර්ෂලිකා, සත්දවසක් පැවති වැස්ස
සන්තතිවිච්ඡෙද, පරම්පරාව කඩවීම
සන්තානවෘත්ති, සිතේ පැවැත්ම
සන්තොෂජනක, සතුටු උපදවන
සන්දෙශවාක්‍ය, පණිවිඩ වාක්‍ය
සන්දෙශ හාරක, පණිවිඩ යවන
සන්ධ්‍යාකාන්ති, (අහසේ) සවස ඇතිවන රත්පැහැය
සන්ධ්‍යාභ්‍රපඞ්ක්ති, සවස්කාලයෙහි (අහසේ) ඇතිවන රත් වලාපෙළ
සමස්ත, සියලු, හැම
සමාන සුඛදුඃඛතා ලක්‍ෂණවූ, සැපදුක් දෙක්හි එකාකාරව පවතින ගති ඇති
සමීපවෘත්ති, ළඟ හැසිරෙන
සමුදයාර්ථ, (යම් වාක්‍යයක) සම්පූර්ණ අදහස
සම්බන්ධය, ගැළපීම
සම්භාෂණ, යහපත් කථාව
සම්මාර්ජන, පිසදැමීම
සම්‍යක්භාවය, යහපත් ස්වභාව
සජ්ජිත, සැදුනු, සැරසුනු
සලිලසංසර්ග, දියඑක්වීම
සශල්ක, සිලුටු සහිත
සස්නිග්ධ, සිනිඳු (ස්වභා) සහිත
සස්‍යමඤ්ජරී, වීකරල්
සහශ්‍රකිරණ, හිරු
සාදෘශ්‍ය, සමාන, සදෘශ
සාභිලාෂීවූ, ආශා සහිතවූ
සාමදානාදී, සමගිය හා දීම ආදී
සායණ්හමාරුත, සවස්කාලයෙහි හමන සුළඟ
සාරසපක්‍ෂී, විල්වල හැසිරෙන පක්‍ෂිවර්ගයක්
සාලවෘක්‍ෂ, හල්ගස්
සාලික්‍ෂෙත්‍ර, ඇල්කෙත්
සාලිගොපිකා, ඇල්කෙත් රකින ස්ත්‍රීහු
සිංහාවලොකනන්‍යාය, සිංහයාගේ බැලීමේ ක්‍රමය, පසුබලා පැවැත්ම
සිද්ධවිද්‍යාධර, සූර්යයාට පහළ අහසේ හැසිරෙන දෙවතා විශෙෂයක්

ස්වධාංගනා, ස්වධා නම්වූ දෙවතා
වර්ගයෙහි ස්ත්‍රීහු
සුකුමාරභාව, මොලොක් ස්වභාව
සුගන්ධ මකරන්ද වර්ෂිණ, සුවඳ
මල් මල්පැණි වැගිරීම
සුගන්ධ මන්දමාරුත, සුවඳ සහිත
මඳසුළඟ
සුන්දරාංගය, සිත් ප්‍රියකරන
ශරීරයක් ඇති තැනැත්තා
සුමෘෂ්ට, ඉතා සිලුටු, ඉතාමට්ටම්
සුවාසූදහසක්, අසූහාරදහක්
සුසජ්ජිත, මනාව සැරහුනු
සෞකුමාර්‍ය ප්‍රාප්ත, සැපසේ
වැඩුනු ස්වභාවට පැමිණි
සෞභාග්‍ය සම්පත්ති ප්‍රදාන, සැප
සම්පත්ති දීම
සෞම්‍යගුණ, මෘදුගුණ
සෞම්‍යභාර, මෘදුගති රශ්මිය
ස්කන්ධ, සමූහය; කඳ

ස්ථානෝචිත; පැමිණි තැනට
සුදුසු
ස්ථිතිප්‍රාප්ත, සිටීමට පැමිණි
ස්ථිරකෘත, ස්ථිරව කරන ලද
ස්ථිරභූතව, නිශ්චලලෙස
ස්නිග්ධප්‍රභා, සිනිදු පැහැය
ස්පර්ශ, වැදීම, හැපීම
ස්මෘතිමත්ව, සිහිඇතිව
ස්මෘති විප්‍රවාස, සිහියෙන්
තුරන්වීම
ස්වරෝත්පාදන, නාද ඉපදීම
ස්වර්ණභිඞ්කාර, රන්සෙම්බු
ස්වර්ණයෂ්ටි, රත්රන්මිටි
හරිණවර්ණ, නිල්පාට
හස්තපුට, දෝත
හාත්පස, අවට, වටේ
හිංගුලතටාක, සාදිලිංගම් විල
හ්‍රද, වැව, මහවිල